# ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යය



දම්පේ විජිතරතන හිමි

ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යය
දම්පේ විජිතරතන හිමි



මොරටුව මොරටුමුල්ලේ තපසරාරාම මහා විහාරවාසී පූජ්‍ය ආචාර්ය දම්පේ විජිතරතන හිමි කැස්බෑව නන්දන මූලික පිරිවෙණෙහි සහ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණෙහි ආදි ශිෂ්‍යයෙකි. ප්‍රාචීන පණ්ඩිත උපාධිය ද ලබා ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් සංස්කෘත භාෂාව පිළිබඳ ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය ත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ත් ලබා ඇත. ඉන් අනතුරුව තායිවානයට වැඩම කොට එහිදී චීන භාෂාව ද හදාරා ශාස්ත්‍රපති උපාධිය සහ ආචාර්ය උපාධිය ද සම්පූර්ණ කළ උන්වහන්සේ දැනට මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ බෞද්ධ දර්ශන අධ්‍යයන පීඨයේ පීඨාධිපති ලෙස අධ්‍යාපන කටයුතුවලට සම්බන්ධ වී සිටිති.

උන්වහන්සේ විසින් රචිත ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහා කාව්‍යය සිංහල සාහිත්‍යයට එකතු වූ නවතම මහා කාව්‍යයයි. බුද්ධ චරිතය පිළිබඳ සිංහල භාෂාවෙන් විවිධ වූ ගද්‍ය හා පද්‍ය නිර්මාණ බිහි වී ඇති නමුත් මෑත භාගයේ මහා කාව්‍යයක් නිර්මාණය වී නැත. බුද්ධ චරිතය පාදක කර ගනිමින් අශ්වඝෝෂ මාහිමියන් විසින් රචනා කරන ලද "බුද්ධ චරිත මහා කාව්‍යය" සංස්කෘත භාෂාවෙන් කරන ලද මහා කාව්‍යයකි.

ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහා කාව්‍යය සර්ග පසළොසකින් රචනා වී තිබෙන අතර සිද්ධාර්ථ ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ චරිතය දහසකට අධික පද්‍යයෙන් වර්ණනා කිරීමට උන්වහන්සේ ප්‍රශස්ත උත්සාහයක් දරා ඇත. මෙය කිඹුල්වත් පුර සහ දෙව්දහ පුර පිළිබඳ වර්ණනාවකින් ආරම්භ වන අතර මහා කාව්‍යයක තිබිය යුතු කුමාරෝදය, උයන් කෙළි, විවාහ උත්සව, කථා නායකයාගේ ජයග්‍රහණ ආදී වර්ණනාවන්ගෙන් පරිපූර්ණය. බුදුරජාණන් වහන්සේ තුළ වූ දේශනා කෞශල්‍යය, උපාය කෞශල්‍යය, ක්ෂාන්තිය, මහා කරුණාව, පුරිසදම්ම සාරථී ගුණය ආදිය මෙහි දී විශේෂයෙන් වර්ණනා කර ඇත. බුද්ධ චරිතය පාදක කොට ගනිමින් මහා කාව්‍යයක් රචනා කිරීම ඉතා අපහසු සහ වෙහෙස කර කාර්යයක් වන අතර ඒ සඳහා උන්වහන්සේ දරා ඇති උත්සාහය ඉතා සාර්ථක වී ඇති බව ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහා කාව්‍යය කියවීමෙන් දැනගත හැකිය.

පූජ්‍ය ආචාර්ය පල්ලේවෙල සාරද නාහිමි
පීඨාධිපති සහ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය
මානෙල්වත්ත
බොල්ලෑගල
කැළණිය

රු. 350.00

ISBN 9789554995116
9 789554 995116

DampeTheroKaviBook_Cover_20180804.indd 1
2018/8/4 8:46 AM

# ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යය
# Srī Shākyamunīndrāvadāna Mahākāvya

DampeTheroKaviBook_Content_20180804.indd 1 2018/8/4 8:46 AM

DampeTheroKaviBook_Content_20180804.indd 2 2018/8/4 8:46 AM

# ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යය
# Srī Shākyamunīndrāvadāna Mahākāvya

දම්පේ විජිතරතන හිමි
**Rev. Dampe Vijitharathana Thero**

ප්‍රකාශනය:

නාගානන්ද ප්‍රකාශන
Nāgānanda International Institute for Buddhist Studies

DampeTheroKaviBook_Content_20180804.indd 3 2018/8/4 8:46 AM

**නාගානන්ද ප්‍රකාශන අංක 11**

මෙම ව්‍යාපෘතිය
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන
ආයතනයේ
විධායක අධ්‍යක්ෂ
පූජ්‍ය ආචාර්ය බෝදගම චන්දිම නාහිමිපාණන්
වහන්සේගේ
හා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
පූජ්‍ය ආචාර්ය පල්ලේවෙල සාරද නාහිමිපාණන්
වහන්සේගේත්
ආයතනයේ පීඨ මණ්ඩලයේත්
අනුශාසකත්වයෙන් ක්‍රියාත්මකවන්නකි.

**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යය**
Srī Shākyamunīndrāvadāna Mahākāvya

---

දම්පේ විජිතරතන හිමි
Rev. Dampe Vijitharathana Thero

---

© 2018 දම්පේ විජිතරතන හිමි Rev. Dampe Vijitharathana Thero

---

Printed in Taiwan

---

First Printing: Aug 2018

---

ISBN: 978-955-4995-11-6

---

Nāgānanda International Institute for Buddhist Studies
Bollegala, Kelaniya, Sri Lanka
Tel : +94(0) 11 291 2450
Fax : +94(0) 11290 5596
email : manelwatta2011@gmail.com
Web : www.niibs.lk

DampeTheroKaviBook_Content_20180804.indd 4 2018/8/4 8:46 AM

# පිදුම

පුරහඳ වගේ අඹරෙහි දිලි රැස් නොනිමි
පා මෙත් දයා සිත සිසුකැල වෙත නොනිමි
අතවැසි සැමට ඔවදන් නිති දෙන මහිමි
ගුරු දෙව් සමිඳු හට මේ මහකව පුදමි

DampeTheroKaviBook_Content_20180804.indd 5 2018/8/4 8:46 AM

DampeTheroKaviBook_Content_20180804.indd 6 2018/8/4 8:46 AM

# අනුමෝදනා

මා විසින් නිර්මාණය කරන ලද ප්‍රථම කාව්‍ය ග්‍රන්ථය මෙයයි. එය ද ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදානය හෙවත් ගෞතම බුද්ධ චරිතය වීම ප්‍රීතිය සිය දහස් ගුණයෙන් වැඩි කරන්නට හේතු වේ. මෙම නිර්මාණ කාර්‍ය්‍යය තුළින් මම අසීමිත වූ සතුටක් ලබමි. එම සතුට ලැබීම සඳහා බොහෝ කොට වෙහෙස වූ වෙමි. ඒ අතරෙහි දී ඍජුව හෝ වක්‍රව උපකාර කළ බොහෝ දෙනෙක් සිටිති. බුද්ධ චරිතය කීම හෝ ලිවීම බෙහෙවින් පින් ලැබීමට හේතු වෙයි. එනිසා මම මෙහි දී බොහෝ පින් සිදු කර ගත්තේ යැ'යි සිතමි. එබැවින් උපකාර කළ සියල්ලන්ට තුති පිදීමට වඩා පින් අනුමෝදන් කිරීම හොඳ යැ'යි සිතමි.

මා මෙලොවට බිහි කර එකොළොස් වසරක් හදා වඩා පෝෂණය කර පැවිදි වෙන්නට උතුම් අවසරය දුන් දෙමව්පියන්ට මෙම පින හිමි විය යුතු ය. ප්‍රව්‍රජ්‍යාවට පත් කර, තිස් වසක් පමණ කල් දරුවෙකු සේ මා රකිමින්, පැවිදි දිවියේ අරුත් කියා දී මග නොමග කියා දුන් ගුරුදේවෝත්තම නායක හාමුදුරුවන් වහන්සේට මෙහි පින හිමි විය යුතු ය. පිරිවෙන් අධ්‍යාපනයට අත්පොත් තැබූ, මොරටුමුල්ල ශ්‍රී බෝධිරුක්ඛාරාම පිරිවෙන් විහාරාධිපති ව වැඩ සිට අපවත් වී වදාළ ගෞරවාර්හ කැඹිලියපොළ චූළාලංකාරාභිධාන අධිකරණ සංඝ නායක මාහිමිපාණන් වහන්සේට සහ ලෝ සසුන් වැඩ කැමති අපමණ සිසු කැලක් බිහි කරනු වස් කැස්බෑව ශ්‍රී විජයසුන්දරාරාම විහාරාභ්‍යන්තරයේ නන්දන මූලික පිරිවෙන ආරම්භ කර උත්තම අභිමතාර්ථය සියැසින් දැක තුටු වීමට තරම් පින් පිරූ කැස්බෑව නන්දන පිරිවෙනෙහි නිර්මාතෘවර කඹුරුපිටියේ නන්දරතනාභිධාන නායක මාහිමිපාණන් වහන්සේට මෙම පින අනුමෝදන් කරමි. දිවියේ ආරම්භයේ සිට මේ දක්වා සිප් සතර ඉගැන්වූ, දම්පේ කණිෂ්ඨ විද්‍යාලයේ සිටි දයාබර ගුරු මව්පියවරුන්ට ද කැස්බෑව නන්දන පිරිවෙනෙහි සහ කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනෙහි දයාබර ගුරු දේවතාවන්ට මේ පින ලැබිය යුතුම ය. තායිවානයේ දී වසර අටකටත් අධික කාලයක් තම ශිෂ්‍යයකු ලෙසින් සිතා මා හට රැකවරණය දුන් සහ අදට ද එම රැකවරණය නොඅඩුව ලබා

දෙන මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යායන ආයතනයේ නිර්මාතෘවර තායිවානයේ ප්‍රධාන සංඝ නායක ආචාර්‍ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේට ද මෙහි පින අයත් විය යුතු ය.

2016 වසරේ සිංගප්පූරුවේදී මෙම කාව්‍යය මා අතින් නිර්මාණය වූයේ හුදු කාලය ගෙවා දැමීමේ අරමුණෙනි. එහෙත් එය මෙවන් මහා කාව්‍යයක් බවට පත් වූයේ සිංගප්පූරුවේ සමාධි විහාරයේ නිර්මාතෘවර ආචාර්‍ය රඹුක්වෙල ඥාණසීහ මාහිමිපාණන් වහන්සේගෙන් නිරතුරු ලද උද්යෝගිමත් කිරීමෙනි. එසේ නොවන්නට මෙවැනි මහ කවක් නිර්මාණය කරන්නට අදහසක් මා තුළ නොවූ බව මම හොඳින් දනිමි. එනිසා මෙහි පින උන්වහන්සේට ද හිමි විය යුතු ය.

මෙහි පරිගණක අක්ෂර සංයෝජනය කිරීම සඳහා උපකාර කළ කීප දෙනෙක් සිටිති. මොරටුමුල්ල තපසරාරාම විහාරවාසී අප පැවිදි සහෝදර පස්ගොඩ සුබෝධිරතන හාමුදුරුවෝ මෙහිලා විශාල කාර්‍යයක් ඉටු කළහ. එසේ ම නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ සහකාර පුස්තකාලයාධිපති පාතකඩ රේවත හාමුදුරුවෝ ද ඒ සඳහා උපකාර කළහ. මොරටුමුල්ල ශ්‍රී ධර්මප්‍රබෝධිනී රිවිදින දහම් පාසලේ ආචාරිණී චන්දිමා කුමාරි මෙනවිය ද, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ අකිලා පීරිස් සහ උවිනි මෙනවියෝ ද මේ සඳහා උපකාරය ලබා දුන්හ. එම සියලු දෙනාට ම මෙම පින ලැබිය යුතු ය. නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ආචාර්ය පල්ලේවෙල සාරද නාහිමියන්ට ද මෙම පින හිමි විය යුතු ය. ශාස්ත්‍රීය කටයුතුවලදී නිරතුරු දිරිය ලබා දෙන නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ පාඨමාලා සමායෝජක මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ ගුරු පියාණන්ට ද, මෙහි සියලු දොස් නිදොස් කොට නිවැරදි ව මග කියා දුන් මහාචාර්ය රත්න විජේතුංග ගුරු පියාණන්ට ද වෙසෙසින් මේ පින ලබා දෙන්නට රිසි වෙමි.



DampeTheroKaviBook_Content_20180804.indd 8 2018/8/4 8:46 AM

මේ සඳහා ඉතා අලංකාර ලෙස කවරයක් නිර්මාණය කර දුන් ප්‍රිය ශිෂ්‍ය නේපාලේ කුසල හිමියන්ට ද පුණ්‍යානුමෝදනා කරන අතර මෙම නිර්මාණය අගය කරමින් මා දිරිමත් කළ මාගේ සෙහොයුරන්ට, අටවක්වෙල කුසලරතන හිමියන්ට, හේනේගම ධම්මරතන හිමියන්ට, හිඟුල්වල පුණ්ණජී හිමියන්ට, වඩිනාගල පඤ්ඤාලෝක හිමියන්ට ද මෙම පින ලැබිය යුතු ය. පැවිදි වූ දා සිට මේ දක්වා සිවුපසයෙන් සංග්‍රහ කළ සියල්ලන්ට ද දුක සැප දෙකෙහි නිරතුරු ළඟ සිටි මිතුරන්ට ද මෙම පින අනුමෝදන් කිරීමට රිසි වෙමි.

දම්පේ විජිතරතන හිමි
තපසරාරාම මූල මහා විහාරය
මොරටුමුල්ල
මොරටුව

2018 මාර්තු මස 26 වෙනි දින



DampeTheroKaviBook_Content_20180804.indd 9 2018/8/4 8:46 AM

DampeTheroKaviBook_Content_20180804.indd 10 2018/8/4 8:46 AM

# හැඳින්වීම

දම්පේ විජිතරතන හිමියන් විසින් විරචිත ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදන මහාකාව්‍යය සිංහල කාව්‍ය ක්ෂේත්‍රයට එක් වූ නවතම කෘතියයි. මෙය සර්ග පසළොසකින් සමන්විත මහා කාව්‍යයකි. මෙහි අරමුණ වනුයේ ගෞතම බුද්ධ චරිතය උත්පත්තියේ සිට බුද්ධත්වය ලබා ගැනීමත් අනතුරුව සිදු කළ බුද්ධ කෘත්‍යයනුත් බුදුරදුන් තුළ පැවති කෞශල්‍යය හා උත්කෘෂ්ට ගුණාංගත් අවසානයේදී සිදු වූ බුද්ධ පරිනිර්වාණයත් සිංහල පද්‍යයට නගා ඉදිරිපත් කිරීමයි. මේ අනුව පුරවැනුම්, කුමර උපත, ගිහි ජීවිතය, පෙරනිමිති දැකීම, අභිනික්මන, දුෂ්කරක්‍රියා, බුදුබව, දහම් දෙසීම, කිඹුල්වත් ගමන, උපාය කෞශල්‍යය, දේශනා කෞශල්‍යය, පුරිසදම්මසාරථී, මහාකරුණා, ක්ෂාන්ති හා පිරිනිවීම යටතේ එක් එක් සර්ගය වෙන් කර ඇත.

මේ කාව්‍යයේදී යොදා ඇත්තේ සිව්පද පද්‍ය ආකෘතියයි. සමුදුරු ගොස් විරිත බහුලව උපයෝගී කොට ගෙන ඇත. මෙහිදී කෙටි සිව්පද විරිත් ද දක්නට ලැබේ. එක් එක් සර්ගය අවසානයේ දිග සිව්පද විරිතක් යොදාගෙන ඇත. විරිත් භාවිතය සමස්තයක් වශයෙන් සැලකීමේදී පෙනෙන්නේ කවියා ජනකවි විරිත් කෙරෙහි රුචියක් දැක්වූ බවයි. භාෂාව්‍යවහාරය පොදුවේ නූතන බස් වහරට ළං වෙයි. ඇතැම් තැනක සම්භාව්‍ය කාව්‍යමය භාෂාව ද තත්සම වචන ද භාවිත කෙරේ. ජනවහරේ යෙදුම් ද දක්නට ලැබේ.

මේ මහාකාව්‍යයෙහි පළමු වන සර්ගයේ වර්ණනා ආරම්භ වන්නේ තෙරුවන් උදෙසා කෙරෙන නමස්කාරයකිනි. අනතුරුව ඇත්තේ ශාක්‍ය පුරය පිලිබඳ වැනුමකි. සුද්ධෝදන රජතුමා ගැන කෙරෙන වැනුමෙන් අනතුරුව මහමායා දේවිය උපන් දෙව්දහ පුරය ගැන වර්ණනා කෙරේ. මෙහිදී කතුවරයා උත්සාහ ගන්නේ සිදුහත් කුමරුගේ දෙමව්පියන් හා ඔවුන් උපන් පුර පිලිබඳ හඳුන්වාදීමටයි. අනතුරුව සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය දැක් වේ. ක්‍රමයෙන් ඔහුගේ ගිහි ජීවිතය පිලිබඳ විස්තර ඉදිරිපත් කරන කතුවරයා ඊට අදළ විවිධ සිදුවීම් වර්ණනාවට ලක් කරයි. මේ විස්තර අතර සිදුහත් කුමරුගේ

අධ්‍යාපනය, විවාහය, ගැන දැක් වේ. සතර පෙර නිමිති දැකීමෙන් සසර ගැන ඇති වන කළකිරීම අනතුරුව ඉදිරිපත් කෙරේ. ඉන් පසු අභිනික්මනෙහි යෙදෙන අදහස කුමරු තුළ ඇති වේ. මෙදින රාත්‍රියෙහි මාළිගාවේ පැවති උත්සව ශ්‍රීයත් නාටිකාංගනාවන්ගේ විපරීත දර්ශනත් දැකීමෙන් ගිහි ගෙයින් නික්මෙන අදහසෙහි කුමරු දැඩිව එල්බ ගනී. මෙහිදී රාත්‍රියේම මාලිගාව හැර දමා යන කුමරු ගිහි ඇඳුම් ඉවත් කොට පැවිදි වෙස් ගනී. සිදුහත් කුමරුගේ දුෂ්කර ක්‍රියා ගැන විස්තර කරන කතුවරයා ආලාරකාලාම හා උද්දකරාමපුත්‍ර තවුසන් ඇසුරේදී ලබාගන්නා පුහුණුව හෙළි කරමින් පස්වග තවුසන් සමඟ දුෂ්කර ක්‍රියා කරමින් ගත කළ කාලය විස්තර කරයි. මේ තවුසන් සමඟ දුෂ්කර ක්‍රියාවේ යෙදෙමින් ගත කළ අත්තකිලමථානුයෝගය අත්හරින බෝසතුන් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරමින් ලොවුතුරා බුද්ධත්වය ලබා ගන්නා අයුරු කතුවරයා ඉදිරිපත් කරයි. සුජාතාවගේ කිරිපිඩු දානය ලබා මරුන් පරදවා සම්‍යක් සම්බුද්ධත්වය අවබෝධ කර ගන්නා ආකාරය කතුවරයා අනතුරුව ඉදිරිපත් කරයි. ඉන් පසු සිද්ධාර්ථ ගෞතමයන්ගේ ප්‍රථම ධර්ම දේශනය, භික්ෂු සමාජය ඇති කිරීම හා කපිලවස්තු පුර බලා වැඩමවීම වර්ණනාවට භාජනය කරයි. කපිලවස්තු පුරයේදී සුද්ධෝදන රජු ඇතුළු ශාක්‍යයන්ගේ හමුවීම, යශෝධරාවන් මුණ ගැසීම හා ශාක්‍ය කුමාර වරුන් පැවිදි කිරීම ආදී තොරතුරු ඉදිරිපත් කෙරේ.

බුද්ධ චරිතයෙහි මූලික කරුණු සඳහා සර්ග නවයක් වෙන් කරන කතුවරයා දහවන සර්ගයේ සිට සූදනම් වන්නේ බුදු රදුන්ගේ උපාය කෞශල්‍යය විස්තර කිරීමටයි. උපාය කෞශල්‍යය යටතේ නන්ද තෙරුන්, සිරිමා නගර සෝභිනිය, කිසාගෝතමී, ඛේමා වැනි පුද්ගලයන් උපායශීලීව විමුක්ති මාර්ගය වෙත යොමු කළ ආකාරය ගැන වර්ණනා කෙරේ. දේශනා කෞශල්‍යය යටතේ ධනිය ගෝපාල, පුක්කුසාති, රාහුල, අභයරාජ කුමරු ඇතුළු පිරිස් සමඟ කළ ධර්ම සාකච්ඡා හා එමඟින් ඔවුන් ධර්මාවබෝධය ලැබූ ආකාරය විස්තර කෙරේ.

දෙළොස් වන සර්ගයේදී විස්තර කෙරෙන්නේ බුදු රදුන්ගේ පුරිසදම්මසාරථී ගුණය යි. මේ යටතේ නාලාගිරි, අංගුලිමාල, ආලවක,

සුචිරෝම හා කරරෝම, සච්චක ආදී පිරිස් දමනය කළ ආකාරය විස්තර කෙරේ. මෙසේ බුදු රදුන් කළ මෙහෙවර ගැන සලකා සර්ග තුනක් වෙන් කිරීම මේ කාව්‍යයේ දක්නට ලැබෙන විශේෂත්වයකි.

මේ මහා කාව්‍යයේ තවත් විශේෂත්වයක් වනුයේ බුදුරදුන්ගේ මහාකරුණා හා ක්ෂාන්ති පාරමිතා ගැන විස්තර දැක්වීමයි. මහාකරුණා යටතේ සෝපාක, සුනීත, රජ්ජුමාලා, පටාචාරා, අසරණ බමුණා, දුප්පත් ගොවියා, භද්‍රවතිකා ඇතින්න, ක්ෂුධාවට පත් මගියා, පූතිගත්තතිස්ස තෙරුන් යන මාතෘකා යටතේ වර්ණනා ඉදිරිපත් කරයි. ක්ෂාන්ති පාරමිතාව යටතේ සුන්දරියගේ දුෂ්ටකම්, චිඤ්චා මානවිකා, කොසොල් රජුගේ මහාදනය, යන මාතෘකා යටතේ වර්ණනා ඉදිරිපත් කරමින් බුදුරදුන්ගේ ඉවසීමේ උත්කෘෂ්ට භාවය නිරූපණය කරයි.

අවසාන සර්ගයෙහි ඇතුළත් වන්නේ බුද්ධ පරිනිර්වාණය පිලිබඳ විස්තරයි. බුද්ධ පරිනිර්වාණය, ශ්‍රී දේහය ආදාහනය කිරීම, සර්වඥ ධාතු බෙදීම, දෙව්-බඹ-නර පිරිස්වලින් ලැබූ පූජා ආදිය ගැන සිත් ඇද ගන්න විස්තරයක් මෙහිදී ඉදිරිපත් කෙරේ.

මේ අනුව දම්පේ විජිතරතන හිමියන්ගේ ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදන මහාකාව්‍යය වර්තමානයේ පහළ වූ මේ ගණයට අයත් කෘතියක් වශයෙන් අගය කළ හැකිය. කාව්‍යයේ සෑම සර්ගයකම අවසානයේ මුල් කවිවලට වඩා වෙනස් විරිතකින් රචිත පද්‍යයක් දක්නට ලැබේ. මේ අතර ඒ ඒ සර්ගවල විවිධ විරිත්වලින් රචිත පද්‍ය ඇතුළත් වෙයි. පුර, රජ, විවාහ, දරුවන් ලැබීම ආදී විස්තර ද ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ විවිධ විරිත් භාවිතය පිළිබඳව කතුවරයා දැක්වූ සාමාර්ථ්‍යයයි.

වීදි බසින තරුණ දනා
තැන තැන කෙළිමින් උන්නා
දැක උන්ගේ රුසිරු මනා
දෙවියන් සැඟවී උන්නා

පිළිගන්නට මහ බෝසත්
තුසිතෙන් පොළොවට බැස ගත්
සුරන් ලෙසට සැරසී ගත්
සතුටින් ඉපිළේ නර සිත්

(21, 26 පද්‍ය)

සමස්තයක් වශයෙන් සැලකීමේදී දම්පේ විජිතරතන හිමියන්ගේ මේ කාව්‍ය අංශ කීපයක් යටතේ අගය කළ හැකිය. මෙයින් එකක් නම් බුද්ධ චරිතය දෙස සාම්ප්‍රදායික දෘෂ්ටි කෝණයෙන් ඈත්ව නව දෘෂ්ටි කෝණයක් යටතේ අවධානය යොමු කිරීමයි. මෙහිදී ථේරවාද හා මහායාන යන සම්ප්‍රදයද්වය ගැනම කරුණු දක්වා ඇත. දෙවන කරුණ වනුයේ බුදුසිරිත ඇසුරින් වර්තමාන යුගයේ මහා කාව්‍යයක් නිර්මාණය කිරීමයි. කවියාගේ ප්‍රතිභාව මෙන්ම පාණ්ඩිත්‍යය ද ගැන පාඨකයා තුළ ප්‍රසන්න හැඟීම් ඇති වෙයි. මෙසේ සැලකීමේදී ප්‍රතිභාවෙන් මෙන්ම පාණ්ඩිත්‍යයෙන්ද පිරුණු කවියෙකුගේ කෘතියක් වශයෙන් ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදන මහාකාව්‍යය හඳුන්වා දිය හැකිය. මෙබඳු අගනා කාව්‍යයක් රචනා කොට පළ කිරීම ගැන කතු හිමියන්ට පාඨකයාගේ ප්‍රශංසාව හිමි විය යුතුය.

**මහාචාර්ය රත්න විජේතුංග**
පීඨාධිපති/ ආදී බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන පීඨය
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය
මානෙල්වත්ත, බොල්ලෑගල, කැළණිය

2018 ජූනි මස 5 වැනි දින.

# පටුන


පිදුම. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . v
අනුමෝදනා . . . . . . . . . . . . . . . . . . . . . . . .vii
හැඳින්වීම . . . . . . . . . . . . . . . . . . . . . . . . xi
පටුන . . . . . . . . . . . . . . . . . . . . . . . . . .xv

පළමුවන සර්ගය

පුර වැණුම . . . . . . . . . . . . . . . . . . . . . 1

නරපති වැණුම . . . . . . . . . . . . . . . . 4

දෙව්දහ පුර වැණුම . . . . . . . . . . . . . 5

දෙවන සර්ගය

කුමර උපත . . . . . . . . . . . . . . . . . . . . . 9

තෙවන සර්ගය

ගිහි ජීවිතය . . . . . . . . . . . . . . . . . . . . 25

සිවුවන සර්ගය

පෙර නිමිති දැකීම . . . . . . . . . . . . . . . . 39

පස්වන සර්ගය

අභිනික්මන . . . . . . . . . . . . . . . . . . . . 49

සවන සර්ගය

දුෂ්කර ක්‍රියා . . . . . . . . . . . . . . . . . . . 59

සත්වන සර්ගය

බුදුබව . . . . . . . . . . . . . . . . . . . . . . 69

අටවන සර්ගය

දහම් දෙසීම. . . . . . . . . . . . . . . . . . . . 79

නවවන සර්ගය

කිඹුල්වත් ගමන . . . . . . . . . . . . . . . . . 93


DampeTheroKaviBook_Content_20180804.indd 15 2018/8/4 8:46 AM

දසවන සර්ගය


උපාය කෞශල්‍යය . . . . . . . . . . . . . . . . . .103
(නන්ද තෙර). . . . . . . . . . . . . . . . . .103
(සිරිමා නගර ශෝභිනිය). . . . . . . . . . . . . 107
(කිසාගෝතමී) . . . . . . . . . . . . . . . . .110
(ඛේමා) . . . . . . . . . . . . . . . . . . .113


එකොළොස්වන සර්ගය


දේශනා කෞශල්‍යය . . . . . . . . . . . . . . . . .117
(ධනිය ගෝපාල) . . . . . . . . . . . . . . . .117
(බමුණෙකුගේ පැනයක්) . . . . . . . . . . . . . 120
(අග්ගික භාරද්වාජ) . . . . . . . . . . . . . . 122
(පුක්කුසාති හමුව). . . . . . . . . . . . . . . 124
(රාහුලෝවාදය). . . . . . . . . . . . . . . . 126
(අභය හමුව) . . . . . . . . . . . . . . . . .128
(මාලුඞ්ක්‍ය පුත්තගේ පැනය) . . . . . . . . . . .130


දොළොස්වන සර්ගය


පුරිසදම්මසාරථී . . . . . . . . . . . . . . . . .133
(අංගුලිමාල දමනය). . . . . . . . . . . . . . .135
(ආලවක දමනය) . . . . . . . . . . . . . . . 140
(සුචිරෝම හා කරරෝම දමනය). . . . . . . . . . 143
(සච්චක දමනය) . . . . . . . . . . . . . . . 144


දහතුන්වන සර්ගය


මහා කරුණා . . . . . . . . . . . . . . . . . 147
(සෝපාක). . . . . . . . . . . . . . . . . . 147
(සුනීත) . . . . . . . . . . . . . . . . . .148
(රජ්ජු මාලා) . . . . . . . . . . . . . . . . 150
(පටාචාරා). . . . . . . . . . . . . . . . . .151
(අසරණ බමුණා) . . . . . . . . . . . . . . .155
(දුප්පත් ගොවියා). . . . . . . . . . . . . . .157
(භද්‍රවතිකා ඇතින්න) . . . . . . . . . . . . .159
(කුසගින්නේ සිටි මගියා). . . . . . . . . . . . .161




DampeTheroKaviBook_Content_20180804.indd 16 2018/8/4 8:46 AM

(පූතිගත්ත තිස්ස තෙරුන්) . . . . . . . . . . . 162

දහහතරවන සර්ගය

ක්ෂාන්ති . . . . . . . . . . . . . . . . . . . . . . .167

(සුන්දරියගේ දුෂ්ඨකම්). . . . . . . . . . . . . . .167

(චිඤ්චා මානවිකා) . . . . . . . . . . . . . . . 172

(කොසොල් රජුගේ මහා දානය). . . . . . . . . .175

පහළොස්වන සර්ගය

පිරිනිවීම . . . . . . . . . . . . . . . . . . . . . . .179



DampeTheroKaviBook_Content_20180804.indd 17 2018/8/4 8:46 AM

DampeTheroKaviBook_Content_20180804.indd 18 2018/8/4 8:46 AM

# ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යය

## පළමුවන සර්ගය

## පුර වැණුම

1. බව දුක නැසූ බුදු හිමියන් හට වඳිමි
නිවනට එකම මග වූ දහමට වඳිමි
කෙලෙසුන් නැසූ සඟ ගණ සිරසින් වඳිමි
බුදුහිමි සිරිත කවියෙන් කියනට සිතමි

2. හිම කැටිවලට නිවෙසක් මෙන් වූ බැවින
සුදුවන් ගිරි ශිඛර දෙනුවන් මත් කරන
පෙර'පර දෙදිග එකලෙස යා කර තබන
ගිරි රද හිමවතයි බෝ ඉසිවර වසන

3. හිම කැටි දියව එන දිය පළමුව රඳන
හිමවත සිසිල දිව රෑ නිරතුරු විඳින
දැවටී දෙපා මුල පිය සෙනෙහස විඳින
දරුවකු මෙන්ය සාකිය ජනපද සොබන

4. හිරුරැස් වැදී අලුයම මොනවට දිලෙන
රන් සළුවක් වැටුණු ලෙස ඈතට පෙනෙන
හිමගිරි ශිඛර මේ ජනපදයට පෙනෙන
මකුටය තමයි නුවරට පළඳා තිබෙන

5. නොකැළැල් දිය ඇවිත් සිට හිමවත දෙසින
කැත් කුළ දහම් නිරතුරු අභිසෙස් කරන
හිමවත වෙසෙන ඉසිගණ සිල් ගුණ රඳන
ආසිරි පතති මෙම ජනපදයට සොබන

DampeTheroKaviBook_Content_20180804.indd 1 2018/8/4 8:46 AM

6. උතුරු දෙසින් උස් වී වටකොට නැගුණ
කඳුපෙළ පවුරක්ය සතුරන් මග වරණ
වනයෙන් වටව ඇති සුන්දර රජ දහන
සුරකිව තිබේ හැම කල් හැම උවදුරින

7. සල්පිල් දොරින් දොර නිති මිනිසුන් ගහණ
නෙකවන් රුවන් මිණි මුතු අබරණ පිරුණ
දෙව්ලොව විමන් මිහිබට සේ යැයි පෙනෙන
මන්දිර සඳලු තල නෙක තොරණින් දිලෙන

8. කසී සිනිඳු සළු නිරතුරු ගත දරන
සුවඳ සඳුන් ඈ විලවුන් සුවඳ දෙන
පිච්ච සමන් මල් ගැවසූ වරලසින
තරුණ ළඳුන් හැම දෙන මන් මත් කරන

9. සඳලු තලා මත සිට එබිකම් කරන
සොඳුරු ළඳුන්ගේ සඳ සහ සම වුවන
දකින දනෝ බලතිය වී මුළාවෙන
දොර දොර සඳක් පායා ඇති නිසාවෙන

10. කැත් කුළ දහම ලෙස සටනට පුහුණුවන
උස් වූ ගතට සම මහතින් යුතු බැවින
ජවය බලය හා නිති විකුමෙන් දිනන
තරුණ දනන් පුරවර නිති සැරිසරන

11. රහමෙර තොල ගානු රිසි වූ දන තරුණ
මිහිරැති නෙක බොජුන් පුරවාලා තිබෙන
අවන්හලට වැද පිනවති සිතුසෙ මන
සුරාමතින් ගයතිය සමහරු තුටින



DampeTheroKaviBook_Content_20180804.indd 2 2018/8/4 8:46 AM

12. මත් වූ එකෙක් ගෙන පෙම්වතියගෙ වුවන
සිප ගන්නට හදයි යුත් ගතිනේ බමන
විසිවෙන කරකැවෙන ගත නොකළැකි දමන
සිපගති මුතුහරය ඇගෙ ගෙලවට බැඳුණ

13. මත් වූ බැවින් කරනා දේ නොම හැඳින
එකෙක් මුරලියක් දැතින් ගෙන වයන
උස් සර පහත් කොට සර බිඳිමින් වයන
මුවගට සිනා නංවයි දනගේ දකින

14. දිව රෑ දෙකෙහි නිති රැකවරණෙහි යෙදෙන
ගජ හය සෙනඟ පාබල සේනා සිටින
සුරුවිරු කම් පාති නිති සටනට දිනන
එබැවින් නුවරු නොදනිති බිය යන වදන

15. හය කුර ගැටීමෙන් දූවිලි උඩ නගින
අවුරති හිරු කිරණ පොළොවට පතිතවන
ඇතුනගෙ කුඤ්ච නාදය නිරතුරු ඇසෙන
කියනු වැනිය මෙනුවර සිරි ජය නදන

16. ඕලු නෙළුම් මානෙල් පිපි විල් වලින
නිවයි ගිම් කල දි දාහය ගත දවන
වනගොමු තුළින් සුපිපුණු කුසුමන් ගහන
නිබඳව හමා එයි සුවඳැති මද පවන

17. හෙල් වැටි තැනිතලා වනගොමු අතර මැදින්
ගලනා අනෝමා නදියේ මියුරු නදින්
කුල්මත් වෙලා පියඹා යන විහඟ නදින්
විසිතුරු රටා වේ සැන්දෑ අහස මැදින්



DampeTheroKaviBook_Content_20180804.indd 3 2018/8/4 8:46 AM

18. අග්නි මරුත් ආදී දෙවියන් පුදන
බ්‍රහ්ම විෂ්ණු මෙහෙසුරු හට පුද කරන
සිරිත් ලෙසට දෙවියන් වඳිමින් යදින
දෙවොල් බොහෝ වෙයි පුරවර තැනින් තැන

19. අගිල් කපුරු නොනිවී දැල් වී තිබෙන
ගිතෙල් සුවඳ පතුරයි දැල්වෙන පහන
උදේ හවා බමුණෝ දෙවියන් පුදන
ගයති වේද ගී පෙර සිට ආ ලෙසින

20. සිසු කැල ගුරුන්ගේ සිරිතට ගරු කරන
පිළිවෙත් රකිති ගුරු බස නිසි ලෙස රකින
වේදයෙ අරුත් නිසි ලෙස වටහා නොගෙන
එනමුදු ගයති සුවපෝතකයන් ලෙසින

21. කපිල වස්තු පුරවැසි සාකිය දනන
තුසිත ලොවින් වැඩි දෙවියන් ලෙස රුවින
රජකම සේම ගොවි කම හුරු එක ලෙසින
දිනකර දරු මෙන්ය පුරවර බබළවන

## නරපති වැණුම

22. පුරයෙහි කිඹුල්වත් සැප සම්පත් පිරුණු
දනෝ විඳිති කම් සුව තම සිත් ලෙසින
සක්දෙව් දෙදෙව් ලොව පාලන කරන මෙන
නරපති මෙහෙය වන්නේ රට හොඳ ලෙසින



DampeTheroKaviBook_Content_20180804.indd 4 2018/8/4 8:46 AM

23. ඔක්කාක පෙළපතට සිළුමිණක් සේ අගන
කැත් කුලට කිරුළක්ය සියලු තේජස් දරන
සිවු කුලෙහි සියලු දෙන පියකු ලෙස ගරු කරන
නමින් සුද්ධෝදනයි මෙපුර රජකම් කරන

24. උස් වූ පපුව ජව ඇති සිංහයෙකු වගෙයි
ජව ඇති බාහු කගපත් දරනටම අගෙයි
තියුණු දෙනෙත් කරුණා ගුණයෙන් ද යුතුයි
විකුම් පාන කය ඇතෙකුගෙ බලය දරයි

25. ඔද තෙද යුතුව පායන දිනිසුරාණෝ
රට එළි කරන පසළොස්වක සඳාණෝ
බිය නොහඳුනන වනයෙහි සිහ රදාණෝ
පිය සෙනෙහසින් සලකන මහ රජාණෝ

26. දස රජ දහම ඔහු සතු වටිනා දෙයකි
අබරණ ඔටුනු බබළන අගනා මිණකි
බලයට සරි නුවණ රජකුට සිළුමිණකි
රට දියුණුවට තිබු වටිනා එක දෙයකි

## දෙව්දහ පුර වැණුම

27. කිඹුල්වතට සම ලෙස යස ඉසුරු ඇති
දෙව්දහ නමින් තව එක පුරවරක් ඇති
දනෝ මෙපුර දෙවියන් මෙන් කැළුම් ඇති
තම තම රිසිලෙසට බොහො කම් සැප විඳිති



DampeTheroKaviBook_Content_20180804.indd 5 2018/8/4 8:46 AM

| | |
|---|---|
| 28. කෙත්වතු උයන් වතු නෙක තුරුලිය | රඳන |
| වන ගොමු නිරන්තර මල් ජලයෙන් | පිරුණ |
| තුරු ලිය පිස හමා එන්නේ මද | පවන |
| සිහියට ගෙනෙයි දෙව්ලොව නන්දන | උයන |
| | |
| 29. පුරවර ලියන්ගේ පිරිවර සහ | සරන |
| රන්කම් ලෙසින් බබලන සුසිනිඳු | වුවන |
| මිණුමට ඔබින සේ කළ රන් රුව | ලෙසින |
| දෙවඟන සේ පෙනේ ඇසිපිය දෙක | සලන |
| | |
| 30. කඩු දුනු ශිල්ප හා ඇත් අස් ශිල්ප | දැන |
| යුධ බිම නිරතුරුව සුරු විරුකම් | පාන |
| ගත සිත දෙකින් හැඩි දැඩි වූ තරුණ | දන |
| පවුරක් ලෙස සිටිති දෙව්දහ පුර | රකින |
| | |
| 31. රකිනා පෙර සිටන් ආ කැත් කුල | දහම |
| සිය දරු රකින පිය යුතු ලෙස දරු | පේම |
| අබිමන් ගෙනෙන දරනා කිරුළට | සේම |
| දෙව්දහ රටට මහ රජ විය | මහනාම |
| | |
| 32. පින් ඇති දූ පුතුන් ලබනට පින් | පිරුවා |
| පින් ඇති දියණිවරු දෙදෙනෙකු රජු | ලැබුවා |
| රුව ගුණ දෙකින් ලොව හැම අඟනන් | දිනුවා |
| මේ දූවරුන් පිය රජු සිත් තුටු | කෙරුවා |
| | |
| 33. බුදු පුත් බිහි කරන්නට පෙරුමන් | පිරුවේ |
| මහමායා ය රජුගේ දෙටු දුව | වූවේ |
| බුදු පුත් හදා වැඩුමට පෙරුමන් | පිරුවේ |
| ප්‍රජාපතී රජුගේ පොඩි දුව | වූවේ |

34. කපිල වස්තු සහ දෙව්දහ පුර අතර
නෑ හිත මිතුරුකම් ඇති වෙනවා නිතර
තිබු කුල සිරිත් ලෙස වැඩිහිටියන් අතර
සරණය වුනා මායා සුදොවුන් අතර

35. දඹදිව් තලේ මුළු ජනපද සොළොසෙහි ම
බල නැණ විකුම් පානට සුදොවුන්ට සම
නැතියෙන් වෙනත් තරුණන් යුතු ගුණ දහම
ප්‍රජාපති ද පතිනිය විය ඔහුගේ ම

36. කපිලවස්තු පුරයට ආ දා සිට ම
මායා අග බිසව සුරකින පති දහම
නිබඳව සුරකිමින් සිල් සහ ගුණ දහම
රට වැසි දනා දරුවන් මෙන් දකියි තම

37. කිඹුල්වතට පායපු ලෙස හිරු කමල
මායා සමඟ සුදොවුන් නරපති යුවල
දැහැමින් රකිති නගරය සෘෂිහුගෙ කපිල
කිත් යස වැඩෙයි දඹදිව දින දින පතළ

38. සරා සඳවත නැඟී එන සඳ සිනා සී ගෙන පෙරපසේ
වළා ගැබ බිඳ පිපී විසිරෙන පුන් සඳේ කැලුමන් ලෙසේ
ඇගේ පින්බර වුවන දුටු දන ඉපිළ යන්නේ සහ තොසේ
කිඹුල්වත් පුර සියලු දන මන සතුටු කෙරුවා ඇය මෙසෙ

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**පුරවැනුම් නම් වූ පළමුවන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 7 2018/8/4 8:46 AM

DampeTheroKaviBook_Content_20180804.indd 8 2018/8/4 8:46 AM

## දෙවන සර්ගය

# කුමර උපත

1. මායා පැමිණ දින සති මාස ද ගෙවුණා
කිඹුල්වතට තව බොහො සම්පත් ලැබුණා
පින්බල ඇගේ තව තව වැඩෙමින් තිබුණා
රට වැසියනගෙ සෙනෙහස දින දින වැඩුණා

2. කිරුළ දරන්නට කුමරෙකු නැති සොවිනේ
තරමක පසුතැවිල්ලෙනි මහ රජ ඉන්නේ
නැකැත් සතර දත් බමුණන් කැඳවන්නේ
පියෙකු නොවන්නට ඇති තතු විමසන්නේ

3. නැකත් ගණන් කර උන් හැම පවසන්නේ
සැකක් නැතිව මහ දේවිය ගැබ් ගන්නේ
දුකක් සිතේ මහරජ නොම කර ගන්නේ
වෙසක් ගෙවී දෙපොහොයකින් එය වෙන්නේ

4. මෙයතර පුදුම කොලහලයක් ඇතිවෙන්නේ
දෙවියෙක් ලොවට බැස මේ ලෙස පවසන්නේ
බොහො කල් නොගොස් බුදුවරයෙක් ඉපදෙන්නේ
බුදු හිමි දකිනු රිසි අය පින් කර ගන්නේ

5. බුදුවන මහසතුන් උපදින තුසිත පුරේ
මේ ලෙස බුද්ධ කෝලාහල හඬ පැතිරේ
බුදුබව ලබන්නේ කවුරු ද මිනිස් පුරේ
කියමින් සොයන්නට විය මුළු තුසිත පුරේ

6. තම මව කර තබා සතියක් පිහිනාලා
පුත නුඹ බුදුවෙයන් මතු දින පවසාලා
මවගෙන් පළමු බුදුවෙන විවරණ ලබලා
බෝසත් වෙන්න කප් සුවහස් පින් පුරලා

7. රම්‍යකැන් නුවර මඩ වගුරක දිගාවෙලා
බුදු හිමියන්ට ඒ දණ්ඩක් සේ සදලා
දීපංකර බුදුන් පාමුල වැඳ වැටිලා
සුමේධ ලෙසින් බුදුවන විවරණ ලබලා

8. සාරා සැකි කප් දහස් පෙරුමන් පුරලා
ඇස් ඉස් මස් ද ලේ අඹුදරු දන් දීලා
දන් සිල් ආදි සමතිස් පෙරුමන් පුරලා
අවසන් අත් බවේ වෙසතුරු ලෙස ඉඳලා

9. මඟුලැතු දනට දී මිහිකත සොලවාලා
දරුවන් පුදා මුළු පොළොවම ගුගුරවලා
පතිනිය දුන්නෙ මිහතල කම්පා කරලා
තෙවරක් මෙසේ දන් දී පෙරුමන් පුරලා

10. දැහැමෙන් නැවත රටදැය පාලන කරලා
සමතිස් පෙරුම් ගුණදම් නොඅඩුව පුරලා
වෙසතුරු බවෙන් සිහි යුතුවම නික්මීලා
තුසිතයෙ වසයි බුදුවන්නට කල් බලලා

11. සිස් නොව පිරු සමතිස් පෙරුමන් බලෙනී
තේජස් ඇතිව බබළන දෙව් අත් බවෙනී
සිහියෙන් බවුන් වඩනා බෝ සත් පෙනුණී
රැස් වී මෙලෙස අයැදීමක් සිදු කෙරුණී



DampeTheroKaviBook_Content_20180804.indd 10 2018/8/4 8:46 AM

12. නිදුකාණනේ දැන් කාලය එළඹ ඇත
නික්මී යන්න මේ පුරවරයෙන් තුසිත
තුන්ලොව සතුන් දුක් ගින්නෙන් වෙළී ඇත
බුදුබව ලබා ගොඩ ගනු මැන සියලු සත

13. බෝසත් ඔවුන්ගේ ඇරයුම පිළිගන්නේ
තුසිත පුරෙන් නික්මෙන්නට සැරසෙන්නේ
පස් මහ විලෝකනයෙන් ලොව බලමින්නේ
කාලය දේශ කුල මව් ඈ විමසන්නේ

14. පරම ආයු බොහො වැඩි වී ඇති කලට
අනියත දහම වටහා දෙනු බැහැ සොඳට
සියයට අඩුව ආයුෂ පිරිහුණු කලට
වැඩි වැඩියෙන් නැමෙන්නේ සිත රාගයට

15. එකසිය විසි වයස් ආයුස ඇති බැවිනි
බුදු වන්නට සුදුසු කාලය බව දැනුණි
දඹදිව සියලු බුදුවරු උපදින බැවිනි
එහි ඇති කිඹුල්වත උපදින්නට සිතුණි

16. කැත් කුල බමුණු කුල ආදී සිවු කුලය
බමුණන් රජවරුන් මෙයතර උස් කුලය
බුදු බව ලද ද උස් විය යුතුමැයි කුලය
කවුරුත් අසති හොඳ නම් ඉපදුණු කුලය

17. කැත් කුල’තර උසස් විය සාකිය කුලය
සඳමෙන් කලා පිරෙනා යස ඇති කුලය
බලයට සදිසි යහගුණ දම් රැකි කුලය
මෙලෙසින් බලා තෝරාගත්තා කුලය



DampeTheroKaviBook_Content_20180804.indd 11 2018/8/4 8:46 AM

18. පණමෙන් සිතා රජු වෙත පතිදම් රකින
ඇගෙ සීලයට සම නැත තව කෙනෙකු වෙන
සුදු පියුමක් වගේ නිකැළැල් වූ බැවින
පින් පිරු මාය මවු ලෙස තෝරා ගැනිණ

19. ඇසළ අහසෙ පුරහඳ පායා නගින
පින්බර උතුම් පසළොස්වක පොහොය දින
තුසිතෙන් නික්ම මනුලොව උපදින ලෙසින
රැස් වූ දේව ගණයා හට දෙයි පිළිණ

20. නිවිලා වෙසක් සඳ දෙමසක් ගෙවුණු තැන
පිරිලා ඇසළ සඳ අහසේ පෙනෙන දින
එකලා කෙළිති පුරවැසියෝ සියලු දෙන
මෙකලා මඟුල් සිරි උසුලයි තැනින් තැන

21. වීදි බසින තරුණ දනා
තැන තැන කෙළිමින් උන්නා
දැක උන්ගේ රුසිරු මනා
දෙවියෝ සැඟ වී උන්නා

22. තරුණ අනගි කොමළ ලඳුන්
පළඳා අබරණ සොබමන්
සරසා අඳුනින් දෙනුවන්
ඇවිදින්නේ ලැසි ගමනින්

23. එකෙක් ගසන බෙර තාලෙට
එකෙකුගෙ වීණා නාදෙට
එක් වූ වස් දඬු රාවෙට
අඟනෝ නටතිය සතුටට



DampeTheroKaviBook_Content_20180804.indd 12 2018/8/4 8:46 AM

24. මොනවට සැරසුණු ලන්දූ
මිහිරට ගයතිය සින්දූ
අසමින් ඔවුනගෙ සින්දූ
දරුවෝ කෙළිතිය පන්දූ

25. සල්පිල් දොර දොර ඉඳුන්
මිහිරි අහර වළඳමින්
අතමිට හිඟ නැති දනන්
දිව පිනවයි මදුවිතින්

26. පිළිගන්නට මහ බෝසත්
තුසිතෙන් පොළොවට බැසගත්
සුරන් ලෙසට සැරසීගත්
සතුටින් ඉපිළේ නරසිත්

27. ඇසළ උළෙල මේ ලෙස අභිමන් ලෙසට
පවතියි නුවරු සතුටින් කෙළිනා කලට
රජ මැදුරෙහිද රැඟුමින් වැයුමින් යසට
ඇළලී ගියා උත්සව සිරියෙන් සොඳට

28. මහමායා බිසව උදයෙම නා සොඳට
අබරණ ඉවත ලා පොරවා සුදු පාට
ගත සිත යොමු කරන් පිරිසිදු සීලයට
දවසම ගත කළා සිත යොමු කර පිනට

29. දන් දී දුගීනට සෙනෙහැති මවක ලෙසින්
පුදකර පැවිදි උතුමන් උවැසියක ලෙසින්
දෙවියන් පුදාලා බැතිමතියක විලසින්
දන් පින් වලට දවසම කැප කර සතොසින්



DampeTheroKaviBook_Content_20180804.indd 13 2018/8/4 8:46 AM

30. මෙලෙසින් ගෙවා මුළු දවසම වෙහෙසකර
එනමුත් සතුටු සිත් යුතු ඈ පිනින් බර
නා පිරිසිදුව නිමවාලා කිස අහර
යහනට ගියා නිවනුව කය විඩාබර

31. නිදනා සඳෙහි ඇය යහනෙහි දකුණැලෙනී
කැළුම් විහිදුවයි පියුමක් බඳු වුවෙනී
සුවඳ දියෙන් නා පීරූ වරලසිනී
දෙවඟන මෙන් පෙනෙයි සුරලොව සිට පැමිණී

32. පෙරුමන් පිරුවෙ බුදු කෙනෙකුට මව වෙන්න
තව මොහොතකුයි එම පෙරුමන් පල දෙන්න
සිහිනය දිගේ එන බුදු පුතු පිළිගන්න
සූදානමින් ඇය විය නින්දට යන්න

33. දෙවඟන ලෙසින් යහනෙහි සැතපෙන කලට
තුසිත පුරෙන් මහසත් නික්මෙන කලට
දුටුවා සිහිනයක් ලොවටම දෙන සතුට
සිහිනෙක ලෙසින් බෝසත් එයි මවු කුසට

34. සතර වරම් දෙව්වරු විත් සතර දෙසින්
උරමත තබාගෙන සයනය සතර පසින්
හිමාලයට ගෙනගොස් දෙව්ලියක ලෙසින්
තැබුවා අනවතත් විල ළඟ සුරැකි ලෙසින්

35. නන් අබරණ සිනිඳු සළු පිළි ඇඳ පැලඳ
සුකොමල දේවතාවියො යුත් දිව සුවඳ
දේවිය වාඩිකර මණ්ඩපයක සුවඳ
පටන් ගනිති නාවනු වස් පැන් සුවඳ



DampeTheroKaviBook_Content_20180804.indd 14 2018/8/4 8:46 AM

36. උලා කොකුම් චන්දන හා සුවඳ සමන්
අනෝතත්ත විල පිරිසිදු සිසිල් දියෙන්
නහවා දේව් දරුවකු සේ පරිස්සමෙන්
අන්දති සිනිඳු සළු ගෙන ආ සුර ලෝකෙන්

37. අන්දා සිනිඳු සුසිනිඳු සළුපිළි සොබන
පළඳා මුතු මැණික් හා රන් ආබරණ
ගල්වා සුවඳ දිය ගෙන ආ දෙව් ලොවින
ඔසවා ගොසින් තැබුවා මත රන් යහන

38. මල් වට්ටියක් ලෙස සඳ පායා තිබුණා
විල්වල කුමුදු මොනවට පිපිලා තිබුණා
සඳකැන් දියෙන් හිමගිර තෙමිලා තිබුණා
පිස මල් සුවඳ පවනක් හමමින් තිබුණා

39. සුදු සඳ දෙසින් සුදු ඇත් පැටවෙක් එන්නා
සුදු දළ යුවල සඳ කැළුමෙන් බබළන්නා
හොඬයෙන් සුදුම සුදු නෙළුමක් ගෙන එන්නා
අහසින් ටිකෙන් ටික පොළොවට ළං වෙන්නා

40. පැටවා රිදී පර්වතයට බැස ගන්නා
එතැනින් ඇවිත් රන් පව්වට නැග ගන්නා
ඉන් බැස ඇවිත් සයනය ළඟ නවතින්නා
දේවිය නිදන ඇඳ වට තෙවරක් යන්නා

41. තෙවරක් යහන වටකොට පැදකුණු කරලා
යහනේ එක් පසෙක නැවතී සිට බලලා
රුවන් විමානෙට පිවිසෙන ලෙස පාලා
දේවිය කුසට පිවිසුණි සිහි එලවාලා



DampeTheroKaviBook_Content_20180804.indd 15 2018/8/4 8:46 AM

42 දකිමින් සුබ සිහින දේවිය සැතපෙන්නේ
තරුපති සැඟව දිනපති සිහසුන ගන්නේ
විල්වල පියුම් සතුටින් විකසිත වෙන්නේ
විහඟුන් ගයන ගීයෙන් ලොව පිබිදෙන්නේ

43. දේවිය සතුටු සිත් යුතුවම පිබිදෙන්නා
ගත සිත දෙකම සතුටින් ඉපිළී යන්නා
මහරජු දකින්නට ඉවසිලි නැති වෙන්නා
වහ වහ ගොසින් සිහිනයෙ තතු පවසන්නා

44. සිහිනය ඇසූ රජු තරමක් බිය වෙන්නේ
රට විපතකට පත් වේ දැයි සිතමින්නේ
සිහින පලාපල අසනට රිසි වෙන්නේ
සිහින සතර දත් බමුණන් කැඳවන්නේ

45. ඇදුරනි පිනැති කරුණාවෙන් අහගන්න
දේවිය දුටුව සිහිනයෙ තතු දැන ගන්න
කැමතියි රටට සුබ අසුබ ද දැන ගන්න
පින්වත් ගුරුනි සිහිනය පහදා දෙන්න

46. තම තම උගත් දෙය ඇතැමූල සේ දන්නා
බමුණන් සිහින පල මේ ලෙස පවසන්නා
සුබ සිහිනයකි දරුපල ඇති බව පෙන්නා
උතුම් පුතෙකු හට ඔබ පියතුම වෙන්නා

47. කැත් කුලයට පමණක් නොව තුන් ලොවට
උතුම් පුතෙකු දේවිය ගැබ් ගත් බවට
බමුණන් කී සිහින විසඳුම ඇසූ කලට
සතුටින් ඉපිළ රජු සිට ගති එක වරට



DampeTheroKaviBook_Content_20180804.indd 16 2018/8/4 8:46 AM

48. මෙපුවත ඇසූ රජ මැදුරම සතුටින්නේ
එහෙ මෙහෙ දුවති ඔවුනොවුනට පවසමිනේ
මහ මැති ඇමති සිටු දන ඈ කලබලිනේ
රජු මුණ ගැසී සුබ ආසිරි පවසන්නේ

49. කණ කණ ගොසින් මෙ පුවත පළවිය ඇත
රජ සිටු මැදුරු දුප්පත් පැල්පත් දසත
ජනයා අසා සතුටට පත්වන පුවත
මහ මග රැස්ව නටමින් ගයතිය ගීත

50. බුදුපුත් කුස දරන දේවිට පින්සාර
තව තව වැඩි උනා ගෞරව සත්කාර
බුදු කෙනෙකුන්ට මව වන ඇය පින්කාර
සිල් ගුණ තව පුරන්නේ දවසක් නෑර

51. ලෝ දම් ලෙසට බෝසත් මව සිල් ඇත්තී
දේවිය රජු කෙරෙහි තව පතිවත් ඇත්තී
අන් පුරුෂයන් වෙත සිත් නොයවන ඇත්තී
දන් පින් කරන්නට නිරතුරු සිත් ඇත්තී

52. බෝසත් මනා සිහියෙන් මව් කුස ඉන්නේ
රන් දෙවොලක දෙව් රුව මෙන් වැඩ ඉන්නේ
දින සති මාස ලෙස කාලය ගතවෙන්නේ
වෙසක් සඳ කලා පසළොස පුරවන්නේ

53. මායා උපන් ගෙය ඇත්තේ දෙව්දහ ය
මාපිය නෑසියන් ඉන්නෙත් දෙව්දහ ය
කුලගුරුවරුන් වැඩ ඉන්නෙත් දෙව්දහ ය
දරුවා ලබන්නට යායුතු දෙව්දහ ය



DampeTheroKaviBook_Content_20180804.indd 17 2018/8/4 8:46 AM

54. සුදොවුන් රජුට ඇය මේ බව පැවසූවා
දෙව්දහ යන්න රජුගෙන් අවසර ලැබූවා
ගමනට අවැසි සියලු ම දේ සිදු කෙරුවා
මහ පෙරහරින් දෙව්දහ යන්නට වූ වා

55. අසරු සෙනඟ පෙරහර පෙරටුව යන්නේ
කුඩ කොඩි සේසත් ද එහි දෙවනුව යන්නේ
කපිල වස්තු පුර අභිමන් කියමින්නේ
පන්සියයක් පමණ ඇත් සේනා යන්නේ

56. පිරිවර ලඳුන් පන්සියයකි දේවියට
අමතර තවත් පන්සියයකි සේවයට
සුරවිරු සෙබළු දහසකි රැකවරණයට
මැණික් එබූ රන් දෝලාවකි යන්ට

57. පෙරහර මෙසේ දෙව්දහ පුර වෙත යන්නේ
පෙර මග සුබ නිමිති බොහො සේ හමුවෙන්නේ
මග දිග රන් තොරන් තැන තැන ඉදිවෙන්නේ
රන් පුන් කළස් පෙර මග තව සරසන්නේ

58. මී අඹ මලේ රොන් සුවඳට ඇදී යන
මී මැස්සන්ගෙ ගුමු නද මග දිග ඇසෙන
විහඟ ගීත නද සමඟින් පාව එන
මහමායාට ආසිරි ගී ගයන මෙන

59. දඹ ගස් දොඩම් ගස් මල්පල දරාගෙන
පාරට බරව ඇත අතු ඉති නවාගෙන
බෝසත් පුතුන් තම කුස තුළ දරාගෙන
යන දේවියට ආසිරි පතනවා මෙන



DampeTheroKaviBook_Content_20180804.indd 18 2018/8/4 8:46 AM

60. මහ මග දෙපස වන රොදවල සෙමෙර මුවන්
දුව පැන නටන්නේ සමඟින් ඕලු මුවන්
බිය වී සැඟව සිටිනා සුදු හා පැටවන්
පැන පැන දුවන්නේ තුටු කර දුටු දුටුවන්

61. කිරි වැද පැසී රත් පැහැ වී එන ගොයමයි
යුතු කෙත් නැහැවිලා හිරුගේ රන් කිරණයි
කුඹුරේ වැඩට ජීවිත ගෙවනා ගවයොයි
දුටු දන සිතට නිතරම දෙන්නේ සතුටයි

62. සීතල හිමාලය දිය කර ගෙන ගලන
කපිලවස්තු සීමා සලකුණු කරන
සුන්දර නදිය මග දිග තැන තැන පෙනෙන
රිදී පටක් සේ වන ගොමු මැද වැටුණ

63. මග දිග අසිරි සිරි මේ ලෙස පෙනෙන්නා
දේවිය රුවන් දෝලාවෙන් වඩින්නා
පිටතට මදක් එබිකම් කර බලන්නා
සොඳුරු මනා සල් වනයක් දකින්නා

64. කපිලවස්තු සහ දෙව්දහ අතර මැද
ලුම්බිණි නම් ගමක් පිහිටා තිබෙයි සොඳ
එහි සල් වනය පිනවයි ජන මන නිබඳ
දේවිය සිතයි එහි රැඳෙනට කලක් මද

65. ඇය සිත් පරිදි උයනේ ඔබිනොබ යන්නා
නැගණිය ප්‍රජාපති ඇය සමඟින් උන්නා
දෙව්ලියො මෙන් සොඳුරු මේ සොයුරියො දෙන්නා
උයනට තවත් සිරියාවක් ගෙන දුන්නා



DampeTheroKaviBook_Content_20180804.indd 19 2018/8/4 8:46 AM

66. සුපිපි කුසුම් ගැවසී ගත් රුක් වලිනී
සීත සුනිල් දිය උතුරන විල්වලිනී
රතු සුදු නෙළුම් පිරිලා ඇති විල්වලිනී
දන මන පිනන විහඟුන්ගේ ගී නදිනී

67. සුසැදුණු උයන තුළ මද නල හමන්නේ
තැන තැන සුසැදි සාලා ගිම් නිවන්නේ
නෑමට කදිම සීතල දිය තිබෙන්නේ
උයනේ සොඳුරු බව කදිමට පෙනෙන්නේ

68. උයනේ පොකුණුවල සීතල සුනිල දියෙන්
නාගත් දේවි උයනේ තව නිවයි ගිමන්
මෙයතර දකියි ඈ සල්ගොමු පිපි කුසුමන්
නෙලනට මලක් සල් අත්තක් අදියි සෙමෙන්

69. දරුවා ලබන්නට කල් එළඹී තිබුණා
ඒ බව මාය දේවිට හොඳ හැටි දැනුණා
ප්‍රජාපතිට ඇය ඒ බව පවසන්නා
ප්‍රසූතියට කටයුතු පිළියෙල කෙරුණා

70. රිදී ගුහාවක සිටි සිහරදකු ලෙසින්
රන් විමනක වැඩසිටි දෙවියකු විලසින්
කුමරුන් බිහි වුනා සිහි ඇති සිහ විලසින්
තුන් ලෝකයම කුල්මත් කර මනා ලෙසින්

71. පළමුව දෙව් බඹුන් දෝතින් පිළිගන්නේ
දෙවනුව ඇමති මැතිවර දෝතින් ගන්නේ
කුමරුන් කිරි මවුන් දෝතින් බැස ගන්නේ
පියවර හතක් පියුමන් මත ඇවිදින්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 20 2018/8/4 8:46 AM

72. "මම වෙමි උතුම් මිනිසෙක් මේ තුන් ලොවට
නොකරමි යලිත් ආලය සංසාරයට
සිඳලමි බැමි සසර කියනෙමි මග සැමට
මින් මතු නැවත බවයක් ඇති නොවේ මට

73. මෙලෙසින් උදම් වැකියක් නොබියව කිවුවා
සියලු දෙනාගේ සොම්නස වැඩි කෙරුවා
මෙ පුවත ඇසූ සුදොවුන් රජු තුටු වූ වා
සිය පුතු බලන්නට ලුම්බිණියට ආවා

74. දෙව්දහ ගමන ලුම්බිණියෙදි නිම වූ වා
මව සහ පුතා කැඳවන් ආපසු ආවා
කිඹුල්වතම සතුටින් ඉපිළී යනවා
මව සහ කුමරු පිළිගන්නට සැරසෙනවා

75. මෙපුවත අසා නොසතුටු වන්නෝ කවුරු
නටමින් ගීත ගයමින් තුටු වෙති නුවරු
මග දිග තබා මල්දම් එල්ලූ පුවරු
සුවඳ දියෙන් උනුනට ගහගති නුවරු

76. මාළිග සඳලු තල නෙක මල්වලින් හැඩයි
කුමරුගෙ මුහුණ දැක ගන්නට සැදී සිටියි
මව සහ කුමරු රන් විමනට වැඩම කරයි
බෝසත් උපත තවුසෙක් දිවනෙතින් දකියි

77. උපන් නැකත බලවත් බව දුටු තවුසා
කුමරුන් බලන්නට මැදුරට යයි විගසා
මහරජ පිළිගනියි ආ දේවල තවුසා
ගුරුනට පෙන්වන්න පුතු ගෙන එයි සරසා



DampeTheroKaviBook_Content_20180804.indd 21 2018/8/4 8:46 AM

78. පුතු ගෙන ඇවිත් රජු ගුරුනට වන්දන්නේ
සුදු හංසයකු මත රතු පියුමන් ලෙසිනේ
බෝසත් දෙපා ගුරුවර හිස මත රැඳුණේ
ඉන්පසු කිසිත් නොසිතු දෙයකුයි වෙන්නේ

79. කුමරුන් ගත ලකුණු දුටු දේවල තවුසා
බෝසත් පා වඳියි සිරසින් ගෙන සකසා
බුදුවන ලකුණු බිලිඳුන් ගත තිබෙන නිසා
හසරැලි නගා ඇඬුවා මේ ලෙස පවසා

80. එකත් ලෙසට මොහු මතු දින බුදුවෙනවා
සැකක් නැති නිසා මා හසරැලි පෑවා
බුදුරුව දකින්නට එදිනට මා නැතුවා
දුකක් නිසාවෙන් දෙවනුව මා ඇඬුවා

81. කුමරුට නම් තබන්නට දින වෙන් කෙරුවා
බමුණු ගුරුන් රජ මැදුරට ගෙන්වනවා
අහරින් සිනිඳු සළු පිළියෙන් පුද කරවා
කුමරුන් සභා මැද රන් යහනේ තැබුවා

82. බමුණන් කුමරු ගත සලකුණු බලන්නා
දෙතිසක් මහ ලකුණු ඇති බව දකින්නා
මෙවන් ගත ලකුණු සහිතව සිටින්නා
සක්විති පදවි හෝ බුදුබව ලබන්නා

83. එකසිය හතක් බමුණන් මේ ලෙස බැලුවා
සක්විති රජකු හෝ බුදුවන බව කීවා
වයසින් බාල බමුණා වෙන ලෙස බැලුවා
බුදුබව ලබන බව සහතික ලෙස කීවා



DampeTheroKaviBook_Content_20180804.indd 22 2018/8/4 8:46 AM

84. ලෝකෙට යහපතක් ම ය සිදු කරන්නේ
සිද්ධාර්ථ නම එබැවින් තබන්නේ
පෙළපත උතුම් ගෞතම වන බැවින්නේ
සිද්ධාර්ථ ගෞතම යැයි කියන්නේ

85. කුමරුන් ඉපිද සතියක් ගත වී යන්නා
ඉන්පසු කිසිවෙකුත් නොසිතුවක් වෙන්නා
සතුටට පසුව දුක එන බව පෙන්වන්නා
මායා දේවි ලෙඩ වී යහනට වැටුණා

86. රෝගය ඇගේ බලවත් වී ආ බැවින
කරනට කිසිත් පිළියම් තව නැති බැවින
ලොව ඇති සියලු දේ අනියත වන බැවින
දේවිය ගියා පිට වී මේ අත් බවෙන

87. සතුටින් සිටිය නගරය සෝකෙන් වෙළුණා
රන් මල් රිදී දම් හැම ගැල වී වැටුණා
සැමගෙම ගතට සුදු පිරුවටයක් වැටුණා
මායා සිරුර දවලා ගිනිදැල් නිවුණා

88. කාලය පසුව හෙම්හිට ගත වී යන්නේ
කුමරුට කිරි මවක සොයනට සැරසෙන්නේ
ප්‍රජාපතිගෙ සිත සෙනෙහස පිරෙන්නේ
කිරි මවු ලෙසින් බෝසත් පුතු රකින්නේ

89. කාලය ගෙවී යද්දී වප් මස ලැබුවා
දන මන නැවත සතුටින් බොහො මත් වූ වා
සීසෑමේ උළෙල ලඟ ලඟටම ආවා
රජු සහ පිරිස මේ උළෙලට එක් වූ වා



DampeTheroKaviBook_Content_20180804.indd 23 2018/8/4 8:46 AM

90. තෙද බල විකුම් දරනා උස් කයින්නේ
රනින් සැදූ නගුලක් අත දරන්නේ
මහරජ කෙතෙහි සී සාමින් සිටින්නේ
නගරයෙ ප්‍රීති උත්සව සිරි තිබෙන්නේ

91. මෙහෙ කරනා ලඳුන් ළඟ සිට කුමරුන්ට
තබලා කුමරු පලබර දඹ ගහක් යට
රිසි වූ බැවින් උත්සව සිරි දකින්නට
පිට වී ගියා කුමරුන් සතපා සොඳට

92. කුමරු නැගිට වටපිට ඇස යොමන්නේ
කවුරුත් නොමැති බව කුමරුට පෙනෙන්නේ
සසරෙහි පුරුද්දක් මතු වී තිබෙන්නේ
බවුන් වඩන්නට කුමරුන් සිතන්නේ

93. එන විට නැවත පෙරලා සේවිකාවන්
කුමරු වැඩ සිටියි කර භාවනාවන්
විස්මය පත්ව රජු අහලා පුවත මෙවන්
දමලා නගුල වහ වහ ආවේය දුවන්

94. බවුන් වඩා දැහැනට සම වදින්නේ
කුමරු පලක් බැඳ අහසේ සිටින්නේ
පියරජු සියලු මේ දේවල් දකින්නේ
දෙවනුත් පුතුට දණ ගහලා වඳින්නේ

95. වළා ගැබින් නික් මී එන පසළොස්වක පුර හඳ සේ
කලා පිරෙන සුදු සඳරැස් කැලුම් දිදී නැග එන සේ
නෙළුම් විලේ සුදු පියුමන් හිරු එළියෙන් පිපෙන ලෙසේ
සැමගේ ආදර ලබමින් ළදරු කුමරු වැඩෙයි මෙසේ

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**කුමර උපත නම් වූ දෙවන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 24 2018/8/4 8:46 AM

### තෙවන සර්ගය

## ගිහි ජීවිතය

1. ඉර හඳ අනුව කාලය ගෙවෙමින් යනවා
ළදරු කුමරු ටික ටික ළමයෙකු වෙනවා
ගුණ දම් බොහොම හොඳ හැටියෙන් අඳුනනවා
හැමටම වඩා ප්‍රඥාවෙන් බබළනවා

2. මිතුරු ලෙසින් හැම දෙනට ම සලකන්නේ
කරුණා සිතින් සැමට ම සහනය දෙන්නේ
මෙත් සිත සියලු ප්‍රාණින් වෙත සදමින්නේ
ගුණ නැණ දෙක නිසයි කුමරුන් බබළන්නේ

3. දෙව්දත් දිනක දුන්නෙන් හල හී පහරින්
බිම ඇද වැටුණි එක් විහගෙක් ගිය නුදුරින්
සිදුහත් සතා මුදවාලා හී පහරින්
සුවපත් කළේ කරුණාවෙන් යුතු අදරින්

4. යුක්තිය පිණිස දෙව්දත් රජු වෙත යනවා
පසු දින රජ සබේ දී එය විමසනවා
චූදිතයෙකු ලෙසට සිදුහත් කැඳවනවා
සුව වූ හංසයාව ද එහි ගෙනියනවා

5. තම හී සර පහර වැද හංසය වැටුනා
එනිසා තමන්ටයි හිමි වෙන්නට ඕනා
බොහො අය දෙව්දත්ගෙ තර්කය පිළිගන්නා
එනිසා දෙව්දත්ට හසු දෙන්නට ඕනා

6. සිදුහත් එවිට ආසනයෙන් නැගිටින්නේ
තර්කයකින් එම තීරණ බිඳ ලන්නේ
"සුරකින අයට දිවි හිමි විය යුතු වෙන්නේ
නසනා අයට කෙලෙස ද හසු හිමි වෙන්නේ

7. සිදුහත් කී දේට හැමදෙන එකඟ උනා
හංසය නැවත සිදුහත්ට ම අයිති උනා
සභා ගැබෙහි එවෙලෙහි සිටි සියලු දෙනා
ඔහුගේ ගුණ නුවණ පිළිබඳ කතා උනා

8. රජකම ලබා ගන්නට ඉන්නා කුමරු
ශිල්ප ඉගෙන ගත යුතු වෙයි වෙතින් ගුරු
එබැවින් කැඳවලා සාකිය කුලේ ගුරු
ශිල්ප උගන්වන්නට දුන්නේය ගරු

9. ගුරු බස පිළිගනී නොරිදා සිත ඇදුරු
කලට නියම වැඩ නිමවයි දුන් ඇදුරු
ගරු සිත් ඇතිව කුමරුන් උගනී අකුරු
එනිසා සියලු දේ කියලා දෙයි ඇදුරු

10. කැත් කුල දම් සිරිත් රජවරුනට තිබෙන
වැඩිකල් නොයා උගනී ගුරු උපදෙසින
මානව දහම් සහ පාලන විධි තිබෙන
දැන ගත්තා කුමරු කෙටි වූ කාලෙකින

11. නීතිය මනා ලෙස කුමරුන් දැන ගත්තා
ඉතිහාසය වේද මැනවින් දැන ගත්තා
සියලුම කලා කුමරුන්ගේ සිත් ගත්තා
සංගීතය මනා ලෙස පුහුණුව ගත්තා



DampeTheroKaviBook_Content_20180804.indd 26 2018/8/4 8:46 AM

12. බෙර පද වයන්නට කුමරුන් බොහො දස්සයි
වීණාවට ඊටත් වැඩියෙන් සූරයි
වස් දඬු වයන්නට වැඩි වැඩියෙන් කැමතියි
මේ හැම කලාවම කුමරුට නම් පුහුණුයි

13. කුමරුන් සමත් වූවේ සංගීතයට
ඔහු තව කැමති විය සිතුවම් ඇඳීමට
ඇඳි සිතුවමක මුව පැටවෙකු දුටුව විට
අයෙක් සිතති ඒ රුව පණ ඇති ලෙසට

14. ඉගෙනුම සඳහ මුළු දවසම ගත කරන
ළද ඉසිඹුවෙදි කිරිමව් තුරුලට දුවන
මව් ඇකයේ ඉඳන් සුරතල් බස් දොඩන
කුමරුන් සැනසුවා ඇගෙ සිත සහ සවන

15. කිරිමව ප්‍රජාපති කුමරුන් ගෙන ළඟට
තුරුළේ හොවන් කවි ගී මුමුණයි ඔහුට
ඒ හඬ දිගේ සෙනෙහස ගලනා කලට
ඈ තුරුළේ ම කුමරා විය නිදන්නට

16. මව් සෙනෙහසේ අඩුවක් නැහැ දැනෙන්නට
පිය සෙනෙහස ද වැඩි වැඩියෙන් කුමරුන්ට
වේද සතර ඡන්දස් ඈ දත් සොඳට
කුමරුන් පටන් ගත්තා අවි පුහුණුවට

17. දුන්නක් අරන් ඊතල අමුණා එයට
දුවනා අසකු මත රැඳ වූ එල්ලයට
විදිනේ යාර සිය ගණනක් දුරින් සිට
කුමරුන් සමත් විය ඊතල විදින්නට



DampeTheroKaviBook_Content_20180804.indd 27 2018/8/4 8:46 AM

18. කඩුවක් අරන් පැන බඹ දහයක් උඩට
එහි රැඳි අඹය ගෙන කඩුවේ මුවාතට
සම ලෙස කපන'යුරු හුරු විය මනා කොට
කෙටි කලකින් සමත් විය කඩු හරඹයට

19. කෝපව ගිගුම් දී හොඬ ඔසවා උඩට
සවි බල ඇතෙකු එන කුමරුගෙ ඉදිරියට
හොඬයෙන් අරන් දමනේ ඒ ඇතු බිමට
කුමරු සමත් විය අලි ඇත් දමනයට

20. ජව ඇති අසෙකු හැකි වේගෙන් දුවන්නට
දූවිලි නගා වායුව මෙන් යන කලට
පියවර නොවරදා අසු පිට නගින්නට
හැකියෙන් සමත් විය ඔහු අස් දමනයට

21. ශිල්ප සතර තව තව මැනවින් උගනියි
කුමරු දැන උගෙන ගුණ නුවණින් මෝරයි
ජව ඇති කුමර ගත තේජස බලය දරයි
කපිල වස්තුවේ කිරුළට දැන් සුදුසුයි

22. අවි පුහුණුවෙන් කුමරුන් වෙහෙසව ඉන්නා
කිරිමව් තුරුල්ලට තවමත් දිව යන්නා
තරුණ පුතුව ඇය සෙනෙහෙන් සිප ගන්නා
උකුළේ හිස තබා කුමරුන් සැතපෙන්නා

23. කුමරු ටිකෙන් ටික වයසින් මෝරනවා
රජුට සතුට මෙන් බියකුත් ඇති වෙනවා
බමුණු ගුරුවරුන් කී දෙය සිහි වෙනවා
සක්විති පුතෙකු දකිනට රජු රිසි වෙනවා



DampeTheroKaviBook_Content_20180804.indd 28 2018/8/4 8:46 AM

24. පුතුට කළකිරීමක් නොම ගෙන දෙන්න
සැලසුම් සියලු හැදුවා රජු මැනවින්න
අවු වැසි සීතලෙන් පීඩා නොම වෙන්න
මාලිග සෑදුවා වෙන වෙන නවතින්න

25. රන්වන් පට පිළී අබරණ ගත දරන
නන්වන් මිණි මෙවුල්දම් ඉන වට බඳින
රන්වන් පටින් දික් වූ වරලස ගොතන
සොබමන් ලියෝ බොහො වෙති මැදුරෙහි සරන

26. ලෙඩුන් මළමිනී සහ හැම මහලු දනන්
ගිහිගෙය අතැර තපසට ගිය පැවිදි දනන්
ඇතුළු නුවර වසනට වර නොමැති දනන්
පිට නුවරට ගියා නො දැකම කුමරාණන්

27. ලෙඩ වී විඳින්නට සිදුවන රෝග දුක
වියපත් වෙලා විඳිනට වන ජරා දුක
මරණය නිසාවෙන් ඇතිවන වියෝ දුක
සැඟවිය හැකි ද කුමරුන්ගෙන් සසර දුක

28. රස මසවුලෙන් කුමරු ව සතපවන්නා
සිනිඳු කසී සළුවෙන් ගත වසන්නා
කොමළ ලඳුන් ගී ගයමින් නටන්නා
දුක සඟවන්න රජු වීරිය කරන්නා

29. රුවන් විමානෙක කුමරුව තබන්නා
සුවඳ පවන පමණක් එහි හමන්නා
විල්වල පියුම් පරවෙන්නට නොදෙන්නා
දුක සඟවන්න රජු වීරිය කරන්නා



DampeTheroKaviBook_Content_20180804.indd 29 2018/8/4 8:46 AM

30. අඟනන් දෙව්ලියන් බඳු මෙහි සිටින්නා
දහදිය ගලන්නට ගත ඉඩ නොදෙන්නා
මැදිවිය ලබන විට පිටමං කරන්නා
දුක සඟවන්න රජු වීරිය කරන්නා

31. නරකෙස් පෙනෙන්නට නම් ඉඩ නොදෙන්නා
ගැහැණුන් සළුපටින් තම හිස් වසන්නා
මහලු දනා කුමරුන් හමු නොවන්නා
දුක සඟවන්න රජු වීරිය කරන්නා

32. ලෙඩුන් වෙන ම මන්දිරයක තබන්නා
මැරුණ එවුන් රහසේ පිට කරන්නා
තවුස් දනන් නුවරට නොකැඳවන්නා
දුක සඟවන්න රජු වීරිය කරන්නා

33. සුපිපි කුසුම් පමණක් එහි තබන්නා
මැල වී යන්න පෙර ඉවතට දමන්නා
අනියත දකින්නට කුමරුට නොදෙන්නා
දුක සඟවන්න රජු වීරිය කරන්නා

34. පුතු ගිහි ගෙයි ම රඳවාලා තබන්නට
ඇත්තේ එක දෙය කි දැන් තව කරන්නට
රුව ඇති තරුණියක් සොයලා දී පුතුට
බන්දා තබා ගත හැකි වෙයි ගිහිගෙයට

35. රජතුම ඇමති මැති හැම දෙන හමුවන්නේ
හමු වී තමන්ගේ අදහස පවසන්නේ
එක මතයක් ලෙසින් එය තහවුරු වන්නේ
කුල කුමරියක් සොයනට දැන් සැරසෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 30 2018/8/4 8:46 AM

36. කපිලවස්තු පුර කුමරුගෙ මංගල්ලේ
කළ යුතු බවට මහ රජු තීරණය කළේ
කුමාරියක් සොයනා ලෙස සුදුසු කුලේ
දඹදිව පුරා රජුනට දැන්වීම කළේ

37. "රස මසවුලෙන් නිති කුස පුරවා ගන්න
රුවන් මැදුරුවල සැප විඳිමින් ඉන්න
රුවැති ළඳුන් නිති පිරිවරමින් ඉන්න
කිසිදු ශිල්පයක් නැත්තේ ඔහු දන්න"

38. දඹදිව බොහෝ නිරිඳුන් ඔහු නොදත් නිසා
නොතිබූ බැවින් ඔහු දත් ශිල්පයක් අසා
"කා බී නටන සියුමැලියෙකි" සිතූ නිසා
මෙවැනි හසුන් බොහො නිරිඳුන් එවූ නිසා

39. සුදොවුන් රජුගෙ සිත බොහො ලෙස පෑරෙන්නේ
පුතු ගැන ඔවුන් ඇයි මේ ලෙස පවසන්නේ
සිදුහත් කැඳවලා මේ බව දන්වන්නේ
ඔවුනගෙ මතය බිඳලන ලෙස ඉල්ලන්නේ

40. පියරජතුමනි! ඉල්ලීමට එකඟ වෙමි
මසක් ඉකුත් වූ කල එය ඉටු කරමි
කඩු දුනු ශිල්ප ඇත් අස් ශිල්ප ද පාමි
මනුදම් නීති ඡන්දස් වේද ද කියමි

41. "මසෙකින් සිදුහත් ගෙ දස්කම් දක්වන්නේ
සරණෙට සුදුසු දූවරු හා සමගින්නේ
දඹදිව සියලු රජකැළ එදිනට එන්නේ
මේ පණිවිඩය යළි රජුනට දන්වන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 31 2018/8/4 8:46 AM

42. දින දින ලං වෙවී නියමිත දින එනවා
පුර මැද සොඳුරු මණ්ඩපයක් ඉදිවෙනවා
එක එක රජුට වෙන වෙන මණ්ඩප තනවා
පුරවර දනන් වෙන මණ්ඩපයක තැබුවා

43. මණ්ඩප මැදින් ලොකු පිට්ටනියක් වූවා
පිටිය වටා අසරුන් නිති සැරිසැරුවා
ඒ හැම තැනම කුඩ කොඩි සේසත් තබවා
රන් සහ රිදී කැටයම් පුවරුද තැබුවා

44. රණ බෙර වයන වාදකයෝ වටේ සිට
බෙර පද වයති රණ ගී ගායනා කොට
මුළු පුරවර ම කුමරුට ජය පතා සිට
මහ හඬ නගයි කල් ඇතිව ම නැගී සිට

45. දෙවියන් විමානෙට වඩිනා විලාසෙට
රජවරු වඩිති සිප් දක්වන සභාවට
පිරිවර ඔවුන්ගේ සපැමිණ සභාවට
දෙව් පිරිවර සේ බබලති මනාවට

46. පුතුගෙ සමත්කම් දක්නට කැමැත්තෙන්
කපිල වස්තුවේ අබිමන් කිරුළ දරන්
මෙහෙසුරු සමඟ උමයංගන වඩින ලෙසින්
තෙදැති නිරිඳු එයි මහ දේවිය සමඟින්

47. සිහිනෙන් පවා සිය පුතුගේ ජය පතන
උතුරා ගලන සෙනෙහස ඇති හදවතින
දෙනෙතින් යුතු ව සිදුහත්ගේ රුව සොයන
දේවිය ප්‍රජාපති සිටියා ගෙන අසුන



DampeTheroKaviBook_Content_20180804.indd 32 2018/8/4 8:46 AM

48. වනයේ සරණ එඩිතර සිහ රදකු ලෙස
ඉහළ ම කුලයෙ ඔද තෙද ඇති ඇතකු ලෙස
සහ පිරිවරින් වඩිනා දෙව්රද විලස
වඩිනා කුමරු ගත්තේ සැමගේ දෑස

49. දෙගුරුන් දෙපා වැඳලා අවසර ගන්නේ
ශිල්ප සතර දුන් ගුරුපෙළ නමදින්නේ
බලැති මහා සෙන්පතියකු විලසින්නේ
උගත් ශිල්ප දක්වන්නයි සැරසෙන්නේ

50. කුමරු දුන්න සහ ඊතල ගෙන අතට
වේගෙන් දුවද්දි ම නැගලා අසු පිටට
දුවන වෙනත් අසකුගෙ රැඳි එල්ලයට
විදියි හැම දෙනා පත්කර පුදුමයට

51. කිරිමව හදේ උතුරා යන සතුට යුතු
දුවනට සැරසෙනා විට සිප ගන්න පුතු
නිරිඳුන් සළුපටින් අල්ලා ඇය නැවතු
බලයි හැමගෙ මුව ආඩම්බරය යුතු

52. කඩු ශිල්පයට දස්කම් පෑ සෙන්පතියන්
දුනු ශිල්පයේ විස්කම් පෑ කුමාරයන්
මල්ලව පොරයෙ සුරුකම් පෑ කුමාරයන්
හැමටම ලබන්නට වූවේ පරාජයන්

53. ශිල්ප දැකුම් මේ අයුරින් නිමා උනා
හැම දෙන එක්ව සිදුහත් ගැන කතා උනා
දූවරු දෙන්න හැම රජකු ම එකඟ උනා
එනිසා ස්වයංවරයක් එහි සිදු කෙරුනා



DampeTheroKaviBook_Content_20180804.indd 33 2018/8/4 8:46 AM

54. ඔටුනු දරා කුමරුන් සිහසුන ඉන්නේ
සක් දෙව්ටත් වඩා කැලුමින් බබලන්නේ
පෙළට සැදී එක එක කුමරිය එන්නේ
ඇවිත් කුමරු දෙන තිළිණය අරගන්නේ

55. අනත් සසර පිරු පෙරුමන් ඇති බැවින
පින් මහිමයෙන් හා නුවණින් බබලමින
තෙදැති බලැති සූරිය දෙව්මෙන් පෙනෙන
කුමරු ළඟට යන්නේ පය පැකිලෙමින

56. කුමුදු කැකුළු මෙන් සුදුමැලි වූ මුහුනෙයි
කුමරු ළඟට එන්නට ඇති බිය සැකයයි
හිරු තෙද වැටීමෙන් නැමෙනා කුමුදු ලෙසයි
කුමරුගෙ තෙද වැටී ඔවුනගෙ සිරස නැමෙයි

57. ආ සැම කුමරියට කුමරුගෙ තිළිණ ලැබෙයි
කවුරුත් ඔහුගෙ මුව බලනට සමත් නොවෙයි
කුමරු ද ඔවුන් හා වදනක් හෝ නොදොඩයි
කුමරුගෙ සිත ද කිසිදා උන්වෙත නොනැමෙයි

58. සියලු ම තිළිණ දීලා දැන් නිම වෙන්නේ
ඉන්පසු තවත් එක් දිගැසක පැමිණෙන්නේ
සසරෙ හොඳට හුරු බවකුයි දැනෙන්නේ
දෙදෙන ම හොඳින් මුව ඔසවා බලන්නේ

59. දරුවන් නිසා සමුදුර හිස් කළ ඇත්තී
මහොසධ ළඟදි නොමැරෙන නම් තිබු ඇත්තී
කිඳුරිය වෙලා පතිවත රැකගත් ඇත්තී
වෙසතුරු කල දි දානය ලෙස දුන් ඇත්තී



DampeTheroKaviBook_Content_20180804.indd 34 2018/8/4 8:46 AM

60. බෝසත් කල දි සහයෝගය දුන් ඇත්තී
සියක් දහස් බවවල ළඟ සිටි ඇත්තී
පෙරුම් පිරූ බව හොඳ හැටි දුටු ඇත්තී
එක්ව නිවන් දකිනට පින් කළ ඇත්තී

61. හිරු දෙස බලාගෙන පිපෙනා පියුම ලෙසින්
හිස ඔසවලා ඔහු දෙස බැලුවා සතොසින්
දෙන්නේ නැතිද මා හට කිසිවක් විගසින්
ඇසුවා තරුණි අඳුරන දැරියක විලසින්

62. "කිසිත් නොදී ඉන්නේ කොහොමද ඔබට
මගේ වටින මුතුහර දෙන්නෙමි ඔබට
එහෙත් ඔබගෙ නම කියනට හැකි ද මට
"යසෝදරා මම වෙමි" කිවුවා ඔහුට

63. දෙදෙනා මේ ලෙසට හඳුනා දැන ගන්නා
සසර පුරුදු ලෙස සෙනෙහසකින් බැඳුනා
මවුපියො ඔවුන්ගේ සෙනෙහස දැන ගන්නා
සතුටින් සරණ බන්දනයට සැරසෙන්නා

64. යසෝදරා ඉපදුණෙ දෙව්දහ නුවර
සුප්පබුද්ධ රජුගේ දියණිය පවර
දෙව්දත් සොයුරුගේ නැගණිය වී මෙ වර
ඉපදුණෙ රුවෙන් ගුණයෙන් යුතු පින් සාර

65. දෙනුවර සරණ මංගල්ලෙට සැරසෙනවා
දෙව්ලොව දෙකක් මිහිබට සේ දිස්වෙනවා
කපිලවස්තු දන වෙසෙසින් තුටු වෙනවා
නගරය රන් රිදී තොරණින් සරසනවා



DampeTheroKaviBook_Content_20180804.indd 35 2018/8/4 8:46 AM

66. රන් පුන්කලස් නගරය තැන තැන තබලා
රන් මිණි කිකිණි එල්ලෙන මහදද එල්ලා
සුවඳ තෙලින් එල්ලෙන පන්දම් තබලා
මහ මං කුඩා මං සුදු වැලි අතුරවලා

67. කුමර කුමරි යුවලට සුබ සිරි පතලා
රන්වන් පුවරුවල ආසිරි වැකි ලියලා
රිදී කුළුණු තැන් තැන්වල සිටුවාලා
රන් දම්වැලින් ඒවා ඈත එල්ලාලා

68. රන් සහ රිදී තොරණින් සැරසිලි වන්නේ
මිණි මුතු පබළු වැල් හැම තැන එල්ලෙන්නේ
සුවඳ සමන් මල්මාලා එල්ලන්නේ
රජ මාළිගය දෙව් මැඳුරක සිරි ගන්නේ

69. අනගි කසී සළුවෙන් සැරසී සොඳට
අබරණ පැළඳ කිරුළ ද දරමින් සොඳට
සසර පැතුම ලෙස සිදුවන විවාහෙට
කුමරු සැපත් විය සක්විති විලාසෙට

70. සියුමැලි වුව ද කැලුමින් යුතු වුවන ඇති
සුවඳ ඇත ද මල් ගැවසූ වරල ඇති
සඳ මෙන් වුව ද ලප නොම වන් වුවන ඇති
අබරණ නැත ද දෙව්ලිය වන් සිරුර ඇති

71. යසෝදරා කෝමල ගමනින් එන්නා
කුමරු අසළ ආසනයේ ඉඳ ගන්නා
හිරුගේ කැලුම් වැදි සඳ සේ බබළන්නා
බිමට හෙලූ නෙත් ඇතිව ම සිටින්නා



DampeTheroKaviBook_Content_20180804.indd 36 2018/8/4 8:46 AM

72. ඇදුරු පුරෝහිත බමුණෝ පැමිණෙනවා
කුල සිරිතට අනුව කටයුතු සිදුවෙනවා
යාග ගින්න වට දෙදෙනා ඇවිදිනවා
දෙව්ලොව දෙයක් පොළොවේ දැන් සිදුවෙනවා

73. බමුණු ඇදුරු මන්තර ජප කරන සඳ
රැස් වූ සියලු දෙන සිටියා ඇඳිලි බැඳ
කුමරු තිලක තැබුවා ඇගෙ නළල මැද
සරණය මෙසේ සිදුවිය තුටු ගීත මැද

74. සතුට නිසා කිරිමව කඳුලැලි සැලුවා
පියරජු කඳුල සඟවා ආසිරි සැලුවා
නෑයෝ පැමිණ ආසිරි මල් පුද කෙරුවා
නුවරු සැවො ම සතුටින් ගයමින් නැටුවා

75. ගිහි ගෙය අතඇරල දමා කුමරු යාවි පැවිදි වෙන්න
බමුණො කියපු දෙය අහලා මහ රජතුම විය සිතන්න
විවාහය ද කරලා දුන්නෙ ඔහු සක්විති වනු දකින්න
එහෙම උනත් කැමති වෙයිද ඔහු සක්විති රජකු වෙන්න

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**ගිහි ජීවිතය නම් වූ තෙවන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 37 2018/8/4 8:46 AM

### සිවුවන සර්ගය

## පෙර නිමිති දැකීම

1. ඉසුරෙන් පිරුණු මහ මන්දිර ලබා දුනි
සුරඟන සදිසි අඟනුන්ව ද ලබා දුනි
උතුම් සොඳුරු බිම්බාව ද ලබා දුනි
ලොවේ උතුම් සම්පත් හැම ලබා දුනි

2. සිල්ප සතර නිසි ලෙසට ම ලබා දුනි
කපිලවස්තු පුර යුවරජ පදවි දුනි
දඹදිව පුරා කිතුගොස ඇති කරල දුනි
සක්විති වෙන්න මග මැනවින් හදා දුනි

3. නුවරින් පිටව කිසි දවසක ගියේ නැත
එනිසා නුවර පිට ඇති දුක පෙනුනෙ නැත
සම්පත් අතර මැදුරෙ ද දුක සැඟව ඇත
ඒ දුක දකින්නට කුමරුට නුවණ ඇත

4. රස මසවුලෙන් නිති කුස පිරවූවාට
සිනිඳු කසී සළුවෙන් ගත වැසුවාට
අඟනුන් ගයා නටනා හැටි දුටුවාට
හැකි ද සියළු දුක් සඟවා තබන්නට

5. රුවන් විමන්වල ඇති සැප වින්දාට
සුවඳ මද පවන හැමදා වින්දාට
පරවෙන පියුම් නොදකින්නට ලැබුනාට
හැකිද සියළු දුක් සඟවා තබන්නට

6. ලෙඩ වූ අය හංගාලා    තැබුවාට
මරණය ඇස් දෙකෙන් වහලා    තැබුවාට
මහලු දනන් නුවරින් පිට    කෙරුවාට
හැකිද සියළු දුක් සඟවා    තබන්නට

7. සුපිපි කුසුම් පමණක් එහි    දුටුවාට
පරවෙන කුසුම් හමු නොවුනද නෙත්    වලට
අනියත මෙසේ සඟවාලා    තැබුවාට
නුවණින් හැකි වේය ඒ දුක දැක    ගන්ට

8. සිදුහත්ගේ නුවණ ටික ටික    මෝරන්නේ
ලොවේ නියම තතු දැන් වටහා    ගන්නේ
මහරජු කෙසේවත් නොසිතූ    අයුරින්නේ
සක්විති සිහින ටික ටික මැකිලා    යන්නේ

9. හැම වසරකම විය වප් මඟුල    සී සෑම
රජු ගෙන ගියා යුවරජුනුද    හැමදාම
කුමරු එහිදි දුටු දේවල්    ඒ ලෙසම
නුවණින් බලන්නට සිදු විය    සැබවින්ම

10. අදිනා නඟුල් පහරින් පස    පෙරළෙනවා
පස යට සැඟව සිටි පණුවන් මතු    වෙනවා
මිනිසුන් පයට ඒ පණුවන්    පෑගෙනවා
ගොනු කුරවලට යට වී පොඩි වී    යනවා

11. කළුවන් මඬේ පිපි සුදු පියුමන්    ලෙසට
සුදු කොක් රැන පියඹා එනවා    කෙතට
ඇවිදින් අහුල ගන්නේ පණුවන්    හොටට
රස අහරක් ලෙසින් යනවා උන්    කුසට

12. ගොනු කුර වැදීමෙන් සිරුරම බිඳුණු සතෙක්
නොමැරී තවම විඳවන්නේ මහත් දුකක්
ගෙල බැඳි නගුල ඇදගෙන යන මී ගවයෙක්
නවතින විටදි මිනිහෙක් ගහනව පහරක්

13. ගොනුකුර පහර වැද මියයන සතුන් ගැන
කොකුනට ගොදුරු වී මියයන සතුන් ගැන
වෙහෙස වෙවී බර අදිනා සතුන් ගැන
බැලුවේ කුමරු කරුණාවෙන් හද පිරෙන

14. තුවාල වී ලේ ගලනා සතුන් විඳින දුක
පණ තිබෙද්දි ගිලිණු ලබන සතුන් විඳින දුක
පහර කකා වැඩ කරනා සතුන් විඳින දුක
කුමරුන් සිතනට වූ වා පිළිබඳව ම දුක

15. මැදුරට පැමිණ නිහඬව සිතමින් සිටිනා
කුමරු සිටින බව සෝකෙන් හද දවනා
සසරෙ දි බොහෝ කල් සිට දන්නා බැවිණා
යසෝදරා හට කුමරුගෙ සිත දැනුණා

16. "හිමියනි ඔබේ සිත යමකින් පෙළෙන්නෙ ද?
ඔබෙ සිත නිවන්නට මට අද හැකි වේ ද?"
"මා සිත පෙළෙන්නේ නොනිමෙන දුක් කන්ද
ඒ දුක් නිවන්නට ඔබ හට හැකි වේ ද?"

17. ඔබට නුවණ ඇත හිමි එය විසඳන්න
ඔබෙ සිත ඒ නිසා සන්සුන් කර ගන්න
යමු ද මදක් අපි උයනේ ඇවිදින්න
චන්නට කියන්න ද කන්තක සරසන්න



DampeTheroKaviBook_Content_20180804.indd 41 2018/8/4 8:46 AM

18. චන්න ඇමති රථයක් අරගෙන ආවා
යුවරජු දේවි සමගින් රථයට ආවා
ඉරහඳ එකතු වූ ලෙස කැලුමන් පැවා
සහපිරිවරින් උයනට යන්නට වූ වා

19. යසෝදරාගේ උපදෙස් පිළිගන්නේ
උයන බලන්නට යුවරජතුම යන්නේ
පියරජතුමා බොහො සතුටට පත්වන්නේ
ලේලිගෙ නුවණ ගැන ආඩම්බර වෙන්නේ

20. මහලු මිනිස්සුන් නැහැ මහ වීදිවල
ලෙඩුන් සිටින්නේ නුවරින් පිට ගෙවල
මැරුණු කෙනෙක් අද නැහැ පුරයේ ඇතුළ
පැවිදි තවුස් දන ඉන්නේ කැලෑවල

21. එනිසා බියක් නම් ඇති විය යුතු නැත්තේ
සිදුහත් දකින නිමිති ද අද මෙහි නැත්තේ
කුමරු හොඳින් උයනේ තුටු විය යුත්තේ
කියා නිරිඳු තම සිත සනසා ගත්තේ

22. චන්න ඇමති අසු පදවන් යයි පෙරට
ඉඳහිට යමක් පවසයි යුවරජු ඔහුට
අමුතු යමෙක් පෙර හමු වී නැති නෙතට
දැකලා යොමු කරයි පැනයක් චන්න හට

23. හම රැළි වැටී ගත වෙවුලන පැසුණු හිසයි
දත් නැති කටියි ගිලිහුණ නිල සහිත නෙතයි
සැරයටියකට බර දී ලා ගමන් කරයි
කිසිදා නොදුටු මේ හැඩරුව කවුද අසයි



DampeTheroKaviBook_Content_20180804.indd 42 2018/8/4 8:46 AM

24. රබන් ඇසක් සේ තිබූ හම තරුණ කල
කලුවන් බඹරු මෙන් වූ හිස තරුණ කල
සුසුදු දසන් සහ නිල් නෙත් තරුණ කල
සැරයටියකට බර වෙයි අප මහලු කල

25. "මා ඔබ අප සැවොම වයසට යනවාද?
මෙලෙසට නොවී ඉන්නට ඇයි බැරි මොකද?"
"තරුණකමට ඉන්නා අප සැවො ම අද
මේ ලෙස වේවි හෙට දිනයේ දී නිරිඳ"

26. චන්න ඇමති මේ ලෙස පිළිතුරු දුන්නා
යුවරජු සිරුරෙ හැටි ටික ටික දැන ගන්නා
අනියත දහම කුමරුට වැටහී යන්නා
උයනට නොයා ආපසු මැදුරට යන්නා

27. වූ දෙය එලෙස මහරජ හට සැල වූ වා
රජු මේ නිසා බෙහෙවින් කලබල වූ වා
ඩා බිඳු නැගුණු ගත වෙව්ලන්නට වූ වා
බමුණු අනාවැකි යලි යලි සිහි වූ වා

28. හිතට කණස්සලු දැනෙනා වෙලාවට
යුවරජු තව ම යයි තම කිරිමව ළගට
හිස පීරමින් සිටි කිරිමව දුටු කලට
නිකමට එබී බැලුවා මවගේ හිසට

29. හිසකෙස් තව ම කලු පාටට තිබෙන්නා
ඒ අතරින් එකක් සුදුවට පෙනෙන්නා
මව ද මහලුවී යන බව දැනෙන්නා
හිතට දුකක් හා බියකුත් දැනෙන්නා



DampeTheroKaviBook_Content_20180804.indd 43 2018/8/4 8:46 AM

30. කුමරු සොයන්නේ දිවියේ ඇති තත්වේ
හැමතැන දකින්නේ මුලු ලොව අනියත වේ
අනියත නිසා වැටහෙන්නේ එය දුක වේ
ඒ දුක නිවාලන මග තව නැත ලැබුවේ

31. දින දෙක තුනක් යුවරජ නිහඬව සිටියා
දිනක් උදෑසන චන්නව සොයා ගියා
කාටත් නොදන්වා ගමනක් යමු ද කියා
අස්රියෙ නැඟී මාලිගයෙන් පිටව ගියා

32. මාලිගයේ තිබෙන සියලු ම දේ බොරු වේ
විෂ කටු උඩින් බුමුතුරුණක් දැමූ වැනි වේ
නුවරින් පිටත තව බොහො දේවල් සිදුවේ
සෙවිය යුතුයි මා ජීවිතයේ තත්වේ

33. කුමරුගෙ රථය උයනට පැදගෙන යනවා
පෙරදා වගේ අද වෙනකෙකු හමු වෙනවා
ගඩු නැගි සිරුර නෙත කඳුලැලි බේරෙනවා
බිම වැතිරිලා මේ මිනිසා වැලපෙනවා

34. "ඇයි මේ කෙනා බිම වැතිරී වැලපෙන්නේ
සිරුරේ මොකද තැන තැන ගඩු මතුවන්නේ?"
"ලෙඩ යනු මෙයයි සැමටම ලෙඩ වැලඳෙන්නේ
ඇති තතු මෙයයි එය තේරුම් අරගන්නේ"

35. ලෙඩ යන වදන කුමරුට බිය ගෙන දෙන්නේ
ධනය බලය ඇති මුත් ලෙඩ වැලඳෙන්නේ
තව විස උලක් ම ය නොපෙනී තිබෙන්නේ
සම්පත්වලින් යට කරලා තියෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 44 2018/8/4 8:46 AM

36. මහලුවීම සහ ලෙඩ දුක් යන මේවා
වැළකිය නොහැකි ලෙස දිවියේ ඇති ඒවා
නැති කර දමන්නට හැකි වූයෙ ද මේවා
ලද හැකි උතුම් සැප නම් ඒක ම වෙනවා

37. දුකෙන් මිදෙන මං යුවරජ සොයන විට
එක් පුවතකින් මැදුරේ ඇති විය සතුට
යසෝදරා පිළිසිඳගෙන ඇති බවට
වෙදුන් පැවසුවා කිරිමව් දේවියට

38. සැමගේ සතුට තව තව වැඩි වී යන්නා
යුවරජුගේ සිතට තව තව වද දෙන්නා
ඉපදෙන පුතු ද ලෙඩ වී වයසට යන්නා
ඔහුට ද මට ද ඒ දුක් විඳිනට වන්නා

39. කාලය මෙලෙස ටික ටික ගත වී යනවා
කුමරුට බොහෝ දේවල් තව වැටහෙනවා
කුල බල දන නිසා ඇතමුන් වැජඹෙනවා
ඒවා නැති ව ඇතමුන් තව දුක්වෙනවා

40. නැටුම් ගැයුම් මාලිගයේ නිති තිබෙන
සෝෂාවක් ම විය ඔහුගේ කණ පෙළන
උයනට නොගිය හින්දා බොහො කාලෙකින
අස්රියෙ නැග ගියේ යලි උයනට යන්න

41. පිරුවට ඔතා සුදු මල් දම් පළඳාලා
යහනක තබා ගෙන සිවුකොන ඔසවාලා
ගෙනයන යමක් දැක මිනිසුන් වැළපීලා
අසයි චන්නගෙන් මේ මොකදැයි කියාලා



DampeTheroKaviBook_Content_20180804.indd 45 2018/8/4 8:46 AM

42. ඉපදෙන සැවොම දිනකදි මරණෙට යනවා
ඔබ සහ මට ද ඒ ඉරණම අත්වෙනවා
එදිනට මෙලෙස නෑයින් කරමත යනවා
මේ ලෙස එන්න මරණය ගැන පවසනවා

43. ඔබත් මාත් අන් සැවොමත් මැරෙන්නේ
දුකක් නොවෙද සැමටම අත් කරන්නේ
එයින් මිදෙන හැටි තව නැහැ දැනෙන්නේ
යළිත් හැරී මාළිගයට වඩින්නේ

44. කුමරුන් පැමිණ සිය මැදුරට වී සිටියා
යසෝදරා විත් කුමරුන් ළඟ සිටියා
සිත් පීඩාවකින් ඉන්නා තම සැමියා
දුටු ඇය කොමළ ලෙස එය විමසා සිටියා

45. හිමියනි කියනු මැන පීඩාවක් ඇත්ද
කවර දුකක් ඔබගේ සිත පෙළනවද
රජ සබයෙදී කිසිවක් හෙම සිදු වී ද
නැතිනම් වෙනත් පීඩාවක් ඇති වී ද

46. ලෙඩ දුක් මහලු බව මරණය දසත ඇත
ගැල වී යන්න කිසිවෙකුටත් මගක් නැත
මගක් සොයා ගන්නට මට සිතී ඇත
එහෙත් කුමක් කළ යුතුදැයි දන්නෙ නැත

47. හිමි මම ඔබගෙ සිත හොඳ හැටි අඳුනනවා
ඔබ කී සියලු දෙය හොඳ ලෙස වැටහෙනවා
බව දුක නසන්නට ඔබ හට හැකිවෙනවා
ඒ මග සොයන නුවණ ද ඔබ සතුවෙනවා



DampeTheroKaviBook_Content_20180804.indd 46 2018/8/4 8:46 AM

48. පසළොස්වක සඳ පායා නැති වෙනවා
කළුවර වෙලා නැවතත් හඳ පායනවා
මාස කීපයක් මේ ලෙස ගතවෙනවා
යසෝදරාගේ දරු ගැබ මෝරනවා

49. ඇසළ මසට පුරහඳ පායා එන්නේ
උයනට යන්න යුවරජ යළි සැරසෙන්නේ
පිරිවර සමඟ මහ මග බබළවන්නේ
ලස්සන යමක් ඔහු එවෙලේ දකින්නේ

50. කසාවතක් ඇඳ මුඩු කළ හිස ඇතිව
පා කබලක් අත දරමින් සිහි ඇතිව
සාන්ත වූ නිසසල දෙනෙතක් ඇතිව
අයෙක් වඩිති සන්සුන් ඉඳුරන් ඇතිව

51. කසාවතක් ඇඳ ඉඳුරන් දැමූ ඇත්තා
පා කබලක් ගෙන සතුටින් යන ඇත්තා
මුහුණේ සියලු ඉරියව් සන්සුන් ඇත්තා
කවුරුද චන්න මේ මග වඩිනා ඇත්තා

52. මහලු නොවී ඉන්නට මග සොයා යන
රෝග නැතිව ඉන්නට මග සොයා යන
මරණය නැතිව ඉන්නට මග සොයා යන
පැවිදි කෙනෙකි මොහු නිවනට මග සොයන

53. එවදන් ඇසූ කුමරුන් බොහො තුටු වන්නේ
දිදුලන කැලුමකින් ඔහු වත බබලන්නේ
පෙර දා තිබූ දොම්නස් පහ වී යන්නේ
උයනේ සියලු සිරි නරඹා අද යන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 47 2018/8/4 8:46 AM

54. මහලු කෙනෙකු දුටුව නිසා ජරා දුකට බිය උනේ ය
ලෙඩ වූවෙකු දුටුව නිසා රෝග දුකට බිය උනේ ය
මළ සිරුරක් දුටුව නිසා සිතේ දුකට බිය උනේ ය
පැවිදි රුවක් දුටුව නිසා නිවනට මග එළි උනේ ය.

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**පෙර නිමිති දැකීම නම් වූ සිවුවන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 48 2018/8/4 8:46 AM

## පස්වන සර්ගය

# අභිනික්මන

1. පටුමාවතක පියවර තබමින් යන්නේ
මනරම් විල් තෙරක් අසබඩ නවතින්නේ
මසෙක් ඉවුර ළඟ කෙළිමින් පිහිනන්නේ
කොකෙක් ඇවිත් ඒ මසු ඩැහැගෙන යන්නේ

2. විලේ ජලය මෙන් සම්පත් තිබෙන්නේ
මසුන් ලෙසට අප කෙළෙමින් සිටින්නේ
කොකුන් වගේ මරණය විගසකින්නේ
ඇවිත් අපත් ඩැහැගෙන ගිල දමන්නේ

3. ඇහැළ ගස් පෙළේ මල් ඇත පිපීලා
එයින් ඇතැම් මල් පර වී වැටීලා
කසාවතක් සේ බිම ඇත එලාලා
අනියත දකින්නේ ඒ මල් බලාලා

4. රෑ පිපි කුමුදු මේ මොහොතේ පරව ඇත
දැන් පිපි පියුම් හවසට මෙහි දකිනු නැත
ජීවිත අපේ පියුමට සම වෙලා ඇත
අනියත දහම මේ හැමට ම පොදුව ඇත

5. පියුම් පිපෙන විල් පතුලේ මඩ ඇත්තේ
මතුපිට ලස්සනෙන් මඩ සැඟ වී ඇත්තේ
සම්පත් තිබූ මුත් දිවියේ දුක ඇත්තේ
සම්පත්වලින් ඒ දුක සැඟ වී ඇත්තේ

6. පිපි හැම පියුම් පර වී විල තුළ වැටෙනා
පරවෙන පියුම් කුණු වී ඒ තුළ රැඳෙනා
සුවඳ හැමූ විල මහ දුගඳින් පිරෙනා
සම්පත් නිසාවෙන් මිනිසුන් දුක් විඳිනා

7. හිරු රැස් චණ්ඩ වී ඉහළින් සිටින්නේ
ගත ගිනියම් ව දහදිය දැන් ගලන්නේ
පිපාසයෙන් දිව තොල කට පෙළන්නේ
සොබා දහම තුළ අප දුක් විඳින්නේ

8. කුමරු උයන තුළ හිමිහිට ඇවිදිනවා
ඇවිදින අතර මේ හැම සිතමින් යනවා
දිවියේ සැබෑ තතු මේ ලෙස වැටහෙනවා
මේ හැම නිමා කරනට සිත් ඇතිවෙනවා

9. උයනට එද්දි මගදී දුටු පැවිදි රුව
කුමරුගෙ සිතට අස්වැසුමක් ගෙනපු රුව
සන්සුන් ගමන දුක් නැති කළ පැවිදි රුව
දුක නැසුමට මග පෙන් වූ පැවිදි රුව

10. දුක ඇති කරයි සම්පත් අල්ලා ගන්න
එය හැර දමා හැකිනම් තපසට යන්න
පුළුවනි දුක නිවා සැමදා සැනසෙන්න
කුමරු සිතයි අද හෙට තපසට යන්න

11. කුමරු සිටින විට මේ ලෙස සිතුවිල්ලේ
තපසට යන බව සිතමින් සැනසිල්ලේ
පණිවිඩ රැගත් සෙබළෙක් එම ඇසිල්ලේ
පණිවිඩයක් ගෙන පැමිණෙයි විදිල්ලේ

12. ගැබ්බර දරා සිටි දේවිය යසෝදරා
සුළු මොහොතකට පෙර බිහි කළේ පුත්කුමරා
පුන්සඳ වගෙයි අද අහසේ එන මෝරා
දැක ගනු මැනවි පුතු සහ ඔබෙ යසෝදරා

13. තපසට යන්න මා දැන් සිතමින් උන්නේ
තවත් බැඳීමක් නොව දැන් ඇති වෙන්නේ
රාහුලයෙකු ඉපිද බන්ධනයක් වෙන්නේ
කියමින් නැවත පණිවිඩ කරු හරවන්නේ

14. සෙබළා නැවත හැරිලා ඉන් පිට වෙනවා
ගිහින් මාළිගාවට රජු හමු වෙනවා
යුවරජු කියපු දේ එලෙසින් පවසනවා
එබැවින් රජු පුතුට "රාහුල" නම තැබුවා

15. පණිවිඩ ලැබුණු යුවරජ උයනින් එනවා
මාළිගයට යන පාරට පිවිසෙනවා
සසරෙහි තිබෙන බිය තව තව සිහිවෙනවා
රජ සැප අතැර යන සිතිවිලි වැඩි වෙනවා

16. කුමරු මෙලෙස සිතමින් මැදුරට යන්නේ
මන්දිර සඳලු තල හැම පහු කරන්නේ
සඳලු තලාවක එක් අඟනක ඉන්නේ
කිසා ගෝතමී නමිනුයි හඳුනන්නේ

17. කිසා ගෝතමී කුමරුව දකින්නේ
ඔදැති තෙදැති බව කුමරුගෙ පෙනෙන්නේ
සූර වීර කම් අහලා තිබෙන්නේ
කුමරුට ඇසෙන සේ මේ ලෙස කියන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 51 2018/8/4 8:46 AM

18. මෙබඳු පුතෙකු ලද මව නම් නිවුනාමයි
මෙබඳු පුතෙකු ලද පියතුම නිවුනාමයි
මෙබඳු කෙනෙකු හිමි ලෙස ලබනා දැරියයි
එකත් ලෙසට මුළු දිවිය ම නිවුනාමයි

19. මව ගේ සියලු දුක් ගිනි මම නිවන්නෙමි
පිය රජතුමාගේ දුක් ගිනි නිවන්නෙමි
යසෝදරාගෙ ද දුක් ගිනි නිවන්නෙමි
සියලු සතුන්ගෙ ම දුක් ගිනි නිවන්නෙමි

20. කුමරුට මෙලෙස ඇය කී දෙය වැටහෙනවා
ඇයට තිළිණයක් දෙන්නට සිත් වෙනවා
කෙනෙකු අතට ගෙල බැඳි මුතුහර දෙනවා
ඇයට මුතුහරය දෙන ලෙස පවසනවා

21. යුවරජු මාළිගාවට දැන් සැපත් උනා
කෙනෙක් රජුට පණිවිඩ ගෙන පිටත් උනා
පිය රජතුමා දකිනට පුතු කැමති උනා
එනිසා කුමරු පියරජු වෙත එන්න උනා

22. "පිය රජතුමනි කරුණක් ඇත විමසන්න
අවසර ඇති ද දැන් ඒ දෙය පවසන්න"
"පළමුව ඔබට ඕනෑ දෙය විමසන්න
ඉන් පසු හැකිය මගෙ අදහස් පවසන්න"

23. "ඔබ දුන් සියලු සැප සම්පත් මෙහි තිබෙන
වෙනසට යාවි ලෝ දම් අනියත බැවින
ඔබ මා සියලු දෙන නිරතුරුව ම පෙළෙන
බව දුක නසන මග සොයනට මට සිතින"



DampeTheroKaviBook_Content_20180804.indd 52 2018/8/4 8:46 AM

24. තපසට යන්න යුවරජු අවසර පැතුවා
මහරජ පුතුව නවතා ගන්නට සිතුවා
"වැඩිකල් නො ගොස් ඔබ සක්විති රජු වෙනවා
හැමට ම පිහිට වෙන්නට ඉන් හැකි වෙනවා"

25. "උපන් නැකත බලවත් බව මම දනිමි
බමුණු ඇදුරුගේ වචනය සිහි කරමි
ඉවසා සිටිනු පුත මම ඉල්ලා සිටිමි
ඔබට අවැසි හැම සැපත ම ලබා දෙමි"

26. මහලුවීම දුකක් නිසා හැමදා තරුණව ඉන්නට
රෝගි වීම දුකක් නිසා හැමදා ලෙඩ නොවී ඉන්ට
මරණය මහ දුකක් නිසා හැමදා නොමැරී ඉන්නට
මේව ලබාලා දුන්නොත් හැක තපසට නොයා ඉන්ට

27. මහලුවීම දුකක් තමයි නොහැකිය මට වළක්වන්න
රෝගි වීම දුකක් උනත් කෙලෙස හැකිද වළක්වන්න
මරණය මහ දුකක් උනත් හැකි වෙද හැමදාම ඉන්න
මේවා නම් දෙන්න බැරිය එහෙත් පුතේ නොයා ඉන්න

28. පියාණනේ සමාවෙන්න මම තපසට යනවා
දුකෙන් මිදෙන මග සොයන්න මම තපසට යනවා
සක්විති රජ කම ලැබුනත් මරණය සිදු වෙනවා
සක්විති රජ හට වුවත් බවයේ දුක වෙනවා

29. සිදුහත් හා සුදොවුන් මහ රජ අතර
සිදු වූ කතා බහ මේ ලෙස විය නතර
පුතුගෙ සිතැඟි නොකළැකි හින්දා නතර
නවතා ගන්න හැකි දේ කෙරුවා නිතර



DampeTheroKaviBook_Content_20180804.indd 53 2018/8/4 8:46 AM

30. සිය පුතුගේ සිතිවිලි ගැන හොඳ හැටියට දන්නා
මහ රජතුම කල් ඇතිව ම රැකවල් තර කරනා
දින ගණනක් දිව රෑ දෙක සෙබළුන් රැක සිටිනා
කිසි කෙනෙකුට යන්නට බැහැ මුරකාවල් වලිනා

31. සොබමන් රුවින් යුතු නිළියන් කැඳ වනවා
නැටුමෙන් කුමරු සනසන්නට අණ දෙනවා
හෙට දිනයෙදී ඔහු සක්විති රජ වෙනවා
අද දින ඔහුව නවතා ගත යුතු වෙනවා

32 . නිළි සැම දෙන ම මහරජ අණ පිළිගන්නේ
යුවරජ සනසවන්නට පිට වී යන්නේ
රුවන් විමානෙක තවුසෙකු විලසින්නේ
ඇලුම් නැතිව යුවරජ මැදුරෙහි ඉන්නේ

33. වරලස රන් පට බන්දා
සුදුමල් කැකුළු ද රන්දා
නළලෙහි තිලකය අන්දා
තෝඩු අරුංගල් පළඳා

34. ගෙල වට මුතුහර බන්දා
රුවන් තිසර පට අන්දා
රන්වන් කය මන බන්දා
දුහුල් කසී සළු අන්දා

35. ඉණ වට සේලය අන්දා
දෑතේ වළලු ද පළදා
මිණි කිංකිණි පය බන්දා
රඟති සුරන් ලිය පරදා



DampeTheroKaviBook_Content_20180804.indd 54 2018/8/4 8:46 AM

36. වීණා අරගත් ලන්දු
ගියති වයති ගී සින්දු
අසමින් ඔවුන ගෙ සින්දු
නැටුම් නටත් මන බැන්දු

37. බෙරයට ගසතිය එකෙක්
වස් දඬු වයතිය කෙනෙක්
ගී ගයද්දී වෙන කෙනෙක්
නටති රඟති තව අයෙක්

38. එකියක් සබයට එන්නා
උඩ සළුවක් ගලවන්නා
රුසිරි මනා පෙන්වන්නා
බඹුගෙ සිත ද සොලවන්නා

39. උන් වයනා මිහිරි වැයුම්
ගයනා හැම මිහිරි ගැයුම්
නටනා සිත පිනන නැටුම්
කුමරු සිතට නොමැත හැඟුම්

40. මෙලෙස අඟනු ගී ගයමින් නටන්නේ
කුමරු සියලු දේ මැනවින් දකින්නේ
එහෙත් නොමැත සිත ඔහුගේ සැලෙන්නේ
උන්ගෙ නැටුම් කලබල මැද නිදන්නේ

41. දෙවියන් පවා තුටුවන ගී කණ නොගෙන
දෙව්ලිය සේ රඟන රැඟුමන් ඇස නොගෙන
දැහැන් බිඳින අප රූසිරි සිත නොගෙන
යුවරජ අපව නො තකා නිදනා බැවින



DampeTheroKaviBook_Content_20180804.indd 55 2018/8/4 8:46 AM

42. කවරකු සඳහා ගී යමු ද අපි මෙතැන
නැටුමන් කවුරු වෙනුවෙන් පාමු ද මෙතැන
වෙහෙසට පත් ව සිටි අඟනන් සියලු දෙන
නිදනට උනා වැටිලා තැන තැන සිතුන

43. රෑ මැදියමේ දී කුමරුට ඇහැ ඇරුණා
දැනුණා තනි කමක් කුමරුගෙ සිත පෙළනා
කෝ මෙහි රඟපු කුමරියො රුසිරෙන් සොබනා
කලබල වූ කුමරු වට පිට බලනු උනා

44. වීණා බෙර නලා තැන තැන තිබෙන්නේ
අබරණ ගැලවිලා විසිරී තිබෙන්නේ
වැටුණු වැටුණු තැන උන් හැම නිදන්නේ
නිදිගත් උන්ගෙ හැටි මෙලෙසින් පෙනෙන්නේ

45. සමහරු දත්මිටි කනවිට තව සමහරු කෙළ බේරෙයි
සිහිනෙන් දොඩවයි එකියක් එකියක් හයියෙන් ගොරවයි
මුතුපට කැඩිලා කෙනෙකුගෙ හිස් නූලක් කරේ තිබෙයි
ඇඳිවත ගැලවී වැටිලා එකියක් නිරුවත්ව නිදයි

46. අවුල්ව ගිය කොණ්ඩෙන් යුතු එකියක මළ කඳ වාගෙයි
වීණාවට හේත්තුවී කොණ්ඩෙ කඩන් කතක් නිදයි
දෙව් විමනක් මෙන් වූ තැන යක්කු නටපු තැනක් වගෙයි
දෙව් අඟනන් සේ නැටූ උන් සොහොනෙහි දැමූ මිනී වගෙයි

47. දැක මේ විසුලු දසුනෙන් සිත කැළඹෙනවා
ගිහි ජීවිතය මිරිඟුව සේ වැටහෙනවා
හැම දෙය ලොවේ බොල් දේවල් සේ වෙනවා
හරයක් සොයා මා දැන් යා යුතු වෙනවා



DampeTheroKaviBook_Content_20180804.indd 56 2018/8/4 8:46 AM

48. මෙසේ සිතා කුමරුන් ඉන් පිට වෙනවා
සියලුම දෙනා තද නින්දේ පසු වෙනවා
යසෝදරා සහ රාහුල සිහි වෙනවා
සිහි වී ඔවුන් නිදනා මැදුරට යනවා

49. නිදනා කුටියෙ දොර පොඩ්ඩක් අරින්නේ
යසෝදරා දෙස සෙනෙහෙන් බලන්නේ
රාහුල පුතුව සිප ගන්නට සිතන්නේ
සිතිවිලිවලින් කුමරුව හිර කරන්නේ

50. දෝතට පුතුන් අරගත්තොත් ඇහැරෙන්නේ
යසෝදරා එතකොට කලබල වෙන්නේ
ඇය කිසිලෙසින්වත් යන්නට නො දෙන්නේ
අද නොගියොතින් වෙන දිනකදි නො වෙන්නේ

51. අද මා මෙසේ රහසේ සමු දී යනවා
බුදු වී යළිත් ඔබ හමුවෙන්නට එනවා
එදිනට දුකෙන් මිදෙනා මග පවසනවා
මෙසේ සිතා රහසෙ ම පිට වී යනවා

52. ගිහින් චන්න ඇමතිට අඬ ගසන්නේ
කන්තක රැගෙන එන්නට අණ කරන්නේ
කුමරුන් යන බවයි චන්නට දැනෙන්නේ
හැමට ම ඇහෙන්නට හයියෙන් අඬන්නේ

53. මැදුරේ සැවෝ ම දැන් තද නින්දේ ඉන්නේ
චන්නගේ ඇඬිලි කාටත් නැහැ ඇසෙන්නේ
එනිසා චන්න කඳුලු ද වගුරමින්නේ
කන්තක අසුව සරසා ලා ගෙනෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 57 2018/8/4 8:46 AM

54. ඇසළ පොහොය දා මැදියම් රෑ වෙනවා
රජ සැප අතැර කුමරුන් ඉන් පිට වෙනවා
කන්තක පිටේ නැග නගරෙන් පිට වෙනවා
චන්න ඇමති පමණක් තනියට යනවා

55. පුර හඳ පායලා මග දිග එළි වෙනවා
සීත මද පවන ගත සිත සනසනවා
ඈත අනෝමා ගඟ පසුකර යනවා
කපිලවස්තු සීමාවෙන් පිට වෙනවා

56. ගංතෙර සුදු වැලි තල මත සඳ වැටිලා දිලිසෙන්නේ
බෝසත් පා පිළිගන්නට සුදු පාවඩයක් වැන්නේ
බෝසත් හිමි ඒ වැලිමත කොමල දෙපා පිහිටන්නේ
කඩුව අරන් එක් අතකට කෙස් වැටියම සිඳලන්නේ

57. බෝසත් කෙස් වැටිය කපා අහසට විසි කරනා
සක් දෙව් රන් කරඬුවකින් ඒවා පිළිගන්නා
ඒ සියල්ල තැන්පත් කර මිණි සෑයක් සදනා
ඒ සෑයේ නම සිළුමිණිසෑය නමින් කරනා

58. අබරණ සළු පිළි ගලවා චන්නට පැවරුවා
සියලුම දේ පියතුමාට දන්වන්නට කිවුවා
ඝටීකාර නම් බමුණෙකු සිවුරු අරන් ආවා
ඒවා පිළිගෙන බෝසත් පැවිදි කෙනෙක් වූ වා

59. ඇසළ අහසේ සඳගින සඳ බෝසතුන් තපසට වඩින සඳ
මෙතෙක් ලඟ පිටි හිමි සඳුන් තම නැවත මැදුරට නොවඩිනා සඳ
කන්තකගේ ළය පැලී මළ සඳ චන්න අඬ අඬ නැවත යන සඳ
බෝසතුන් අද පැවිදි වූ සඳ හෙට දිනට ලොව නැගෙයි නව සඳ

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**අභිනික්මන නම් වූ පස්වන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 58 2018/8/4 8:46 AM

## සවන සර්ගය

# දුෂ්කර ක්‍රියා

1. පුර හඳ අවපසට ඉඩ දී බැහැල ගියා
කපිල වස්තු පුර අඳුරෙන් වැසී ගියා
යුව රජු පෙර දිනයෙ රජ සැප අතැර ගියා
නුවරුන් උදයෙ සෝකෙන් අඬමින් සිටියා

2. ඉඳගත් නැතින් නැන සිතුනේ නැගිටින්න
දෙපා දැත් විය සෝකෙන් වෙවුලන්න
තියුණු දැස විය කඳුලැලි වගුරන්න
එඩි බල ඇත ද මහරජ විය වැලපෙන්න

3. මුතුහරයක් දරු කල ගෙල පලඳවපු
තුරුලු කරන් කිරිමව කඳුලැලි බීපු
පුතු ගැන මතක හදවත සතුටින් තබපු
දැන් ගිනි ගොඩකි හදවත සෝකෙන් දවපු

4. දෙකොපුල් දිගේ ගලනව නෙත් දිය දහරා
එ දියෙන් තෙමෙයි උකුලේ සිටි පුත් කුමරා
බැරිවිය නවතන්න ඔහුගේ මග අවුරා
හිමි නැති සොවින් වැලපෙනවා යසෝදරා

5. කිඳුරිය ලෙසින් ඔහු වෙත පතිවත් රැක්කා
දරුවන් දනට දෙන විට මුනිවත රැක්කා
සසර පුරා ඇය බෝසත්තුම රැක්කා
උතුම් හිමි සඳුන් ඇය මනසින් දැක්කා

6. යහන් නැතිව වෙයි ගස් යට නිදන්නට
මිහිරි ගීත නැහැ නින්දෙදි අහන්නට
පිරිවර නැතුව වෙයි තනිකම දරන්නට
හැම නින්දෙදි ම ඔබ සිහනෙන් පෙනෙයි මට

7. දුකෙන් මිදෙන මග දක්නට ලැබේවා
පතනා බුදු පදවි ඔබ හට ලැබේවා
මටත් ඔබේ මග යන්නට ලැබේවා
ඔබත් සමඟ නිවෙනට මට ලැබේවා

8. මැදුරෙහි අය ද මුළු නුවර ම වැලපෙනවා
චන්න ඇවිත් සිදු වූ දෙය පවසනවා
පුතු ගැන සොයන්නට පිරිසක් යොදවනවා
නිරතුරු රජුට පුතුගැන තොරතුරු එනවා

9. නදිය ගලා යයි පහලට හෙමින් සැරේ
වැලිතල දිගේ යයි සිදුහත් හෙමින් සැරේ
දහවල උදා විය වැඩි විය හිරුගෙ සැරේ
පිඬු සිඟනවා දැතට ගෙන පාත්තරේ

10. ගෙන් ගෙට ගිහින් සිඟලා පිඬු ලැබ ගන්නා
එසේ ලැබූ පිඬු ඔහු දැන් වළඳන්නා
ඉඳුල් බත සිතට අපුලක් ගෙන දෙන්නා
පෙර දින ගත් අහර සැනෙකින් සිහි වෙන්නා

11. එක් මොහොතකට සිත වීරිය නැති වෙනවා
නැවතත් මෙසේ සිතමින් වීරිය වැඩුවා
අදින් පසුව මා ඉඳුලට හුරු වෙනවා
බොජුන් නිසා බුදු බව මග නො හරිනවා



DampeTheroKaviBook_Content_20180804.indd 60 2018/8/4 8:46 AM

12. මෙලෙස පිඬු සිඟා ලත් දෙය වළඳනවා
උයනේ ගහක් යට මඩුවක නවතිනවා
රජගහ නුවර ඇතුලේ ඇවිදන් යනවා
දකිනා සැවො ම රූපෙන් පුදුම ව යනවා

13. දෙවියෙකු තවුස් වෙස් අරගෙන මෙහි එනවා
මගධ රටට සුබ දවසක් ලඟ එනවා
මහ බඹු මෙහෙම සෝබාවෙන් බබලනවා
කෙනෙකු ඔහුට මහ බඹුයැයි පවසනවා

14. දුටු දුටු දනගෙ සිත බෝසත් වෙත යනවා
එක එක කතා උන් මේ ලෙස පවසනවා
කට කට පැතිර ගොස් රජුටත් සැලවෙනවා
වහ වහ ඉහළ මැදුරට ගොස් විමසනවා

15. ඉහළ කවුළුවෙන් රජු මග දෙස බලන
දුටුවා බෝ සතුන් ගෙන් ගෙට පිඬු සිඟන
තවුස් වෙසක් ගත් මහ බඹු දෙස සොබන
විමානයක සිට සක්දෙව් ලෙස බලන

16. රජු වහ සෙබළ පිරිසක් එහි කැඳවනවා
සියලු පුවත් දැන ගන්නට අණ දෙනවා
දෙවියෙකු උනොත් මග දී නොපෙනී යනවා
මිනිසෙකු නම් කොතැනක හෝ නවතිනවා

17. ගෙන් ගෙට ගිහින් උතුමන් පිඬු ලැබුවේය
මග යන අයකුගෙන් පෙර මග ඇසුවේය
රජගහ පැමිණි තවුසන් ගිම් නිවුවේය
ගිජුකුළු පව්ව වෙත බෝසත් ආවේය



DampeTheroKaviBook_Content_20180804.indd 61 2018/8/4 8:46 AM

18. එහි දී ගහක් යට නැවතී වළඳනවා
මිනිසෙකු මිසක දෙවියෙකු නො ව සැක නැතුවා
සෙබළු ගිහින් රජු හට එය සැල කෙරුවා
මහරජු වහ වහා ඔහු හමුවට ආවා

19. තාපස තුමනි ඔබ පෙනුමෙන් පැහැපත් වේ
සම් පැහැයෙන් දෙවියෙකුටත් සම නැති වේ
ඔබ කවරෙකු ද? කුමකටදැයි මෙහි ආවේ
කියනට කැමති වෙද දැන ගන්නට රිසිවේ

20. කපිලවස්තු මා ඉපදුණු පුරවරයේ
කැත්කුල උසස් වූ ඒ සාකිය කුලයේ
බබලන මහරජුය මාගේ පිය වූයේ
තපසට පැමිණි මම වෙමි සිදුහත් වූයේ

21. ඔව් මම දනිමි ඔබ හොඳ හැටි අඳුනනවා
ඔබ මා අතර නො දුටුව මිතු දම් වූ වා
විසල් මගදයට මා අග රජ වෙනවා
එයින් අඩක රජකම ඔබ හට දෙනවා

22. මහරජ රජය අතහැරලයි මා එන්නේ
දුකෙන් නිවෙන මග සොයලයි මා යන්නේ
එනිසා ඔබේ ඇරයුම නැහැ පිළිගන්නේ
අපගේ මිතු දහම නැහැ නොව සිඳලන්නේ

23. එහෙනම් සබඳ මා දැන් නික්මී යනවා
ඔබට ඇරයුමක් කරනට රුචි වෙනවා
අරමුණ ඔබේ කල් නොයවා ඉටු වෙනවා
ඉන්පසු පළමු මගදයට ම වැඩමනවා



DampeTheroKaviBook_Content_20180804.indd 62 2018/8/4 8:46 AM

24. මහ රජ තුමනි එය ඒ ලෙස සිදු වෙනවා
බුදු බව ලබා මා පළමුව මෙහි එනවා
බෝසත් මෙසේ මහ රජ හට පවසනවා
මහ රජු තුටුව වැඳ පැදකුණු කොට යනවා

25. බවුන් වඩන නිවනට මග කියා දෙන
ගුරුවරු සිටිති මේ දඹදිව සියලු තැන
යන්නට ඕනෙ ගුරුවරයකු සොයා ගෙන
පහසුයි එවිට බුදුවන මග මා සොයන

26. මෙසේ සිතා ගුරුවරයකු සොයමින්නේ
සෙනසුන් අසපුවල බෝසත් ඇවිදින්නේ
ආළාර නම් තවුසකු ගැන දැන ගන්නේ
දඹදිව පතල කිත් පැසසුම් ඇතිවෙන්නේ

27. බෝසත් ඔවුන්ගේ අරමට වඩින්නේ
ගුරුවර මුණගැසී අදහස කියන්නේ
දුකින් මිදෙන මගකුයි මා සොයන්නේ
හැකිනම් මෙ මට ඒ මග දැන් කියන්නේ

28. මට හැක තෙවැනි සමවත සම වදින්නට
හැකි වෙමි ඔබට මැනවින් එය කියන්නට
එබැවින් ම වෙත වසමින් අද පටන් සිට
උපදෙස් පරිදි අරඹමු බාවනාවට

29. බෝසත් කෙටි කලක් ඔහුගේ ළඟ විසුවේ
දිව රෑ මහත් වූ වීරියමයි වැඩුවේ
ගුරුවර සිත ද මැනවින් තුටුමයි කෙරුවේ
තුන්වන සමවතයි ඔහු එතැනදි ලැබුවේ



DampeTheroKaviBook_Content_20180804.indd 63 2018/8/4 8:46 AM

30. පසුදා උදැසන ගුරුතුම හමු වෙන්නේ
තමා ලැබූ සමවත ගැන පවසන්නේ
ඉන්පසු කුමක් කළ යුතුදැයි විමසන්නේ
එය ම නිවන වන බව ඔහු පවසන්නේ

31. සමවත් සුවය විඳිමුත් සිත තැන්පත් වී
කෙළෙස් මරුන් සිත තුළ තව ඇත සැඟවී
සමවත නැති කලට ඒවා යළි මතු වී
බවයේ තවත් දුක් වෙන්නට සිදු වේවී

32. ඔබට නො හැකි නම් තව මග පෙන්වන්න
නොහැකිය කිසිදාක කෙලෙසුන් සිඳලන්න
කෙලෙස් නසා නිවනට මග දැන ගන්න
ඔබෙන් වෙන්ව යන්නට අවසර දෙන්න

33. මෙසේ කියා බෝසත් ඉන් පිට වෙනවා
තවත් ඇදුරුවරයෙකු සොයමින් යනවා
දඹදිව තවත් සුපතල ඇදුරකු වෙනවා
රාම තවුස් පුත් උද්දක හමු වෙනවා

34. දුක නැති කරන මග සොයමින් මා ආවේ
කෙනෙකු තෙවන සමවත තෙක් ඉගැන්නුවේ
එයට ද එහා මග සොයමින් මා ආවේ
ඔබ දන්නා බව අහලයි මෙහෙ ආවේ

35. සිවුවන සමවතට හැක මග කියන්නට
මා ළඟ නැවතිලා එය හැක කරන්නට
බෝසත් එතැන උද්දක ලඟ රැඳී සිට
කෙටි කලකින් ම හැකි විය එය ලබන්නට



DampeTheroKaviBook_Content_20180804.indd 64 2018/8/4 8:46 AM

36. ඇදුරනි ඉගැන් වූ සමවත මා ලැබුවා
කෙලෙස් තවම තිබෙනා බව මා දුටුවා
කෙලෙස් නසා නිවනට යා යුතු වෙනවා
එවැනි මගක් ඇතිදැයි ඔබ විමසනවා

37. මෙයයි තිබෙන ඉහළ ම ලබනා තත් වේ
මෙතැනට පැමිණි හැම දෙන නිවනට පත් වේ
ඔබ ඒ නිසා මා හා වෙයි සම තත් වේ
කොටසක් සිසුන් ඔබ හට දෙන්නට සිත් වේ

38. මේ දෙය නොවෙයි මා අද සොයමින් ආවේ
කෙලෙසුන් නසන මගකුයි සොයමින් ආවේ
ගුරුවරයකු වෙන්න මට තව කල් නාවේ
දැන් මට මෙයින් පිට වී යන කල ආවේ

39. උද්දක රාම පුත් අත හැර පිට වෙන්නා
තව තව සත්‍ය සොයනා සිත දැඩි වෙන්නා
බව දුක නසන්නට බෙහෙවින් දුක් විඳිනා
තවුසන් ලෙසට දැඩි දුක් විඳිනට සිතුණා

40. උරුවේලාවෙ වන උයනට පිවිසෙනවා
දුස්කර තපස් රකිනට දැන් අරඹනවා
පිඩු සිඟනා එකද ටික ටික අඩු කෙරුවා
අවසන පිඩු සිඟන එක නවතා දැමුවා

41. මිතුරන් පස් දෙනෙක් මෙතැන දී හමු වෙනවා
ඔවුන් සිඟා ලත් දෙය ගෙනැවිත් දෙනවා
මුං මෑ කොල්ලු තැම්බූ දිය වළඳනවා
බෝසත් සිරුර දැන් ටික ටික වැහැරෙනවා



DampeTheroKaviBook_Content_20180804.indd 65 2018/8/4 8:46 AM

42. ඇසතු ගසට පිට දීලා වැඩ ඉන්නා
බෝසත් තව තවත් වීරිය වඩමින්නා
අසලට වැටෙන බෝපත් ගෙඩි වළඳන්නා
අහර නැතිව කය දුර්වල වී යන්නා

43. ලේ මද බැවින් සිරුර ම කළු වී යනවා
රන් වන් පැහැය සිරුරේ නැති වී යනවා
නිලුපුල් බඳු දෙනෙත් බොර පැහැ වී යනවා
ළිං පතුලක තරු එළි සේ දිස් වෙනවා

44. කුස අතගාන විට කොඳු ඇට අහුවෙනවා
පිට අතගාන විට කුස අත ගැවෙනවා
හිස අතගාන විට කෙස් ගැල වී එනවා
කුණු වූ ලෝම ගැල වී විසිරී යනවා

45. ඉදගත් තැනින් නැගිටින විට විසි වෙනවා
විසි වී ගොසින් වැටිලා සිහි නැති වෙනවා
කෙනෙකු මෙදැක ඔහු මළ බව සැක කෙරුවා
ගිහින් කපිලවස්තුවෙ රජු හට කිවුවා

46. "වීරිය වඩන ඔබෙ පුතු වැහැරී සිටියා
දැන් මොහොතකට පෙර මරුවා අරන් ගියා"
"බුදු වී මිසක පුතු නම් මිය නොයයි" කියා
මහ රජු නොපිළිගත් විට ඔහු යන්න ගියා

47. තපසට ගියත් රජු පුතු ගැන විමසන්නේ
නිතුරු සොයා බැලුමට අය යොදවන්නේ
සියළු පුවත් රජ මැදුර ම දැන ගන්නේ
යසෝදරා වෙසෙසින් එය අහගන්නේ

48. කලුවන් කෙස් වැටිය සිදුහත් සිඳ දැමුවා
යසෝදරා හිස සැරසිලි නොම කෙරුවා
කසාවතක් පමණක් ඔහු ගත දැරුවා
යසෝදරා කහවන් සළුවක් දැරුවා

49. සිඟාලත් දෙයක් සිදුහත් වළඳනවා
යසෝදරා රසමසවුලු හැර දැමුවා
සිදුහත් අහර අත් හල බව ඇ ඇසුවා
දිනකට වරක් පමණක් ඇය වළඳනවා

50. සිදුහත් කටුක රළු පොළොවේ සැතපෙනවා
ඇය සැප යහන් අතහැරලා සැතපෙනවා
සිදුහත් කටුක චරියාවක නියැලෙනවා
ඔහු වෙනුවෙන් ඇය මේ වත් සපුරනවා

51. බෝසත් අහර නවතා තව දුක් දෙනවා
හුස්ම ගැනුම් නවතා තව වද දෙනවා
එබැවින් දැඩි ව කන්නාසා හිර වෙනවා
හිසේ රුදාවක් ඒ සමගින් එනවා

52. බල ඇති ශක්තිමත් මිනිසෙකු හිස අල්ලා
පොඩිකර ඇදල දමනව මෙන් විය හොල්ලා
සිරුරට මෙසේ දෙන දුක් ගොඩ දැඩි වීලා
සිරුර ම කපා දමනව මෙන් විය අල්ලා

53. බෝසත් මෙලෙස සය වසරක් දුක් වින්දේ
ලොව අන් කෙනෙකු නැත මේ ලෙස දුක් වින්දේ
එහෙත් නොමැත නිවනෙහි සැප නම් වින්දේ
දුක් විඳ නිවන නොලැබෙන බව අත් වින්දේ



DampeTheroKaviBook_Content_20180804.indd 67 2018/8/4 8:46 AM

54. දැඩිලෙස දුක් ලබා නිවනට යා නොහැක
එලෙසම සැප ලබා කෙලෙසකවත් නොහැක
අන්ත දෙක ම අත් ඇරලා දැමිය හැක
වෙනත් පිළිවෙතක් නිවනට තිබිය හැක

55. මන බඳනා ගී ගයනා නටන සොඳුරු ළඳුන් ලබා
ගත නිවනා සළු පළඳා කම්සැප ඉහළින් ම ලබා
ගත දවනා සිත තවනා අපමණ ලෙස දුක් ද ලබා
දුක නිවනා මග සොයන්න නොහැකිය බුදු බව නො ලබා

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**දුෂ්කර ක්‍රියා නම් වූ සවන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 68 2018/8/4 8:46 AM

## සත්වන සර්ගය

# බුදුබව

1. දුක් විඳ නිවන් සොයනා බව නැවතුවා
යම් පමණකට ආහර ගන්නට සිතුවා
සිත කය දෙක ම මැනවින් සුවපත් කරවා
නිවන් ලබන පිළිවෙත් පුරනට සිතුවා

2. මෙලෙසින් ටිකක් ආහර ඔහු වළඳන්නේ
පස්වග තවුස් ඒ ගැන නො සතුටු වන්නේ
අහර වළඳමින් කිම මේ කරන්නේ
නිවන් දැකීමක් කිසිදා නොවන්නේ

3. ඔබ ලඟ සිටීමෙන් පලයක් නො වන්නේ
කම් සුව විඳින මගක ය ඔබ දුවන්නේ
නිවන් ලබන මාවත යා යුතු වෙන්නේ
ඔබෙන් වෙන්ව යන්නට අප සිතන්නේ

4. සිඟා ලත් අහර ගෙනවිල්ලා දුන්නා
අවැසි විටෙක උණු දිය සකසා දුන්නා
නොයෙක් ලෙසින් උපකාරව ළඟ උන්නා
වසර හයක් ඉඳලා දැන් පිට වෙන්නා

5. තවුසන් පස් දෙනා බෝසත් තනි කරලා
යන්නට ගියා උරුවෙල් ගම අත ඇරලා
බෝසත් තනිව වැඩ සිටිමින් උරුවේලා
නැවතත් බවුන් වඩනව වීරිය වඩලා

DampeTheroKaviBook_Content_20180804.indd 69 2018/8/4 8:46 AM

6. දිනකට වරක් ආහර වළඳන හින්දා
දැඩි දුක් විදිමෙන් වැලකී සිටි හින්දා
පෙර වූ සවි බලය නැවතත් ගත රන්දා
බැබලුණි සිරුර නැවතත් කැළුමන් විහිදා

7. දෙතිසක් මහ ලකුණු ගත නැවතත් පෙනුණා
කලු වූ සිරුර යලි රන්වන් පැහැ ගැහුණා
නිලුපුල් වන් දෙනෙත බබලන්නට වන්නා
නැවතත් පෙර සේ ම ඇතිවිය රුසිරි මනා

8. බෝසත් මෙසේ අහරින් කය රකින්නා
සිත තුළ කෙලෙස් වීරිය ගෙන මඩින්නා
ඇසතු ගහට පිට දී වැඩ සිටින්නා
දෙවියකු සේ සෝබාවෙන් පෙනෙන්නා

9. වෙසක් මසේ පසළොස්වක දින එනවා
අලුත් එළියකින් ඒ දින බබළනවා
විහඟ ගී සරින් ලෝකය පිබිදෙනවා
ගස් වැල් මල් පිරී සතුටින් හිනැහෙනවා

10. උරුවේලාවෙ ස්නොනී නම් නිගම
සුජාතා ය සිටුවරයගෙ දූවගෙ නම
කුලුඳුල් පුතකු වෙනුවෙන් ඇය කළ පැතුම
ඉටු වී දෙවියො පුදනට යයි උදයේම

11. සැම වසරක ම ඇය දෙවියන් පුදනා
රසවත් කිරිඅහර වෙසෙසින් සකසන්නා
උදයේ දොවපු එළකිරි ටික අරගන්නා
කිරි මිස දිය නුමුසු කිරිබත් සකසන්නා



DampeTheroKaviBook_Content_20180804.indd 70 2018/8/4 8:46 AM

12. ගිතෙල් උක්සකුරු මී පැණි යොදන්නේ
රනින් කරපු භාජනයක දමන්නේ
තමන් පේව සුදු සළුපිලි අදින්නේ
බැතින් ගොසින් දෙවියන් පුද කරන්නේ

13. පුදට යන්න පෙර දාසිය අමතන්නා
"ගිහින් ඇසතු මුල අමදින්නකො පුණ්ණා"
ගස මුල අමදින්න යන දාසිය පුණ්ණා
දුටුව දෙයින් සතුටින් ඉපිළී යන්නා

14. රන්වන් සිරුරකින් කැලුමෙන් බබලන්නේ
නිල්වන් නුවන් යුග මානෙල් පෙති වැන්නේ
බෝසත් තවුස් තෙම රුක්මුල වැඩ ඉන්නේ
නිසැක ව දෙවි බව යි ඇය නම් සිතන්නේ

15. මුසුන ද දමා ඇය ගෙට දුවලා යන්නේ
තමන් දුටුව දෙය වහ වහ පවසන්නේ
වහ වහ සුජාතා කිරිපිඬු ගෙන එන්නේ
සතුටු සිතින් සියලු ම දෙය පුද දෙන්නේ

16. "මේ හැම දෙයින් ඔබ පුද කරනෙමි දෙවිඳ
කරුණා සිතින් ඔබ එය පිළිගන්නේ ද
මගේ පැතුම් ඉටු වූයේ යම් ලෙස ද
එලෙස ම පැතුම් ඉටු වේවා ඔබගේ ද"

17. කිරිපිඬු මෙසේ බෝසතුනට පුද කෙරුවා
පුණ්ණා සතුටු පණිවිඩයක් ගෙන ආවා
මෙහෙකම් කිරීමෙන් එබැවින් ඇය මුදවා
ආපසු මැදුර වෙත ඇය පියමන් කෙරුවා



DampeTheroKaviBook_Content_20180804.indd 71 2018/8/4 8:46 AM

18. උදයේ ලැබුණු පායාසය ගෙන අතට
බුදුවන දින සිදුවන සිරිතක් ලෙසට
බෝසත් අනෝමාවට බැස නා හොඳට
කිරිබත වැළඳුවා සම පිඬු අටක් කොට

19. ඉන්පසු තලිය අරගෙන ගොස් ගඟ ලඟට
බුදු බව ලබන්නට හැකි නම් අද මෙ මට
තලිය පාව යේවා ගඟ උඩු අතට
අදිටන් කර තළිය දැම්මා ගඟ දියට

20. තව ටික දුරක් පාවී ගොස් ගඟ දියට
රන් තාලිය ගියා ගං දිය උඩු අතට
තරමක් දුර ගොසින් අසු වී සුළියකට
ගිලී ගියා නදියේ මැද දිය යටට

21. බෝසත් නැවත ඇසතුව වෙත වැඩමන්නේ
සොත්ථිය නම් තරුණ බමුණා හමුවෙන්නේ
බෝසත් කෙරෙහි ඔහු මොනවට පහදින්නේ
කුස තණ මිටි අටක් පූජා කර යන්නේ

22. මහ බෝ මැඩට කුස තණ අරගෙන ආවා
එහි පෙර දිනෙහි කුසතණ අසුනක් සැදුවා
පධන් විරිය එහි ඉඳ සිත තුළ වැඩුවා
බුදු වී මිසක නැගිටින්නේ නැත සිතුවා

23. පධන් විරිය ගෙන බෝ මැඩ වැඩ ඉන්නේ
බෝසත් දකිනු රිසි දෙව් බඹු සමගින්නේ
බොහො දෙන රැස් වෙලා අතැඟිලි බැඳ ඉන්නේ
අද බුදු කෙනෙකු දැක ගන්නට සිතමින්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 72 2018/8/4 8:46 AM

24. සන නිල් අහස පැහැපත් වී බබලනවා
ගංදිය දහර සර සර ගා බැස යනවා
මද මුදු පවන සිලි සිලි ගා පාවෙනවා
අද බුදු කෙනෙක් තුන් ලෝකෙට බිහි වෙනවා

25. බෝසත් පධන් වීරිය වඩනා අතරේ
දෙව් බඹ සුරන් පිරිවරමින් සිටි අතරේ
වසවත් පිරිස යුද බෙර ගෙන දිග් සතරේ
එන්නට උනා දෙව් බඹ පැන යන අතරේ

26. නිල්වන් අහස කලු වී අඳුරින් වැසුණා
ගං දිය දහර සැඩ පහරක් ලෙස ඇදුණා
මද මුදු පවන මහ සුළඟක් වී හමනා
මරුගේ සෙනඟ බෝසත් අභිමුව සිටිනා

27. ගිනියම් යකඩ ඊතල විදිනට වූවා
ගිනි ගෙන දැවෙන ලෝදිය එහි වැස්සෙව්වා
මුවහත් කඩු කිණිසි ගෙන දමලා ගැහුවා
ගිනියම් යකඩ ගුලි වැස්සක් මෙන් එවුවා

28. මේවා සියල්ල ම කුසුමන් වී එනවා
බෝසත් දෙපා මුල පියුමන් සේ වෙනවා
නිහඬ ව තව ම මහ බෝසත් වෙර වැඩුවා
වෙනත් වෙසක් ගෙන නැවතත් එයි මරුවා

29. සුළි සුළඟක් මවා නසනට තැත් කරනා
කුණාටුවක් ඇති කොට බිය කරනු උනා
ජලගැල්මක් මවා යට කරනට හදනා
බෝසත් කිසිවකින් දැන් කම්පා නොවෙනා



DampeTheroKaviBook_Content_20180804.indd 73 2018/8/4 8:46 AM

30. බෝසත් නවතන්න මෙලෙසින් නොහැකි උනේ
මරු කළ කිසිවකින් බෝසත් නොම සැලුනේ
යමක් කියා බිය කරනට සිතූ බැවිනේ
මරු බෝසතුන් අභිමුව සිට පවසන්නේ

31. එබ්බා මහණ තා මෙතැනින් යා යුතු ය
තා සිටි අසුන මට හිමි බව දත යුතු ය
නො දෙතොත් තාව නසනා බව දත යුතු ය
පොළොවෙහි ගසා නසනා බව දත යුතු ය

32. "එම්බා පවිටු මාරය මම තා දනිමි
ඉඳගත් අසුන බුදු වෙන තුරු නොදෙන්නෙමි
මෙය තට අයත් නැති බව හොඳ හැටි දනිමි
මට හිමි තැනක් බව ඉඳුරා මම කියමි"

33. "මට හිමි බිමක් බව මේ හැම දෙන දන්නා"
කියමින් මරුව පෙන්වූවා තම සේනා
උන්හැම මරුගෙ අයිතිය තහවුරු කරනා
"කවරෙක් නුඹගෙ අයිතිය දනිති"ද අසනා

34. "වෙසතුරු බවේ දී මම බොහො පින් කෙරුවා
තුන්විටක දී මිහිකත කම්පා කෙරුවා
එවන් පොළොව මගෙ අයිතිය පවසනවා"
කියමින් දකුණු අත පොළොවට දික් කෙරුවා

35. එවිට ම මහ හඬින් මිහි තල දෙදරනවා
බෝසතුනගේ අයිතිය තහවුරු වෙනවා
මරුවා සහ පිරිස බිය වී පැන යනවා
මුළු පරිසරය යලි සන්සුන් වී යනවා



DampeTheroKaviBook_Content_20180804.indd 74 2018/8/4 8:46 AM

36. හෙට දින උදේ බුදුවරයකු දකිනු රිසින්
හිරුබැස ගියා දින නිම කොට අපර දෙසින්
බුදුවන මොහොතෙ බෝසත් ගත නිවන සිතින්
සඳ නැග එනව සුපිපී හිරු නැගෙන දෙසින්

37. බෝසත් සිතට බාධා ඇති නොවන්නට
ගස්වැල් උනා නොසැලී නිදියා ගන්ට
රැහැයියනගෙ හඬ අද නැහැ අසන්නට
සතුන් නිහඬ වී සිටියා දුරින් සිට

38. අනත් සසර පිරූ පෙරුමන් බලය ඇති
බුදු බව සඳහ පිරූ සත්තිස් දහම් ඇති
අද දින බුදු ව සැන සෙන්නට විරිය ඇති
බෝසත් වඩන්නේ ආනාපාන සති

39. බෝසත් ලබා එමගින් සිවුවන දැහැන
රෑ මැදියමට පෙර යුතුව ම සිහි නුවණ
ලැබුවේ පෙර විසූ බව දක්නා නුවණ
සිරුරින් නිකුත් විය එතකොට මුදු කිරණ

40. ඉන් නොනැවතී තව තව වීරිය කෙරුවා
රෑ මැදියමේ දී තව නුවණක් ලැබුවා
කම් පල ලෙසින් චුති සහ උපත ද දුටුවා
සසරෙහි තිබෙන බියකරු බව තව දුටුවා

41. මැදියම ගෙවී රෑ තුන්වන යම ලැබුවා
මහසත් තව තවත් සිත වීරිය වැඩුවා
සංඛත දහම් සියලුම නුවණින් දුටුවා
අනියත දුක් අනත් බව ඒ තුළ වූ වා



DampeTheroKaviBook_Content_20180804.indd 75 2018/8/4 8:46 AM

42. හේතු රැසක් එක් වී පල හට ගන්නා
සංසාරේ දුක ද එනයින් ඇති වෙන්නා
අවිදු අඳුර සංසාරෙට මුල් වෙන්නා
තණ්හා දොස් මුලා ඒ පසු පස එන්නා

43. මෙලෙසින් මහ සතුන් සසරෙහි දුක දුටුවා
දුක ඇතිවෙන්න හේතු ද මැනවින් දුටුවා
නසලා හේතු දුක නැති කළ යුතු වෙනවා
දුක නැති කරන මග මොනවා දැයි දුටුවා

44. හේතුපල ද සහ සිවුසස් දම් ලෙසින
සසර ගමන පිළිබඳ ලබලා නුවණ
ලබා කෙලෙස් මළ සුන් කළ යුතු නුවණ
උතුම් ලොව්තුරා සම්බුදු බව ලැබිණ

45. වෙසක් සඳේ සිසිල අරන් සුළඟ හමනවා
ගස්වැල්වල මල් පිපිලා සිනා නගනවා
බෝපත්වල සිලි සිලි නද ගත දැවටෙනවා
විහඟුන්ගේ ගී නද දස දිග පැතිරෙනවා

46. මැඩියන් නයි පොළඟුන්ගේ දරණෙ නිදන්නේ
මොනරුන්ගේ පිල් සෙවණේ නයි ගැවසෙන්නේ
සිහ රජගේ තුරුලට වී මුවන් නටන්නේ
කරුණාවේ සීතල දිය දසත ගලන්නේ

47. බුදු බව ලබා සමවත් සුව විඳිමින්නේ
පළමු සතිය බෝරුක මුල වැඩ ඉන්නේ
මිතුරකු ලෙසින් බුදුවන විට ළඟ උන්නේ
බෝරුක දෙස සතියක් බලමින් උන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 76 2018/8/4 8:46 AM

48. බුදුහිමි තවම බෝරුක මුල සිටි බැවිනේ
දෙවියන් සිතේ සැක සංකා ඇති වන්නේ
තුන්වෙනි සතිය උන්ගේ සැක දුරලන්නේ
රුවන් සක්මනෙහි පෙළහර පාමින්නේ

49. රුවන් ගෙයක් මවලා එහි වැඩ ඉන්නේ
අවබෝධයට පත් දහමය විමසන්නේ
බුදු සිරුරෙන් රැස්මාලා නික්මෙන්නේ
සිවුවන සතිය මෙලෙසින් ගත වී යන්නේ

50. පස්වන සතිය තරමක් එපිට ට යන්නේ
අජපල් නම් නුගරුක මුල වැඩ ඉන්නේ
තණ්හා රති රගා එහි සිට නටමින්නේ
අවසන පැරද ලජ්ජාවෙන් පැන යන්නේ

51. ඉන් නැගිටලා මුචලිඳු විල වෙත එන්නේ
එතැනදි මහා වරුසාවකි ඇද හැලුනේ
මුචලිඳු නා රජුන් සෙවනක් ලෙස උන්නේ
හයවැනි සතිය එම සෙවනෙහි ගත වෙන්නේ

52. රාජායතන කිරිපලු රුක වෙත වැඩියේ
හත්වැනි සතිය එහි මුල දී වැඩ සිටියේ
තපස්සු සහ භල්ලුක සොයුරන් ආයේ
විළඳත් මී පිඬුත් දානය ලෙස පිදුයේ

53. දන් පිළිගන්න බඳුනක් අත නැති බැව්ණි
දෙවියන් පිදූ බඳුනට දන් පිරිනැමුණි
සොහොයුරු දෙපල බුදු දම් සරණය ගැනුණි
සොයුරන් දෙපල හට මහ ලාභයක් වුණි



DampeTheroKaviBook_Content_20180804.indd 77 2018/8/4 8:46 AM

54. කප් සිය දහසක් ගෙවලා පාරමිතා පිරුවෙමි මම
අනත් සසර දුක් විඳලා නිවන සොයා ආවෙමි මම
වෙසක් දිනේ විරිය වඩා බුදු පදවිය ලැබුවෙමි මම
නුවණැත්තන් දත යුතු ඒ දහම කාට කියම් ද මම

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**බුදුබව නම් වූ සත්වන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 78 2018/8/4 8:46 AM

අටවන සර්ගය

# දහම් දෙසීම

1. මා දත් දහම පස ඉඳුරන් ගොදුරු නොවයි
ඉඳුරන් පිනන කාමී දන නො දත හැකියි
සියලු දෙන ම ලොව ඉඳුරන් පිනනු රුචියි
එබැවින් දහම් නො දෙසන්නේ නම් හොඳ වෙයි

2. බුදු හිමි සිතු දෙය මහබඹු දැන ගත්තා
ඇවිත් බුදු හිමිගෙ අවසර අර ගත්තා
වැඳගෙන එකත් පසෙකට වී ඉඳ ගත්තා
උපමාවකින් කරුණක් කියනට ගත්තා

3. විල්වල බොහෝ ලෙස පියුමන් හට ගන්නා
සමහර කැකුළු හිරු කිරණට පිබිදෙන්නා
තව බොහො කැකුළු අද නො පිපී හෙට පිපෙනා
ඇතැම් කැකුළු දිය යට දී කුණු වෙන්නා

4. හිමි ඔබෙ දහම හිරු එළියයි ලොව තිබෙන
එය දත හැකි පිරිස බොහො වෙති නැණ තිබෙන
දෙසතොත් දහම ඔවුනට හිමි වෙයි නිවන
එබැවින් දෙසනු මැන හිමියනි මග නිවෙන

5. ඇරයුම සහම්පතිගේ හිමි පිළිගත්තා
දහම දකින අය ඇති බව දැන ගත්තා
එබැවින් දහම් දෙසුමට හිමි සිත ගත්තා
කාටද කියා දිය යුතු වූ නුවණැත්තා

6. ආළාරගෙ නුවණ මෝරා තිබෙන්නේ
ඔහු මෙය වහා අවබෝධය ලබන්නේ
කොතැන ද බලයි මේ මොහොතේ සිටින්නේ
පරලොව ගිහින් බඹ ලොව දැන් සිටින්නේ

7. දෙසුවොත් දහම යම් හෙයකින් උද්දකට
හැකිවෙයි ඔහු ද අවබෝධය ලබන්නට
කොහේ සිටියි දැයි සොයලා බැලු කලට
දුටුවා පෙර දිනයෙ බඹලොව වැඩි බවට

8. බෝ මැඩ ගයා හිස වීරිය කරන කල
උපකාරීව සිටි හිතවත් තපස් කැළ
අවබෝධය ලබති සදහම් දෙසුව කල
එබැවින් ඔවුන් කොහි වෙත් දැයි බැලුව කල

9. මෙයින් උතුරු දෙස වූ බරණැස් පුරයේ
ඉසිවරු නිතර රැස්වන තැන මිගදායේ
ඔවුන් සිටිති වෙර වඩමින් දිවා රැයේ
එබැවින් දැන් ම යා යුතු වෙයි මිගදායේ

10. ඇසළ පුර සඳ පිරී එන සඳ
බුදු රදුන් බරණැස වඩින සඳ
නව පණක් ලැබු කලෙක මෙන් සොඳ
හාත්පස සතුටින් පිරෙයි අද

11. කුඹුරු කිරිවැද පැසී ඇත අද
නැමී හිමිදෙස සිටින්නේ වැඳ
ගලා බසිනා නදියෙ දිය කඳ
සිසිල් පවනක් ගෙනෙයි මද



DampeTheroKaviBook_Content_20180804.indd 80 2018/8/4 8:46 AM

12. තිත් මුවන් කැල සරණ වන මැද
වනෙහි අසිරිය වැඩි කරයි අද
කුළු හරක් දඟ කරන වන මැද
පෙහෙව ගෙන මෙන් සිටිති දින අද

13. මග දිග මෙවන් සිරි විඳිමින් වඩින්නේ
මග දී උපක ආජීවක දකින්නේ
නිකෙලෙස් බුදුන් දුටු ඔහු ගරු කරන්නේ
මෙවැනි දෙයක් ඔහු එහිදී අසන්නේ

14. සබඳ ඔබගෙ ඉඳුරන් පැහැදිලි වෙන්නේ
සිරුරේ කැලුම් පැහැයෙන් දිලෙන්නේ
කෙලෙසුන් නිවූ කෙනෙකුන් ලෙස පෙනෙන්නේ
කවරෙකු නිසා ඔබ පිළිවෙත් පුරන්නේ

15. කවරකු නිසා නොම පිළිවෙත් පුරන්නෙමි
ඇදුරකු නොමැති බව මට මම කියන්නෙමි
තනිව ම කෙලෙස් නසනා මග බැස ගියෙමි
දම්සක් පවත් වන්නට බරණැසට යමි

16. උපකට නොමැත එහි තේරුම වැටහෙන්නේ
එහෙමත් විය හැකිය පවසා පිටවෙන්නේ
බුදුහිමි මිගදාය වෙත දැන් වැඩමන්නේ
තවුසන් පස්දෙනා දුරදී දැකගන්නේ

17. රස මසවුලෙන් තම බඩ කට පිරවූවා
දුක් පිළිවෙත් අතැර ඉඳුරන් පිනවූවා
නිවන ලබන මග ඔහුගෙන් දුර වූවා
ඔහු එය නොලබා ම අප වෙත යළි එනවා



DampeTheroKaviBook_Content_20180804.indd 81 2018/8/4 8:46 AM

18. දෙපා දොවන්නට උණු පැන් නොම ගෙනෙමු
පෙර මග ගොසින් පා සිවුරු ද නො ගන්නෙමු
කුලයෙන් උසස් හින්දා ගරු කරන්නෙමු
එබැවින් හිඳින්නට අසුනක් තබන්නෙමු

19. බුදු හිමි මිගදායෙ දොරටුව වෙත ආවා
අයෙක් දෙපා දොවනට පැන් ගෙන ආවා
අයෙක් පෙරමගට ගොස් පිළිගෙන ආවා
කතිකා ලෙසට කිසිවක් නොම සිදු වූ වා

20. දෙපා දොවා බුදු හිමි ඇතුලට වැඩියේ
පැන වූ අසුන හිඳ සුවදුක් විමසූයේ
"ඇවැත්නි" කියාලා බුදු හිමි ඇමතූයේ
එබැවින් තමන්ගේ බුදු බව පැවසූයේ

21. තෙවරක් මෙසේ එය පැහැදිලි කරන්නේ
එහෙත් ඔවුන් නැහැ එය පිළි අරගන්නේ
අවසන බුදු සමිඳු පැනයක් විමසන්නේ
තවුසන් එයින් පසුවයි එය පිළි ගන්නේ

22. "පෙර දින ගයාහිස සිටි කල මතකයි ද?
එම කල මෙසේ මා ඔබලට පැවසී ද?
බොරුවෙන් කිසි දිනක ඔබලා රැවටීද?
නොලැබූ මගපලක් පිළිබඳ පැවසී ද?

23. බුදු හිමි දෙපා මුල ඒ හැම වැඳ වැටිලා
සිදු වූ වරද පිළිගත්තේ බැගෑ වෙලා
බුදු හිමි සියලු දේ ඔවුනගෙ කමා කළා
දම්සක් සුතුර ඉන්පසු දේශනා කළා



DampeTheroKaviBook_Content_20180804.indd 82 2018/8/4 8:46 AM

24. මහණෙනි! යමෙකු සිතුවෙද දුක් නසන්නට
දෙකක් අන්ත හල යුතු වෙයි පෙර ඊට
කම්සැප විඳියි දැඩි සැප දීලා කයට
දැඩි ලෙස පෙළා දුක් දීම ද තම කයට

25. කම් සැප විඳීමේ අන්තය අතහැරලා
දැඩි දුක් විඳීමේ අන්තය අතහැරලා
මෙකී අන්ත දෙක අතහැරලා දමලා
නිවන් ලබන හැක මැද පිළිවෙත් පුරලා

26. ඉපදුම දුකය වයසට යාම ද දුකය
ලෙඩ වී දුක් විඳීමත් මරණය යන දුකය
තමා කැමති දේ නොලැබෙන විට දුකය
අකමැති දෙයක් ලද විට වෙන්නෙද දුකය

27. ලබා තිබෙන පස්කඳ බෙහෙවින් දුකය
තණ්හා මුල්වෙලා ඇති වෙන්නේ දුකය
තණ්හා නැසූ විට නැති වෙන්නේ දුකය
පිළිවෙත් මගෙහි ගොස් නැති කළ යුතු දුකය

28. නිවැරදි වදන් කම් හා දිවි පෙරටු කොට
නිවැරදි විරිය සිහි සමාධි ඇතුලු කොට
නිවැරදි දැකුම් සංකල්පද අංග අට
ඇති මැද මාවතෙන් හැකි දුක නසන්නට

29. දුක ගැන දනිමි එය ඇති බව මම දනිමි
අවබෝධයත් එය පිළිබඳ ලැබ ගතිමි
දුකට හේතු වූ තණ්හා බව දනිමි
නැති කළ යුතු බැවින් මම එය නැති කළෙමි



DampeTheroKaviBook_Content_20180804.indd 83 2018/8/4 8:46 AM

30. දුකෙන් මිදීමක් තිබෙනා බව    දනිමි
අවබෝධයෙන් දත යුත්තෙන් එය    කළෙමි
දුකෙන් මිදෙන මාවත ගැන දැන    ගතිමි
වැඩිය යුතු ව තිබු ඒ මාවත    වැඩිමි

31. මෙසේ දොළොස් ආකාරයකින්    යුත්තේ
සිවුසස් දහම පිළිබඳ දැන ගත    යුත්තේ
දැනගත් බැවින් මම එය දැන් සැක    නැත්තේ
ඉපදීමක් නොවෙයි මා හට මින්    මත්තේ

32. පළමු දෙසුම මේ ලෙස නිම    කරන්නේ
කොණ්ඩඤ්ඤයි පළමුව පල    ලබන්නේ
සියලු දෙනා බුදුහිමියන්    වෙතින්නේ
පැවිද්ද හා උපසපුව ද    ලබන්නේ

33. සුපිපුණු සුදු නෙළුම් බඳුනක් සේ    දිලෙන
සුදු සඳ පායලා අහසේ    බබලමින
කප් සුවහස් ගණන් නො අසන්නට    ලැබෙන
දහමේ සිසිල මැනවින් විඳගත් සෙ    වින

34. දෙව් බඹ සුර නරන් හැම දෙන තුටු    වෙනවා
සාදු කාර හඬ තුන් ලොව නද    දෙනවා
ප්‍රඥාවේ ආලෝකය    පැතිරෙනවා
දුකෙන් මිදෙන මග ලොවට ම එළි    වෙනවා

35. පසු දින නැවත මහණුන් මුන    ගැසෙන්නේ
අනත් ලකුණු පිළිබඳ බණ    කියන්නේ
ආත්මයේ පලනැති බව    දකින්නේ
නිවනෙහි මගට සිලුම දෙන    බසින්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 84 2018/8/4 8:46 AM

36. ඇසළ මස සිටන් මහ වැසි ඇද හැලෙනා
එබැවින් පළමු වස මිගදායෙ ම වසනා
මහණුන් පස්දෙනා දින දින රහත් උනා
රහත් සයනමක් දැන් මුළු ලොව වසනා

37. බරණැස් සිටුගෙ පුත් යස කුල නුවණැති වේ
සම්පත්වලින් දුකමයි ඔහු නම් දුටුවේ
ඒ දුක් නිවන මගකුයි සොයනට සිතුවේ
එනිසා මහ රැක සිය මැදුරෙන් පිටවේ

38. මග දිග ඇවිද දුක නිවනට මග සොයනා
ඉසිපතනයේ මිගදායට පැමිණෙන්නා
බුදු හිමි දෙසූ දහමෙන් සිත සනසන්නා
පළමු පලය එහි දී ඔහු ලැබ ගන්නා

39. යස අද ගෙදර නැති බව නිවැසියො දුටවා
කළබල වෙලා හැම දෙසක ම යස සෙවුවා
සිටුතුම පුතුගෙ මිරිවැඩි සලකුණු සෙවුවා
පන්සල් දොර දි මිරිවැඩි ඇති බව දුටුවා

40. තම පුතු සොයා සිටුවරයා එහි යනවා
බුදු හිමි දෙසූ සදහම් එහි දී ඇසුවා
එය'සා සිටිය යස කෙලෙසුන් සුන් කෙරුවා
බරණැස් සිටුද නිවනේ මාවත දුටුවා

41. දහවල් දනට ආරාධන ලැබ ගන්නේ
බුදු පාමොක් සඟන මැදුරට වැඩමන්නේ
දන් වළඳලා හිමි සදහම් පවසන්නේ
යසගේ මවත් බිරිඳත් පල ලැබගන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 85 2018/8/4 8:46 AM

42. යසකුල පුතා බුදු හිමි දෙසු මගෙහි ගියා
යසගේ පවුලෙ අය තෙරුවන් සරණ ගියා
යසගේ යහළුවෝ බුදු හිමි සොයා ගියා
ඒ හැම දෙන ද නිවනෙහි මග බැස වැඩියා

43. පස්වග මහණු සහ යස කුල හය නම කී
යහලු පනස් හතරකි සැම සැට නම කී
බුදු හිමි සමඟ රහතුන් සැට ඒක් නම කී
දම් බෙර වයන්නට හැම තැන යන්න හැකී

44. මේ ලෙස කෙමෙන් පළවෙනි වස නිමා වුනා
දහම් දෙසන්නට යන කල උදා වුනා
පුහුදුන් සියලු දෙන දුකටම යන බැව්ණා
අමතා සැට නමට මේ ලෙස දෙසනු වුනා

45. අප සැම දෙන ම දුක නිවනා මග සෙවුවා
එබැවින් අපට නිවනෙනි සැප අත් වූ වා
මැනවින් මිදුණු අප කළ යුතු දෙය කෙරුවා
අන් සැම දෙනට මේ මග කිය යුතු වෙනවා

46. එබැවින් සියලු දෙන සැම තැන යා යුතු ය
නිවනට පාර හැමට ම පෙන් විය යුතු ය
දෙදෙනෙකු එක ම මග නම් නොම යා යුතු ය
මුල මැද අග මනා සදහම කිය යුතු ය

47. මෙසේ පළමු හැට නම පිට කර හැරියා
බුදුහිමි තනිව රජගහ යන්නට වැඩියා
මග දී සිංසපා වනයෙහි වැඩ සිටියා
කුමරුන් භද්දවග්ගිය වනයෙහි සිටියා



DampeTheroKaviBook_Content_20180804.indd 86 2018/8/4 8:46 AM

48. කෙලිකම් පිණිස ආ කුමරුන් තිස් දෙනෙකී
බිරිඳක් සමග ආවේ විසි නව දෙනෙකී
එකෙකුට නැතිව බිරිඳක් යන්නට නොහැකී
මුදලට සොයා ගත්තේ වෙන තරුණියකී

49. ඔවුන් සමඟ කෙළිමින් සිටිනා අතරේ
අත පසු බවක් දැකලා කුමරුන් අතරේ
අබරණ මුදල් සොරකම් කර යන අතරේ
ඔවුහු ඇයව සොමින් යති වනන්තරේ

50. ඇය ව මෙසේ සොයමින් හැම දෙන යන්නේ
යන අතරෙ දී බුදුහිමියන් හමු වෙන්නේ
හිමිගෙන් ඔවුන් තරුණිය ගැන අසමින්නේ
හිමියනි! තරුණියක දුටුවෙද විමසන්නේ

51. කුමටද අනුන් ගැන සොයමින් තැවෙන්නේ
තමන් ගැන කිම ද නො සොයා සිටින්නේ
තමන් සොයන එකමයි ලොව වටින්නේ
අනුනගෙ දේ සොයා දුකමයි විඳින්නේ

52. සැම දෙන කියූ දෙය මැනවින් දැන ගත්තා
තමන් කවුරුදැයි විමසීමට ගත්තා
එයින් දුකෙන් මිදෙනා හැටි දැන ගත්තා
නිවන ද පැවිදි බව එහි දී ලැබ ගත්තා

53. ඒ හැම දෙන ද පිට කර හැර පෙර ලෙසට
බුදු හිමි වඩී නැවතත් රජ ගහ දෙසට
අතර මග දි වැඩියා උරුවෙල් ගමට
එහි දී හැකි උනා ජටිලන් දමනයට



DampeTheroKaviBook_Content_20180804.indd 87 2018/8/4 8:46 AM

54. උරුවෙල් කසුප් සහ ඔහු සොයුරන් දෙදෙනා
ගංතෙර විසී වෙන වෙන පන්සල් කරනා
උරුවෙල් කසුප් එයතර වැඩිමල් වෙන්නා
එලෙස ම මහා මානයකින් පසු වෙන්නා

55. බුදු හිමි වඩින්නේ ඔහුගේ අසපුවට
ගිනිහල් ගෙයයි දෙන්නේ රෑ වාසයට
විසකුරු නාගයෙක් එහි හිමි නසන්නට
නාගය දමා පෙන්වූ වේ කස්සපට

56. නාගය දමන්නට හැකි මොහු බලවතෙකි
ධ්‍යාන ද ලබා ඇති මොහු නම් ඉසි කෙනෙකි
රහත් බවට පත් වී නම් නැති සෙයකි
මටත් වඩා රහතෙකු නම් විය නොහැකි

57. ඔහු සිත මෙවන් මානයකින් පෙලෙන්නා
බුදු හිමි ඔහුගෙ සිත මැනවින් දකින්නා
අවසන ඔහුගෙ මන් බිඳලා දමන්නා
දහම් අසා ඔහු හැම දුක් නසන්නා

58. ඔහුගේ දෙවැනි සොහොයුරු ගඟ පහළ සිටී
නදී කසුප් ලෙස එහි නම් දරා සිටී
ගඟ දිය ගසා යන පිරිකර බලා සිටී
සිතයි සොයුරු කරදරයක වැටී සිටී

59. ඔහු පැමිණියා තම සොහොයුරු සොයා ගෙන
දුටුවා සොයුරු ඇති බව බුදු මග රැගෙන
බුදු හිමි මගේ සොයුරා දැන් රවට ගෙන
බනිනට සිතා යයි බුදු හිමි සොයා ගෙන



DampeTheroKaviBook_Content_20180804.indd 88 2018/8/4 8:46 AM

60. බනිනට සිතා ගිය ඔහු බණ අසන්නේ
කෙලෙසුන් නසා නිවනෙහි සැප විඳින්නේ
තම සිසු පිරිස සමගින් හිමි වෙතින්නේ
උතුම් පැවිදි බව එහි දී ලබන්නේ

61. බාල සොයුරු දැක ගඟ පහළ ම සිටින
දුටුවා සොයුරන්ගෙ පිරිකර පාව යන
ඔහු ද ගියා තම සොයුරන් සොයා ගෙන
දුටුවා ඔවුන් හිමි ලග පැවිදි ව සිටින

62. බුදු හිමි ලඟදි දෙසු දම් පද අසාලා
පිරිස ද සමග සියලු ම දුක් නිවාලා
හිමි වෙත පැවිදි උපසපුව ද ලබාලා
සිටිනට උනා හිමි ළඟ වැඳ වැටීලා

63. තුන් බෑ ජටිල සොයුරන් හට මග දෙසලා
ඒ හැම දෙනට නිවනෙහි රස ලැබ දීලා
ඒ හැම සමඟ රජගහ යන මග බැසලා
බුදු හිමි වඩී රජගහ පුරවර බලලා

64. තරු පිරිවරාගෙන නැග එන සඳක් වගෙයි
පියුම් විල ම පුබුදන දිනකර වාගෙයි
පැටවුන් සමග පිහිනන හංසයෙක් වගෙයි
සවුවන් පිරිවරා වඩිනා ගමන අගෙයි

65. කපිලවස්තු මහ රජුගේ එක ම පුතා
රජ සැප අතැර ආවේ බුදු බව ම පතා
දහම් දෙසයි සතුනගෙ දුක් නැසුම සිතා
මෙලෙසින් පතල වූ යේ හිමි ගැනයි කතා



DampeTheroKaviBook_Content_20180804.indd 89 2018/8/4 8:46 AM

66. දිගුමග ගෙවා බුදුහිමි රජ ගහ වැඩියා
ඒ ගැන සියලු තොරතුරු රජු වෙතට ගියා
හිමි වැඩ සිටියෙ රජගහ උණ වනයෙ කියා
රජු සහ පිරිස බුදු හිමි දැක ගන්න ගියා

67. රන්වන් පාට කැලුමෙන් දිස්නය දුන්න
සුදු පුන් සඳක් සේ බැබලී වැඩ ඉන්න
දුටු රජතුමා විය සතුටෙන් ඉපිලෙන්න
රජු වැඳ වැටෙයි සතුටට බැරි ඉවසන්න

68. බුදු හිමි රජු සමඟ පිරිසට දම් දෙසුවා
බිම්බිසාර රජු සෝවන් පල ලැබුවා
රජ මැදුරෙහි දනට වඩිනා ලෙස කිවුවා
බුදු හිමි නිහඬ වී ඇරයුම ඉවසූවා

69. දන් පැන් පුදා රජු බෙහෙවින් තුටු වෙනවා
වේළුවනය බුදු සසුනට පුද දෙනවා
රජගහ පුරදි තව තව සඳහම් දෙසුවා
බොහෝ දෙනෙකු නිවනෙහි ඇති සැප දුටුවා

70. බුදු හිමි මෙසේ රජගහ වැඩ සිටින කල
දෙදෙනෙක් සිටිති මිතුරන් ලෙස බොහෝ කල
නැටුමක් බලා කල කිරිලා සිටින කල
දුකෙන් මිදීමට පිහිටක් සොයන කල

71. කෝලිත උපතිස්ස නම් යාළුවො දෙන්නා
දුක නිවනට මගක් සොයමින් ඇවිදින්නා
සංජය ඇසුරෙ ටික දිනයක් නවතින්නා
එතැනින් කිසිදු සැනසීමක් නො දකින්නා



DampeTheroKaviBook_Content_20180804.indd 90 2018/8/4 8:46 AM

72. එතැනින් පිටත් වූ මේ යහළුවො දෙන්නා
නිවන සොයා වෙන වෙන ඇවිදන් යන්නා
කෙනෙක් පළමු දත හොත් මග දුක නිවනා
අනෙකා සොයා කිව යුතු සම්මුති වන්නා

73. මෙලෙසින් ඔවුන් කතිකාවත් කර ගන්නේ
දෙමගක පිවිස දෙදෙනා පිට වී යන්නේ
අස්සජි සමිඳු එවෙලේ පිඬු සිඟ යන්නේ
උපතිස්සටයි එම සමිඳුන් හමු වෙන්නේ

74. සංසුන් ගමන ඉඳුරන් පැහැදිලි වෙන්නේ
නිකෙලෙස් වුවන දුටු දුටුවන් පැහැදෙන්නේ
පිඬු සිඟ වඩින හිමි හා යා යුතු වෙන්නේ
නිසැකව සමිඳු නිවනට මාවත දන්නේ

75. පිඬු සිඟ වැඩිය හිමි රුක් මුල වැඩ ඉන්නේ
සන්සුන් ලෙසින් දන් වළඳා නිම වෙන්නේ
හිමි වැඳ එකත් පස සිට ගෙන විමසන්නේ
කාගේ දහමක ද නිවනින් සැනසෙන්නේ

76. මම මේ දහම තුළ නවකයි දන්නවද
සුදොවුන් පුත් සිදුහත් ඔබ දන්නවද
කෙලෙසුන් නසා බුදු වූ බව දන්නවද
බුදු හිමි දහම නිවනට මග දන්නවද

77. හේතු රැසක් වී සැම දෙය හට ගන්නේ
එ සැම හේතු බුදුහිමියන් පවසන්නේ
හේතු නැසුව විට හැම දෙය නැති වෙන්නේ
දහමේ හරය මෙය බව ඔබ දැන ගන්නේ

78. එ ගය අසා නිවනෙහි මග පිළිපන්නා
බුදු හිමි සිටින තැන විමසා දැන ගන්නා
මිතුරා හමුව ඔහුට ද කිය යුතු වෙන්නා
එබැවින් හමුව මිතුරාට ද පවසන්නා

79. පිරිසක් සමඟ බුදුහිමි සොයලා යන්නා
දුරසිට ඔවුන් බුදුහිමියන් නෙත ගැටුනා
අගසවු වෙන්න පෙර පින් කළ බව දන්නා
බුදු හිමි නිවන්මග ඔවුනට පවසන්නා

80. පිරිසක් සමඟ ආ මේ යාලුවො දෙන්නා
දහම් අසා නිවනෙහි සැනසුම ලබනා
සසුනේ උතුම් අගසවු පදවි ද ලබනා
බුදු හිමි ලෙසට දම් දෙසනට හැකි වෙන්නා

81. ලබා බුදු බව දෙසූ දම් කඳ ලොවෙහි දස දිග යයි ගලා
කලා සපිරෙන සඳක් විලසට දිනෙන් දින ලොව එලි කළා
මුලා වූ දන මුදා අඳුරෙන් අවිදු මොහඳුර නැති කළා
අසා බුදු බණ නිවන් ලැබූ දන සසර දුක් කඳ නිම කළා

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**දහම් දෙසීම නම් වූ අටවන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 92 2018/8/4 8:46 AM

## නවවන සර්ගය

# කිඹුල්වත් ගමන

1. මැදුරෙන් පිටව ගිය දා සිට තම පුතණු
යෙදවිය සෙබලු පුතු ගැන සොයනට කරුණු
මහරජු දැන ගනී පුතු බුදු වූ කරුණු
සිත් විය බුදු සමිඳු නුවරට වඩමවනු

2. දූතයො යවයි ආරාධන කරවන්න
ඒ හැම ගොසින් විය බුදු හිමි මග ගන්න
රජුගේ පණිවිඩය දුන්නේ නැති බැවිණ
දහවැනි වරට තව කෙනෙකුන් එහි යැවිණ

3. කාලුදායි ගොස් බුදුහිමි හමු වෙන්න
කිරි මව නො ඉවසිල්ලෙන් බව පවසන්න
බලාපොරොත්තුවෙ තාපය දැරී මෙන
පියුමක් සේ මුකුලිත වී ඇත වුවන

4. කහවත් දරා රළු අහරින් කුස පුරන
අබරණ රන් රිදී කිසිවක් නො පළඳින
සෝකය සතුට හා මුසු සියුමැලි වුවන
යසෝදරාගේ සෝකය දුර ලන්න

5. සත්වස පිරෙන්නට මග බලමින් ඉන්න
කැකුළු සිනාවෙන් හදවත් සනසවන
දුව පැන නටා ඇඟ දූවිලි තවර ගෙන
සිටිනා රහල් පුතු දක්නට පැමිණෙන්න

6. සක්විති පුතකු දක්නට පෙරුමන් පිරුවා
එනමුත් බුදු පුතකු දකිනට පින් පිරුවා
පියතුම දෙනෙත් දල්වා ගෙන මග බැලුවා
සිටිනා අයුරු වහ වහ ගොස් පවසනවා

7. මහ රජ තුමනි මට හැක රජ ගහ යන්න
හැකිවෙයි බුදු සමිඳු නුවරට වඩමන්න
හැකි නම් පැවිදි වෙන්නට අවසර දෙන්න
මට හැක ඔබ ගෙ අදහස ඉටුකර දෙන්න

8. පුතු දකිනට නො නිමි ආසා මට ඇත්තේ
ඔබගෙ ද පැතුම එ ලෙසට ඉටු විය යුත්තේ
රජගහ බලා ඔබ දැන් පිට විය යුත්තේ
බුදුහිමි සමග නැවතත් මෙහි ආ යුත්තේ

9. දහසක් පිරිස ගෙන රජගහ පුර යනවා
වේළුවනයෙදී බුදුහිමි හමු වෙනවා
සදහම් අසා ඔහු අරහත් පල ලැබුවා
උත්තම පැවිදි බව බුදුහිමි ලග ලැබුවා

10. පැවිදි ව මෙසේ ටික දවසක් ගතව ගියා
ඇරයුම සඳහා ඔහු කල් බලමින් සිටියා
පොළොව මැදින් සඳ කිරණින් තෙමී ගියා
ඇරයුම් කරන්නට බුදුහිමි වෙතට ගියා

11. ලොව නිදන හේමන්ත කල නිමා වී ගියා
දාහයෙන් ගත දවන කල නුදුරෙ එයි කියා
වසන්තය උදා වී මලින් පිරිලා ගියා
කිඹුල්වත් පුර යන්න සුදුසු කල පැමිණියා



DampeTheroKaviBook_Content_20180804.indd 94 2018/8/4 8:46 AM

12. තුරුලතා අලුත් වී ලපලු හිනැහී නටයි
කැකුළු මල් සිනාසී සුවඳ හැම තැන හමයි
මග දෙපස තුරුලතා වසන්තයෙ පල දරයි
කිඹුල්වත් පුර යන්න සුදුසු කාලය මෙයයි

13. හේමන්ත කල ගෙවී තව බොහෝ කල් නොවෙයි
ගත දවන ගිමන් කල තව බොහෝ කල් නොවෙයි
සිසිල උණුසුම දෙක ම සම සම ව සුව ගෙනෙයි
කිඹුල්වත් පුර යන්න සුදුසු කාලය මෙයයි

14. සීසාන ගොවිදනා පල දකිනු කැමති වෙයි
සයුරෙ යන වෙළඳ දන දන ලබනු කැමති වෙයි
බුදුන් පිය මහ රජුන් පුතු දකිනු කැමති වෙයි
කිඹුල්වත් පුර යන්න සුදුසු කාලය මෙයයි

15. වීරයෙක් ඉපදිලා දුක නිවන මග කියයි
ලොවෙහි පල කරන්නේ කැත් කුලෙහි අබිමනයි
බුදුන් මුව දකින්නට නෑසියන් මග බලයි
කිඹුල්වත් පුර යන්න සුදුසු කාලය මෙයයි

16. සුද්ධෝදන පිය රජතුම ඔබ දකින්න රිසිව සිටියි
ප්‍රජාපතී කිරිමව් ඔබෙ පුතු සෙනෙහෙන් බලා සිටියි
යසෝදරා පිය දේවිය ඉවසිල්ලෙන් තොරව සිටියි
රාහුල පුතු සනසවන්න හිමි එහි යා යුතු ව තිබෙයි

17. කාලුදායි හිමිගේ මග වැනුම් අසා
වෙහෙසක් නැතිව ගමනට කල් සුදුසු නිසා
මව්පිය නෑසියන් බලමින් සිටින නිසා
පිටත් උනා නෑසිය දුක් නසනු නිසා



DampeTheroKaviBook_Content_20180804.indd 95 2018/8/4 8:46 AM

18. මැදින් පෝදා පිටත් වීලා කිඹුල්වතටයි වඩින්නේ
වෙසක් පුර සඳ නැගී එන සඳ කිඹුල්වත වෙත වඩින්නේ
බුදුන් කිතු ගොස රාව පැතිරී දනෝ මග දිග රැඳෙන්නේ
තිලෝ හිමිගේ අසිරිමත් බව දෑස් දල්වා බලන්නේ

19. බුදුහිමි පුදනු වස් සුපිපුණු මල් මාලා
මහ මග දෙපස සරසන්නට ඇත එල්ලා
හිමි වෙත සැදැහැ සිත් පෙරටුව වැඳ වැටිලා
පුරවැසි දන සිටී මහ මග රැස් වීලා

20. බුදු හිමි දෙසු දහම් අසා සියලු දෙනා පිට වෙන්නේ
පසුදා දානය දෙන්නට කාටත් නැහැ සිහි වෙන්නේ
පාත්තරය අතට රැගෙන ගෙන් ගෙට පිඩු සිඟමින්නේ
බුදුසව්වන් පිරිවරමින් ඇතුළු නුවර හැසිරෙන්නේ

21. මේ දුටු කෙනෙක් රජ මැදුරට දුව යන්නේ
රජු හට සියලු සිදු වූ දෙය පවසන්නේ
"පිරිවර සමඟ සෝබාවෙන් බබලන්නේ
යුවරජු ගෙයින් ගෙට අද සිඟමන් යන්නේ

22. මහරජු මෙයින් කලබලයට පත් වෙන්නේ
සඳළු තලෙහි සිට සියැසින් බලමින්නේ
කලබල වෙලා මහ මග වෙත දුවයන්නේ
බුදුපුත් හමුව මේ ලෙසටයි පවසන්නේ

23. "කැත් කුල දහම රට දැය රැක්ම ම වෙන්නේ
රටවැසි සැවො ම නිරතුරු බුහුමන් දෙන්නේ
උත්තම කුලයකයි ඔබ ඉපදී ඉන්නේ
සිඟමන් යැදුම අප කුලයට නො වටින්නේ

24. "කැත්කුල දනා සිඟමන් නො යැදිය		යුතු ය
ඔබ වංසයෙහි සිරිතකි එය දත		යුතු ය
මාගේ වංසයෙහි සිඟමන් යා		යුතු ය
එය බුදු සසුන බව මහ රජ දත		යුතු ය

25. එහි දී බුදුන් දෙසූ ලොව්තුරු දහම්		අසා
පළමු පලය ලදි බැඳුමන් තුනක්		නසා
සතුටින් යුතු ව රජු කළ ඇරයුමක්		නිසා
මැදුරට වඩී දන් වළඳන්නට		සකසා

26. සෙනෙහෙ යුතු ව මහරජු හිමි		පිළිගන්නේ
කිරිමව් සෙනෙහෙ තව තව දළු ලා		එන්නේ
මුළු රජ මැදුර සතුටින් ඉපිළි		යන්නේ
සසෝදරා පමණක් නැහැ එහි		එන්නේ

27. හිමි ඔබ නිසා මම තනිමව වත්		පිරුවා
ඔබ හැර වෙනත් සැමියෙක් නම් නොම		පැතුවා
කිසි දින නොගත්තෙමි මම පතිවත්		බිඳුවා
ඔබ වෙත සදාකල් මගෙ සෙනෙහස		පිදුවා

28. පුතු සිත තුළ ද පියතුම විරුවෙක්		කෙරුවා
කිසි දින දොසක් ඔහු ඔබ වෙත නොම		කෙරුවා
නෑදි මයිලන්ට එක සේ ගෞරව		කෙරුවා
කිසිවකු හටත් ඔබ ගැන දොස් නොම		කීවා

29. හිමි වෙත පිරූ වත් මැනවින් ඔබ		දන්නේ
මා සිත මනා කොට ඔබ හඳුනා		ගන්නේ
මා තුළ තිබෙන ගුණ ඔබ පමණයි		දන්නේ
එනිසා මහිමි මගෙ කුටියට		පැමිණෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 97		2018/8/4 8:46 AM

30. වළඳා අන්තයේ බුදුහිමි දම් දෙසුවා
මහරජු එදා සෙදගැමි පලයන් ලැබුවා
කිරිමව් දුකින් මිදෙනා මාවත තැබුවා
සිය දහසක් දෙනා දහමින් සැනසූවා

31. දහම් දෙසා අවසන පා සිවුරු ගෙන
අගසව් දෙනම සහ පියරජු සමගින්න
යසෝදරා ගුණවත් බව පෙන්වමින
මැදුරට වඩියි ඇය දකිනා අදහසින

32. බුදුහිමි දුටු යසෝදරා නිම් හිම් නැති සතුටින්නේ
බුදු සිරිපා අල්ලා ගෙන නෙක අයුරින් වැලපෙන්නේ
හදෙහි කලක් වූ සෝකය දිය කරලා හරිමින්නේ
දෙනෙත් තුළින් කඳුළු ලෙසට පිට කරලා සැනසෙන්නේ

33. මා මෙහි දමා ඔබ තනියම ගියෙ ඇයි ද
ඔබගේ මගට මා බාධාවක් වී ද
නැතහොත් මගෙන් යම් කිසි අඩුවක් වී ද
හේතුව කුමක් දැයි පහදා දෙනවා ද

34. ඔබෙ සිත හඳුන ගන්නට අසමත් වී ද
සසරට බැඳෙන බැඳුමක් ලෙස පෙනුනේ ද
පෙරුම් පුරද්දී නොසතුටු වූයෙම් ද
හේතුව කුමක්දැයි පහදා දෙනවා ද

35. තවුස් දිවිය මා හට නොදැරිය හැකි ද
අවු වැසි සුළං දරණට මා සියුමැලි ද
තනිකර ගියේ මා පිළිබඳ සෙනෙහෙන් ද
හේතුව කුමක්දැයි පහදා දෙනවා ද



DampeTheroKaviBook_Content_20180804.indd 98 2018/8/4 8:46 AM

36. සය වසරකට පෙර නික්මුණු දා ඉඳලා
හිමි ඔබ කෙරෙහි ඇති සෙනෙහස පෙන්වාලා
යසෝදරා පිරුවේ වත් දුක් විඳලා
පිය රජු කියයි ඇය ගැන පැසසුම් කරලා

37. අද මතු නොවයි ඇය මා වෙනුවෙන් සිටියේ
සියක් දහස් වර මා ළඟමයි සිටියේ
සඳ කිඳුරිය ලෙසින් පතිවත් රැක සිටියේ
බුදු හිමි ඇගේ ගුණ මේ ලෙස පැවසූයේ

38. හිමි බණ දෙසා රජ මැදුරෙන් නික්මෙනවා
කපිල වස්තු වන අරණේ නවතිනවා
නෑසිය දනට සදහම් මග පවසනවා
බොහො දෙන පැවිදි වී නිවනෙහි සැනසෙනවා

39. නන්ද විවාපත් වන දින පෙර දිනයේ
බුදු හිමි නන්දගේ මැදුරට වැඩම වූයේ
දන් වළඳලා පෙරලා වෙහෙරට වැඩියේ
හිමි පා රැගෙන නන්ද ද වෙහෙරට ආයේ

40. නන්ද! පැවිදි වෙන්නට ඔබ කැමතියි ද
බුදුහිමි නන්දගෙන් මේ ලෙස ඇසූ සඳ
අකමැති නමුත් කියනට බැරි වූ නන්ද
පැවිදව උතුම් අරහත් පල සුව වින්ද

41. පුත් සඳ පිරිවැරූ සුදිලෙන තරු ගොන්න
ලෙසින් රහත් සවුවන් පිරිවරා යන
බිම්බා සඳලු තල සිට බුදු හිමි දකින
පෙන්වයි රහල් පුතුහට පියතුම සොබන



DampeTheroKaviBook_Content_20180804.indd 99 2018/8/4 8:46 AM

42. සක් ලකුණින් යුතු රත් සිරිපා ඇති
පුරුෂ ලකුණු මහ දෙතිසක් ගත ඇති
පුන් සඳ මෙන් පිරිපුන් මුහුණක් ඇති
ඔබේ පියා අර මහ මග වැඩමති

43. නිලුපුල් වන් නෙත් කැළුමෙන් බබලති
රුවන් පටක් වන් නලල් තලා ඇති
සම සතලිස් මුතුවන් වූ දත් ඇති
ඔබේ පියා අර මහ මග වැඩමති

44. පුන් සඳ මෙන් තරු පිරවර කොට ඇති
අරහත් සවුවන් පිරිවරමින් යති
සිහ රජෙකුට වන් තෙදැති ගමන් ඇති
ඔබේ පියා අර මහ මග වැඩමති

45. කපිලවස්තු පුර කිරුළට උරුමැති
මහ ධන සම්පත් මැදුරු හිමිව ඇති
ඔබ හට දෙන්නට මහ ධනයක් ඇති
ඔබ ගේ උරුමය ඉල්ලනු දෙනු ඇති

46. එබස් අසා රාහුල එහි දුව යන්නේ
පියාණනේ යැයි බුදු හිමි අමතන්නේ
සුරතල් බසින් මේ ලෙස ඔහු පවසන්නේ
ඔබ සතු ධනය දැන් මට පවරා දෙන්නේ

47. ලොවැති ධනය නම් සැපයක් නැහැ ඇත්තේ
දුක්මය සදා කල් එහි සැඟ වී ඇත්තේ
සතක් අරිය ධන මා ළඟ දැන් ඇත්තේ
සදා සුවය පමණකි ඒ තුළ ඇත්තේ



DampeTheroKaviBook_Content_20180804.indd 100 2018/8/4 8:46 AM

48. රුවන් රිදී ඈ ධනයක් මට නැත්තේ
නිවන් ලබන ලොව්තුරු ධනයයි ඇත්තේ
මා සතු සියලු ධන ඔබ හට දිය යුත්තේ
වෙහෙරට යමුයි ඔහු අත අල්ලා ගත්තේ

49. රුවන් හසෙකු සමගින් යන පැටි විලසින්
සිහ රජකුගෙ පසුපස යන පැටි විලසින්
ඇත් රජකුගෙ පසු පස යන පැටි විලසින්
රාහුල ගියා පිය බුදු හිමි සමග තොසින්

50. සැරියුත් හිමිට රාහුල පුතු අත දෙන්නේ
උතුම් පැවිද්දට රාහුල පත් වෙන්නේ
සුදොවුන් නිරිඳු මේ ගැන කලබල වෙන්නේ
බුදුහිමි හමුවෙලා මේ ලෙස ඉල්ලන්නේ

51. ඔබ හා නන්ද මාගේ සෙනෙහස වූ යේ
ගිහිගෙය අතැර ගිය විට මා දුක් වූ යේ
රාහුල තමයි අපගේ සිත සැනසූයේ
ඔබ ඇයි ඔහු ව මෙලෙසින් වෙන් කර වූ යේ

52. අවසර අරන් වරයක් මා ඉල්ලන්නේ
දරුවෙක් ඉදින් ගිහි ගෙය අත හැර යන්නේ
මාපිය අවසරය එහි දී ලැබ ගන්නේ
නැතහොත් පැවිදි බව කිසි විට නොම දෙන්නේ

53. මහරජ ඔබගෙ අයැදුම මම පිළිගනිමි
මින්පසු මෙලෙස කිසි විටෙකත් නොම කරමි
මව්පිය අවසරය ගන්නට අනුදනිමි
නැතහොත් ඇවත් සිදුවන බව දැන් කියමි



DampeTheroKaviBook_Content_20180804.indd 101 2018/8/4 8:46 AM

54. මෙලෙසින් කිඹුල්වත් පුර වැඩ සිටින විට
දෙසුවේ දහම් නැයින් දුක් නිවන්නට
අනඳ කුමරු ඈ නෑ කුල කුමරුන්ට
සිත් විය පැවිදි වී බව දුක නසන්නට

55. දෙව්දත් අනුරුද්ද බද්දිය සමගින්නේ
බගු ආනන්ද කිම්බිල හිමි වෙත යන්නේ
කුමරුන් සය දෙනෙක් රජ සැප හැර යන්නේ
උපාලි කරණවැමි ද උන් හා යන්නේ

56. අසංඛ්‍ය කප් ලක්ෂ ගණන් සමතිස් පෙරුමන් පිරුවේ
ඒක තිසයි ප්‍රඥාවේ ආලෝකෙන් ලොව දිනුවේ
උපා යොදා දහස් ගණන් සතුනට මග පෙන්වූ වේ
අපායෙ යන්නට සිටි අය දුකෙන් මුදා සැනසූවේ

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**කිඹුල්වත් ගමන නම් වූ නවවන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 102 2018/8/4 8:46 AM

දසවන සර්ගය

# උපාය කෞශල්‍යය

1. අනත් සසර පිරූ අපමණ පෙරුම් ඇතී
සියලු සතගෙ සිත දකිනා නුවණ ඇතී
දහම් දෙසන්නට පැණ සර මහිම ඇතී
උපා යොදා නිවනට සත රැගෙන යතී

**(නන්ද තෙර)**

2. පළමු වරට සිය මව් රට වෙත වැඩියේ
රජ මැදුරෙහි දී වෙසෙසින් දනකට වැඩියේ
නන්දට තිබෙන පින් පල බුදු හිමි දුටුයේ
උපායකින් නිවනට දොරගුළු හලුයේ

3. නන්ද මලණු රජ වීමට බලා සිටියි
විවාහයට සුන්දර කුමරික් සිටියි
අලුත් මාලිගාවට යා යුතු ව සිටියි
මඟුල් තුනක් එක දවසක යොදා සිටියි

4 . පෙර දින දනට බුදු හිමි වැඩමවන්නේ
දන් දී නන්ද හට ආසිරි පතන්නේ
දහමින් ඔහුට අවවාදය කරන්නේ
සතුටින් පිනා ගොස් නන්ද ද සිටින්නේ

5. වළඳා අන්තයේ වෙහෙරට වඩින්නේ
නන්ද අතෙහි වලඳන පය තබන්නේ
හිමි පසු ගමන් යාමට කියවෙන්නේ
හිමි පසුපසින් ගෙම්හිට පිය මනින්නේ

6. ජනපද කළණ වෙත ඔහු සිත දුවන්නේ
සඳලු තලෙහි සිටි ඇය ඔහු දකින්නේ
පමා නො වී එන්නට යැයි කියන්නේ
ඔහුගෙ සිතට මෙ වදන් කා වදින්නේ

7. හිරු ඉදිරියට පියවර තබමින් ගිය ද
හෙවනැලි ඇදෙන්නේ ආ පස්සට නොවෙද
බුදු හිමි අනුව පියවර තබමින් ගිය ද
ඔහු සිත ඇදී යන්නේ ඈ වෙත නොවෙද

8. බුදු හිමි සමග නන්ද ද වෙහෙරට යන්නේ
පාත්තරේ ආපසු හිමි වෙත දෙන්නේ
සතුටු සිතින් ආපසු යන්නට හැරුනේ
හිමිගේ වදනකින් එතැන ම නතර උනේ

9. ගිහිගෙය දුකයි ඔබ ඒ ගැන දන්නවද
පැවිදි දිවිය සැපතයි ඔබ දන්නවද
රජ සැප අතැර මෙහි එන්නට කැමතියිද
නන්ද මහණ වෙන්නට ඔබ කැමතියිද

10. පිළිකෙව් කරන්නට නන්දට නොහැකි විය
මහණ වෙන්න අකමැත්තෙන් කැමති විය
පෙම්වත් සොඳුර ගැන නිතර ම සිතනු විය
රැක ගත නොහැකි සිත ඇය ළඟ නතර විය

11. බවුන් වඩන සිත කලබල වී යන්නේ
කය ගැන බලන ඔහු ඇගෙ රුවමයි දක්නේ
සිත ගැන බලන විට සිත තුළ ඇය ඉන්නේ
ඉර හඳ තුළ ද හැම තැන ඇය ම යි ඉන්නේ

12. පමා නො වී එනු මැන පෙම්බර නන්ද
තෙමා නුවන් කී එවදන් හද බින්ද
දින දින තැවීමෙන් වැහැරුණු සිරුරින්ද
රෝගී ලෙස පෙනේ උකටලි වූ නන්ද

13. බවුන් වඩන සිත නැහැ එක්තැන් වෙන්නේ
සිත ලෙඩ බැවින් කය ටික ටික ලෙඩ වෙන්නේ
ඇය සිහි වෙද්දි කෙලෙස ද සසුනෙහි ඉන්නේ
අවසර අරන් ගිහි ගෙට යා යුතු වෙන්නේ

14. මෙලෙස සිතූ ඔහු බුදුහිමි හමු වෙනවා
තම සිත පැතුම් හිමියන් හට පවසනවා
නන්ද! එන්න ගමනක් යා යුතු වෙනවා
එහි ගොස් ඇවිත් ගිහි වෙන්නට ඉඩ දෙනවා

15. නන්ද සමග බුදු හිමි දෙව් ලොව යනවා
අතර මගදි දැවි හේනක් පෙන්වනවා
දැවුණු වැඳිරි රුවකුත් එහි පෙන්වනවා
නන්දගෙ සිතට අපුලක් ඉන් ඇති වෙනවා

16. දෙව්ලොව දෙව් ලියන් දුටු නන්දගෙ සිතට
නිම් හිම් නැතිව ඇති වී එනවා සතුට
දිවසළු අබරණින් වැසූ උන්ගේ රුවට
ලොබ කර සිතයි දෙව්ලොව නැවතී ඉන්ට



DampeTheroKaviBook_Content_20180804.indd 105 2018/8/4 8:46 AM

17. දුහුල් දිවිය සළු පලදා සිටින නිති
මුතුහර රුවන් අබරණ ගත පැළඳ ඇති
දෙව්ලියො රුවින් යුතු පුහුදුන් සිත බඳිති
නන්ද! ඔබට ඇති වන්නෙ ද සිත් කැමති

18. උන්ගේ රුවට මම දැඩි සේ ලොබ කරමි
ජනපද කළණ දැව් වැදිරිය ලෙස දකිමි
සුරලියො ලබන්නට මම ආසා කරමි
එනිසා හිමිගෙ ඔවදන් ලෙස පිළිපදිමි

19. නොකියමි බොහෝ වැඩි දේවල් කරන්නට
හැකිවෙද ඔබට සිත දමනය කරන්නට
හැකි නම් සිතෙහි ඇති බැඳුමන් සිඳින්නට
කරනෙමි සපත දෙව්ලියො ලබලා දෙන්ට

20. ඉදින් ලැබේ නම් දෙව්ලියො ලබන්නට
හැකි වෙයි මෙ මට ඔබ කී ලෙස කරන්නට
පෙරලා නන්ද ඇවිදින් මනු ලෝකයට
වඩනට උනා වෙර සුරඟනො ලබන්නට

21. බවුන් වඩා අඟනුන් ලබනට සිතන
නන්දට විහිළු කරනවා අන් සියලු දෙන
නන්ද වෙහෙස වී දිව රෑ වෙර වඩන
නිවා දැමිය කෙලෙසුන් හැම සිත දවන

22. නන්ද රහත් වී නිවනින් සැනසෙන්නේ
හිමි දුන් පොරොන්දුව එතැනින් නිම වෙන්නේ
නන්ද රහත් තෙර බුදු හිමි හමු වෙන්නේ
දෙවඟනො අවැසි නැති බව දැන් පවසන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 106 2018/8/4 8:46 AM

**(සිරිමා නගර ශෝභිනිය)**

23. බුදුහිමි වරක් සැවතෙහි වැඩ වසන කල
රුවැති ලියක් සිටියා සිත් වසඟ කළ
සිරිමා නමින් මුළු දඹදිව් තල පතල
ඇගෙ රුව රනින් රිදියෙන් නොකළැකි ය මිල

24. දිගු වරලසෙහි සුසුවඳ මල් දම් පැලඳ
රන්වන් සිරුර පුන් පියොවුරු මන බැන්ද
නිතඹ සලන මිහි බට දෙව් ලියක් ලෙද
ඇගෙ ගත පහස විඳිනට අකමැති කවුද?

25. රජ සිටු ඇමති මැතිවරු ඇය වෙත බැඳුණු
රැයකට ගෙවති කහවනු දහසින් බැඳුණු
ඇගෙ අඟ පසඟ දිලිසෙයි මොනවට පිරුණු
නුවරෙහි නොමැත ඇය හා සම වෙන ගැහැණු

26. සසුනෙහි සැදැහැ සිත් ඇති වී පැවිදි වුණු
බවුන් වඩන මුත් කෙලෙසුන් තව තිබුණු
මහණෙක් දකියි ඇගෙ රුව මැනවින් දිලුණු
නැග එයි රාග ගිනි දැල් ඇය හා බැඳුණු

27. මෙබඳු රුවක් අමතක කරනට හැකි ද
කාමී සිතට ඇය රස අඳුනක් නොවෙද
ඇගේ පහස විඳිනට මට පින් මදි ද
කෙලෙසක ඇයව මට හිමිකර ගත හැකි ද

28. මෙලෙස සිතන ඔහු උකටලි වී ඉන්නේ
අහර නොගෙන ඇය ගැන සිතමින් ඉන්නේ
පිරිපුන් සිරුර දැන් ටික ටික වැහැරෙන්නේ
බුදු හිමි මොහුගෙ සිත මැනවින් දැනගන්නේ

29. කාලය මෙසේ ටික දවසක් ගත වෙනවා
නොසිතූ ලෙසට සිරිමා රෝගී වෙනවා
පිළියම් වලින් කිසි පලයක් නැති වෙනවා
රෝගය නිසා සිරිමා පරලොව යනවා

30. මෙ පුවත නුවර සැම තැන පැතිරී යන්නේ
බුදුහිමි කොසොල් මහ නිරිඳුන් හමුවෙන්නේ
සිරිමගෙ සිරුර දින හතරක් රැක ගන්නේ
බුදුහිමි නිරිඳු හට මේ ලෙස දන්වන්නේ

31. රජ අණ පරිදි සිරිමගෙ මළ සිරුර රකියි
මෙ ලෙසට දවස් හතරක් කාලය ගත වෙයි
ජනයා රැස් කරන්නට රජු හට පවසයි
හිමි කී ලෙසට රජු බොහො පිරිසක් කැඳවයි

32. රන් සළු අබරණින් පෙර සැරසූ සිරුර
සුදු රෙදි කඩින් වසලා දමලා අතැර
තෙල් ගා පෙරදි පීරූ වරලස විසිර
ගැල වී අතැර යයි දැන් ඇයගේ සිරුර

33. නා දළු පැහැය ගෙන පෙර දා සිනිඳුවට
බැබලුණු දෙතොල් දැන් කටරොඩු මල් ලෙසට
නිල් වී විවර වී නිවසකි පණුවන්ට
කුණු ලේ පිරෙයි තව තව මිනියේ මුවට

34. සුරලිය ලෙසින් පෙරදා වැජඹුණු සිරිමා
ඉදිමී නිල් ව සම පලුදුව ගිය සිරිමා
සඳුන් සුවඳ සිරුරෙන් විහිදුව සිරිමා
කුණු වී දුගඳ හමනා මිනියකි සිරිමා



DampeTheroKaviBook_Content_20180804.indd 108 2018/8/4 8:46 AM

35. බුදු හිමි පිරිස සමගින් එහි වැඩමන්නේ
උකටලි මහණ එම පිරිසෙහි මැද ඉන්නේ
බුදුහිමි කොසොල් මහ නිරිඳුන් අමතන්නේ
සිරිමගෙ සිරුර විකුණන්නට පවසන්නේ

36. පෙරදා කාසි දහසකටත් වැඩි බැවිණී
දහසක් කාසි මිල හැටියට නියම වුණී
එපමණ ගෙවන්නට කවුරුත් නැති බැවිණී
අඩක් අඩුව මිල නැවතත් නියම වුණී

37. ඇයගේ සිරුර ගන්නට කිසිවෙකු නැහැනේ
එයින් අඩක් නැවතත් මිල අඩු වෙන්නේ
කහවණුවකට මේ ලෙස මිල අඩු වෙන්නේ
කවුරුද මුදල් දී මළ මිනියක් ගන්නේ

38. සිරිමගෙ සිරුර වෙන්දේසියෙ විකුණන්නේ
මුදල් නොදී මුත් නැහැ කිසිවකු ගන්නේ
සිරුරෙ හි නිසරු බව බුදුහිමි පෙන්වන්නේ
හැමට ම එහිදි සිරුරේ තතු පවසන්නේ

39. උකටලි මහණ එම දහමට කන් දෙන්නේ
සිරුරේ සැබෑ තතු මැනවින් දැන ගන්නේ
කෙලෙසුන් නසන මාවත වෙත පිළිපන්නේ
හිමිගේ උපායෙන් සැනසුම ලැබ ගන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 109 2018/8/4 8:46 AM

**(කිසාගෝතමී)**

40. තව එක් කලෙක බුදුහිමියන් වසන සඳ
සිටියා මවක් ගෝතමි නම් කරන ලද
සිහින් සිරුරකට හිමිකම් කියන ලද
බැවින් කිසාගෝතමි නම් රුසිරු ලඳ

41. කුලයක අනගි සිටුවරයකු හට බිරිඳ
වීමට පිනැති මේ ගෝතමි සොඳුරු ලඳ
කුළුදුල් දරු ලෙසට සුරතල් පුතකු ලද
සෙනෙහෙන් හදයි මිණි කිරුලක් රකින ලෙද

42. අනියත දහම හැම මොහොතෙ ම පවතින්නේ
එනිසයි සුරකිනා දේ බිඳිලා යන්නේ
සෙනෙහෙන් සුරැකි මුත් පුතු ඇගෙ ලෙඩ වෙන්නේ
පුතු කර තබා ඇය වෙදැදුරු වෙත යන්නේ

43. වෙදැදුරු පිරික්සයි දරුවා මනාකොට
මිය ගිය බවයි දැනුනේ පෙර මොහොතකට
මියගිය කෙනෙක් බැහැ නොවැ සුව කරන්නට
වෙදැදුරු කියයි දරුවා මළ බව ඇයට

44. මරණය නැමැති වචනය බොහො නුහුරු නිසා
එහි ඇති අරුත් තතු ලෙස ඇය නොදත් නිසා
මරණය රෝගයක් ලෙස ඇය සිතුව නිසා
වෙන වෙදැදුරෙක් සොයනව ගෝතමිය කිසා

45. එක එක වෙදුන් සොයමින් ඇය වෙහෙසෙන්නේ
දරුවා මළ බවයි ඒ හැම පවසන්නේ
මළ සිරුරකට කොහොම ද අප පණ දෙන්නේ
උන් කී වදන් ඇය හට නැහැ වැටහෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 110 2018/8/4 8:46 AM

46. මරණය සුව කරන්නට හැකි වෙදෙක් සොයා
කිසා ගෝතමිය තැන තැන ඇවිද ගියා
මිනියක් වඩා ගෙන යන වෙදැදුරන් සොයා
මැය පිස්සියකි සමහරු පලවා හැරියා

47. මවකට තිබෙන දරු දුක මැනවින් දන්නා
විපතින් ඇයව මුදවා ගන්නට සිතනා
මගියෙක් ඇයට ආදරයෙන් පා කරුණා
පවසයි තොරතුරක් තරමින් ඔහු දන්නා

48. නැගණිය! දනිමි මම එක් වෙදැදුරෙක් ගැන
මරණය නසන බෙහෙතක් ඇත ඔහු දන්න
ගෞතම බුදුන් ලෙස මුළු දඹදිව දන්න
දරුවා රැගෙන බුදු හිමියන් වෙත යන්න

49. එයසා කිසා ගෝතමී බොහො තුටු වෙන්නේ
දරුවා රැගෙන වහ වහ වෙහෙරට යන්නේ
නිල් වූ ළදරු මළ කඳ හිමි වෙත දෙන්නේ
මෙය සුව කරන්නට හැකිදැයි විමසන්නේ

50. මරණය නසන බෙහෙතක් ගැන මම දනිමි
දරුවා සුව කරන්නට හැකි බව කියමි
නැගණිය! අබ මිටක් ගෙන එන්නට කියමි
බෙහෙතක් එයින් සාදා මෙය සුව කරමි

51. සුව කළ හැකිය බුදුහිමියන් කියපු නිසා
සතුටින් ඉපිල යන්නී ගෝතමිය කිසා
පිට වී යන්න සැරසෙයි අබ සොයනු නිසා
බුදුහිමි නැවත පවසයි නවතලා කිසා



DampeTheroKaviBook_Content_20180804.indd 111 2018/8/4 8:46 AM

52. නැගණිය! ගෙනෙන අබ පිරිසිදු විය යුතු ය
කිසිවෙකු නො මළ ගෙයකින් එය ගත යුතු ය
මැරුණොත් කෙනෙකු එය බෙහෙතට නොම යුතු ය
මෙ කරුණ හොඳින් ඔබ සිහියට ගත යුතු ය

53. නො මළ ගෙරදකින් අබ සොමින් යන්නා
ගෝතමී ගෙයින් ගෙට යයි දරු කර පින්නා
හැම තැනකින් ම ඇය හට අබ නම් ලැබුණා
ඇය ඇසු දේට ඒ හැම මේ ලෙස කියනා

54. අම්මා මැරුණෙ ගිය සතියේ කෙනෙක් කියයි
දරුවන් මැරී සමහරු කඳුළැලි වගුරයි
නැන්ද මාමා දුව මළ බව කෙනෙක් කියයි
අලු තියන්න ගත් මැටි කලය ද පෙන්වයි

55. දවස ම මෙසේ ගෝතමී ඇවිදන් යන්නේ
නො මළ ගෙයක් මුළු නුවර ම නො දකින්නේ
මරණය ලෙඩක් නොවනා බව වැටහෙන්නේ
දිවියේ නියම තතු ඇය වටහා ගන්නේ

56. ඉදිමුණු සිරුර සොහොනට විසිකර යන්නේ
බුදු හිමි සොයා මිස නිවසට නොම යන්නේ
දිවියේ අරුත දත් බව ඇය පවසන්නේ
සසුනෙහි පැවිදි වෙන්නට ඇය ඉල්ලන්නේ

57. පැවිදි උපසපන් බව සසුනෙහි ලැබුවා
විදසුන් වඩාලා අරහත් පල ලැබුවා
රළු චීවරය දැරුමෙහි අගතැන් ලැබුවා
හිමිගේ උපායෙන් ඇය සැනසුම ලැබුවා



DampeTheroKaviBook_Content_20180804.indd 112 2018/8/4 8:46 AM

## (ඛේමා)

58. කොසොල් රජුගෙ ප්‍රිය දේවිය වූ ඛේමා
රුවෙන් දෙව්ලියන් පරදා සිටි ඛේමා
එනිසා රූප මදයෙන් යුතු වූ ඛේමා
නිතර ම රූපෙ ගැන සැලකිලි වූ ඛේමා

59. බුදු හිමි දෙසන්නේ රූපය නිසරු බවයි
දුක් කන්දකට හේතුව මේ රුව ම බවයි
රූපයෙ සොඳුරු බව නම් බුදුහිමි නොදකියි
එබැවින් බුදුන් දකිනට කිසිදා නොම යයි

60. කොසොල් නිරිඳු මේ බව මැනවින් දන්නේ
හිමි මුනගසන්නට සැලසුම් සකසන්නේ
වියත් කිවිවරන් මැදුරට ගෙන්වන්නේ
දෙව්රම් වෙහෙර ගැන කව් ගී සදවන්නේ

61. දෙව්රමෙ සොඳුරු බව ගීයෙන් ලියවෙන්නේ
දේවිට ඇසෙන සේ මේවා ගයවන්නේ
වෙහෙරෙහි සොඳුරු බව දක්නට සිත් වෙන්නේ
ගොසින් රජුට ඒ පිළිබඳ පවසන්නේ

62. රජු සිතු පරිදි ඇය දෙව්රම වෙත යන්නේ
අරමෙහි සිරි බලා ගත සිත සනසන්නේ
බුදු හිමි දම්සබා මඩුවෙහි වැඩ ඉන්නේ
ඇගෙ චරිතයෙහි හැටි මැනවින් හඳුනන්නේ

63. බණ මඩුවෙහි දී බුදුහිමි දම් දෙසන කල
ඇවිදියි ඇයත් මෙ ලෙසින් ඒ අරම තුළ
සිත් විය දකිනු වස් හිමි රුව වෙහෙර තුළ
එනිසා සෙමින් බණ මඩුවට පැමිණි කල



DampeTheroKaviBook_Content_20180804.indd 113 2018/8/4 8:46 AM

64. දුටුව දෙයින් ඇය විශ්මිත වී යන්නේ
බුදු හිමි පසෙක එක් අඟනක් එහි ඉන්නේ
දෙවඟන බඳු රුවෙන් ඈ ගත දිලිසෙන්නේ
බුදුහිමියන්ට චාමර සලමින් ඉන්නේ

65. බුදු හිමි රුවෙහි අසුබය ම ලු කියන්නේ
රූමත් බවට නින්දා ම ලු කරන්නේ
එනමුත් රුවැතියක් පසෙකින් සිටින්නේ
ඛේමගෙ සිතට විශ්මය ම යි දැනෙන්නේ

66. ඇයට පෙනෙන්නයි හිමි මේ රුව මැවුවේ
වෙනකෙකු නොමැත මේ ලස්සන රුව දුටුවේ
ඛේමා හොඳින් මේ රූපය දෙස බැලුවේ
හිමි අදිටනින් රූපය ටික ටික දිරුවේ

67. තරුණිය ටිකෙන් ටික මැදිවිය වෙත එනවා
මැදිවිය ටිකෙන් ටික ගෙවිලා නැති වෙනවා
කෙස් සුදු වෙලා දැන් හම රැලි ගැන්වෙනවා
දත් ටික වැටී අත පය පණ නැති වෙනවා

68. අතෙහි රැඳුනු චාමර ගිලීහී යනවා
කෙලින් සිරුර දැන් ටික ටික ඇද වෙනවා
තරුණිය මහලු වී දිරලා මිය යනවා
මෙය දුටු බිසව රූපෙහි මත් බිඳලනවා

69. හිමි ළඟ වැටී ඇය සදහම් අසන්නී
පැවිදිව පසුව නිවනෙහි සුව විඳින්නී
අගසවු මෙහෙණි තනතුර ඇය ලබන්නී
හිමිගේ උපායෙන් බව දුක් නිවන්නී



DampeTheroKaviBook_Content_20180804.indd 114 2018/8/4 8:46 AM

70. වළාගැබෙන් නික්මෙන සඳ ගණ'දුර දුරු කරණු වගෙයි
උදයේ නැග එන හිරුගෙන් ඕලු නෙළුම් පිපෙණු වගෙයි
බුදුහිමි දම් දෙසනා විට අවිදු අඳුරු පහව යතියි
පිපෙන පියුම් විලසට දන සංසාරෙන් ගොඩට යතියි

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**උපාය කෞශල්‍යය නම් වූ දසවන සර්ගය නිමි**

DampeTheroKaviBook_Content_20180804.indd 116 2018/8/4 8:46 AM

එකොළොස්වන සර්ගය

## දේශනා කෞශල්‍යය

1. පෙරුමන් පිරුවෙ සත සසරින් ගොඩ ලන්නයි
බුදු වී දහම් දෙසුවේ හිමි ඒ හින්දයි
එක එක අයට දෙසුවේ එක නිවන් මග යි
එනමුත් දහම් දෙසූ හැටි නම් බොහො විවිධ යි

2. කෙනෙකු මුණගැසී එකවර දහම් දෙසයි
තවෙකෙකු ඇසූ පැනයට දෙසුවේ දහමයි
පැනයක් ඇසූ විට එය පැනයෙන් විසඳයි
හිමි දම් දෙසන විට සැමගේ සිත පිනවයි

**(ධනිය ගෝපාල)**

3. කෙනෙකු කියන දෙයකට වෙන යමක් කියයි
ඒ තුළ මහත් වූ අරුතක් සැඟව තිබෙයි
ගොපල් ධනිය ගිහි සැපතෙහි තුටුව සිටියි
ඒ සැප නැතිව තුටු වන හැටි හිමි පවසයි

4. බත පිස තිබේ කිරි ටික දොවලා සිටිමි
මහි ගංගෙරෙහි පිරිවර සමගින් සිටිමි
මැනවින් වැසූ ගෙ තුළ ගිනි දල්වා සිටිමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

5. තරහව නසා කෙලෙසුන් සුන්කර සිටිමි
මහි ගංතෙරෙහි තනිව ම මෙම රැය ගෙවමි
විවර වූ කුටිය ඇත රා ගිනි නිවුවෙමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

6. මැසි මදුරුවන් මෙහි ඇති බව නොම දනිමි
මගේ ගව දෙනුන් ළා තණ බුදිනු ද දකිමි
වසිනා වැස්ස සතුටින් ඉවසනු දකිමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

7. පසුරක් මනා කොට බඳවා නිම කළෙමි
සැඩදිය පහර මැනවින් තරණය කළෙමි
දැන් ඒ පසුර වැඩකට නැති බව දනිමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

8. කීකරු බිරිඳ අහරෙහි ලොල් නැත කියමි
සහ වාසයට බොහො ප්‍රිය බව මම දනිමි
කිසිදු දොසක් ඇති බව නම් නොම දනිමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

9. කෙලසුන් නසා සිත මා වසඟෙට ගනිමි
රෑ බොහො කලක් මගෙ සිත දමනය කළෙමි
මා තුළ පවක් නැති බව මැනවින් දනිමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

10. මා උපදනා දනයෙන් මගෙ දිවි රකිමි
මා මෙන් පුතුන් ලෙඩ දුක් නැති බව දනිමි
උන්ගේ කිසිදු වරදක් මම නොම අසමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි



DampeTheroKaviBook_Content_20180804.indd 118 2018/8/4 8:46 AM

11. මම කිසිවෙකුත් හට මෙහෙවර නොම කරමි
මිදිලා කෙලෙස් බැම්මෙන් ලොව සැරිසරමි
මෙහෙකම් කිරීමෙන් වැඩ නැති බව දනිමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

12. නාඹර තරුණ වස්සන් උරුමව සිටිමි
ගැබ්බර දෙනුන් මගෙ ගව මඩුවේ දකිමි
එහි ඇති ගවම්පති ගවයන් මම දකිමි
මේඝය ඉදින් රිසිනම් වස්වනු කියමි

13. නාඹර තරුණ වස්සන් නැති බව දනිමි
ගැබ්බර දෙනුන් මගෙ අයිතියෙ නැත කියමි
ගවම්පතී ගවයන් මට නැත කියමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

14. නො සැලෙන ලෙසින් ටැම් හැම සිටුවා තබමි
නව දම්වැලෙන් ඒවා බඳවා තබමි
නාඹර පැටවුන්ද නොකඩන බව දනිමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

15. ගවයෙකු බිඳින ලෙස බැමි බිඳ දැමූවෙමි
ඇතු වැල්පටක් කඩනා ලෙස කැඩූවෙමි
මව් කුස යළිත් ඉපදීමක් නො වන්නෙමි
මහවැසි ඉදින් රිසි නම් වස්වනු කියමි

16. වළ ගොඩ පුරවමින් මහ වැසි වසින්නේ
එ දැක ධනිය යළි මේ ලෙස කියන්නේ
"බුදු හිමි දැක්ම අපහට සෙත ගෙනෙන්නේ
ගුරු වූ ඔබ ගෙ සරණය අප ලබන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 119 2018/8/4 8:46 AM

17. "බිරිඳ ද මම ද ඔබ ගේ සවුවන් වෙන්න
කැමතියි පැවිදි වී සසරින් ගොඩ වෙන්න"
ධනියගෙ වදන් මරුවා අසමින් උන්න
මේ ලෙස කියා බැලුවේ ඔහු වලකන්න

18. "දරු ඇති දනෝ ඒ හින්දා සතුටු වෙති
ගව ඇති දනෝ ඒ හින්දා සතුටු වෙති
දැඩි ලෙස ගත් දෙයින් නරයෝ සතුටු වෙති
අතහැර දැමූ ජනයා ඉන් දුක් ලබති"

19. "දරු ඇති දනෝ ඒ හින්දා ශෝක වෙති
ගව ඇති දනෝ ඒ හින්දා ශෝක වෙති
දැඩි ලෙස ගත් දෙයින් නරයෝ ශෝක වෙති
අතහැර දැමූ ජනයා ඉන් සතුටු වෙති"

20. මරුගෙ වචනයට වෙන අරුතක් කිවුවා
වෙනස් අයුරකට ධනියට බණ දෙසුවා
ඒ දෙසු දහම ධනියගෙ සිත සැනසූවා
කෙලෙසුන් නසා ධනිය ද මග පල ලැබුවා

**(බමුණෙකුගේ පැනයක්)**

21. කෙනෙකු ඇසූ පැනයට පැනයක් ම අසයි
ඔහු දෙන පිළිතුරෙන් කදිමට එය විසඳයි
බමුණෙක් ඇවිත් දිනකදි පැනයක් විමසයි
ඔහුගේ පැන බුදුහිමි පැනයෙන් විසඳයි



DampeTheroKaviBook_Content_20180804.indd 120 2018/8/4 8:46 AM

22. "මියගිය අයට අප සැලකිය යුතු වේ ද?
නිදුකාණනේ කවරක් අප කළ යුතු ද?
"මිය ගිය අයට පින් දී තුටු කරනෙමු ද?
මෙලෙසට පිනෙන් උන් තුටු කළ හැකි නොවෙ ද?

23. "වෙන්නෙ ද ඔවුන් හැම අනුමෝදන් වීම
හැකි වෙද හැමට පින් අනුමෝදන් වීම?
"ලද හොත් ප්‍රේත ලොව පරදත් ඉපදීම
උන්හට හැකිය පින් අනුමෝදන් වීම"

24. "ඉදින් උපන්නේ නැති නම් ඒ බවයේ
කිසිවෙක් ලබා නොගනිති පින් වෙන බවයේ
වෙහෙස ව කරන පින් කම්වල පල නැති යේ
සිතනෙමි මෙයට හිමිගෙන් පිළිතුරු සැපයේ

25. "කරුණක් අසමි ඔබ හොඳහැටි අහගන්න
සිහියෙන් මනා කොට මට පිළිතුරු දෙන්න
ඔබ යන්නේ ද නෑ මිතුරන් දැක ගන්න
යන්නේ කෙසේදැයි මට දැන් පවසන්න"

26. "මම යමි හිමියනේ නෑයන් හමු වෙන්න
ඉඳහිට එසේ දක්නට සිදුවෙන බැවිණ
කැවිලි පෙවිලි තව බොහො දේ ගෙන යන්න
ගමනට සකස් කරනෙමි මම මැනවින්න"

27. "ඔබ යන විට දි නෑයන් නිවසේ නැතිවේ
එදිනට කෙසේ වත් හමුවෙන්නට බැරිවේ
ගෙන යන කැවිලි උන්හට දෙන්නත් බැරිවේ
එ නිසා ඒවා විසිකර ඔබ ආ යුතු වේ"



DampeTheroKaviBook_Content_20180804.indd 121 2018/8/4 8:46 AM

28. "කැවිලි පෙවිලි විසිකර නොම දමන්නෙමි
නිවසට ගෙනත් සැමටම දී බුදින්නෙමි"
"එලෙසින් පිනෙහි පල ලැබෙනා බව කියමි
නැයින් නො නොලත් පින අපට ම වෙයි කියමි"

29. හිමි දෙසූ දහම අවබෝධය පහසු නොවේ
නුවණින් යුතු ව පමණක් දැන ගත යුතු වේ
අසනා අයට නිවැරදි ලෙස කිය යුතු වේ
එනිසයි බොහෝ තැන්වල උපමා යෙදුවේ

**(අග්ගික භාරද්වාජ)**

30. මගධ රටෙහි වැඩ සිටිනා එක් කලෙක
ගොවිතැන් කරන බමුණෙක් සිටියා ගමක
මේරූ නුවණ ඇති මේ බමුණාව දැක
පෙරවරු සමෙහි බුදු හිමි එහි වැඩි සේක

31. බමුණා කෙතක සී සාමින් සිටින්නේ
සමිඳුන් පා කබල ගෙන එහි සිටින්නේ
බමුණා මනා කොට හිමියන් දකින්නේ
දැක මේ ලෙසින් අවවාදයි කරන්නේ

32. පින්වත් මහණ! මම ගොවිකම් කරන්නෙමි
සී සා වපුරලා ආහර බුදින්නෙමි
ඔබ සිගමනෙහි යා යුතු නැති බව කියමි
සී සා වපුරලා දිවි රකිනට කියමි



DampeTheroKaviBook_Content_20180804.indd 122 2018/8/4 8:46 AM

33. හා හා බමුණ! ඔබ එලෙසට නො කියන්න
ගොවිතැන් කරමි මම ඔබ එය දැනගන්න
සී සා මමත් ජීවත් වෙමි අහගන්න
බමුණා නැවත මෙලෙසට විය විමසන්න

34. ගොවිතැන් කරන බව පින්වත මට කියන
නමුත් නොමැත දකිනට ගොවි උපකරණ
කෙලෙසක දනිමු බව ඔබ ගොවිතැන් කරන
පහදා ගොයුම් සිම්දුනි මට කියනු මැන

35. සැදැහැය බීජ ලෙස ගෙන මම වපුරනෙමි
තපස නමැති වැසිජලයෙන් සරු කරමි
ප්‍රඥා නමැති නගුලෙන් මම සීසාමි
හිරිය නගුලිසයි සිත රැහැනට ගනිමි

36. හී වැල කෙවිට ලෙස ගෙන සිහියෙන් සිටිමි
කය සහ වචී සුචරිතයෙන් යුතු වුයෙමි
සතර පසෙහි නිතුරු සංයත වු වෙමි
සුතර භාවයෙන් මා විය ගස මුදමි

37. නිවනට පැමිණ ශෝකය නොම කරන්නෙමි
ධුර වාහක ය ලෙස වීරිය කරන්නෙමි
මේ ලෙස මම ත් ගොවිතැන් බත් කරන්නෙමි
එම ගොවිතැනෙහි පල සැමදා ලබන්නෙමි

38. දෙසුමට මනා කොට බමුණා පැහැදෙන්නේ
බුදු සවු පදවි මෙම සසුනෙහි ලැබ ගන්නේ
විදසුන් වඩා බෙහෙවින් වීරිය ගන්නේ
වැඩිකල් නොගොස් අරහත් පල ලැබ ගන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 123 2018/8/4 8:46 AM

## (පුක්කුසාති හමුව)

39. මගධ රටෙහි සැරිසරමින් වඩින කල
රියක් සිටියෙ හග්ගවගේ කුඹල් හල
පුක්කුස නමින් මහණෙකු සිටියා එ තුළ
අවසර අරන් සමිඳුන් එහි සිටින කල

40. අසුනක් පණවගෙන හිමි එහි වැඩ ඉන්නේ
බොහො රැය ගෙවෙන තුරු දැහැනට සමවන්නේ
එලෙස ම පුක්කුසාති ද වෙර වඩමින්නේ
කුඹල්හලෙහි එක පැත්තක වැඩ ඉන්නේ

41. දුටුවන් පහදවන ඉරියවුවකි ඇත්තේ
වත ගොත ටිකක් විමසා දැන ගත යුත්තේ
කවුරුන් නිසා ඔබ තපසට බැස ගත්තේ
කාගේ දහමක් ද ඔබගේ සිත ගත්තේ

42. ඇවැත්නි ගොයුම් සුදොවුන් පුත් පැවිදි වෙලා
සම්බුදු පදවි ලැබුවේ කෙලෙසුන් නසලා
ඔහුගේ කිත් යසස් දඹදිව් තල පතලා
ඒ සසුනටයි ආවේ ගිහිගෙය හැරලා

43. "ඔබ ඒ ගොයුම් ගොත් සම්බුදු දන්නෙහි ද
මින් පෙර සම්බුදුන්ගේ රුව දැක්කෙහි ද
හමු වූවොතින් හඳුනන්නට හැකි වෙහි ද
ඔබගේ ගුරුන් දැන් වැඩ ඉන්නේ කොහි ද?"

44. "තවමත් නොදුටු හින්දා මම නොම දනිමි
එනිසා රුවෙන් කිසිවිටෙකත් නොහඳුනමි
සැවතෙහි සිටින බව පමණක් ඇසූවෙමි
හිමි බැහැදකිනුවස් සැවතට පා තබමි"

45. පුක්කුසාති මා වෙනුවෙනි පැවිදි වුණේ
ගුරුවරයාට මොහු බෙහෙවින් සැදැහැ වුණේ
මග පල ලබන්නට නුවණින් යුතු වෙන්නේ
සදහම් ඇසූ විට නිවනෙහි රස විඳිනේ

46. "පුක්කුසාති මම ඔබහට දම් දෙසමි
නිරවුල් සිතින් සදහම් අසනට කියමි"
"ඇවැත්නි දෙසනු මැන සිහියෙන් බණ අසමි"
මෙලෙසට පුගුල් පිළිබඳ දෙසූ සේක හිමි

47. ධාතු ලෙසට සයකට බෙදලා ඇත්තේ
තද බව ජලය තේජස යන තුන ඇත්තේ
වාතය අහස විඤ්ඤාණය එහි ඇත්තේ
කෙනෙකු මෙලෙස වෙන් කොට බෙදලා ඇත්තේ

48. ඵස්සායතන සයකට තව බෙදෙන්නේ
ඇස කණ නහය දිව සිරුර ද තිබෙන්නේ
මනසත් සමඟ හය මේලෙස ගනින්නේ
මෙලෙසට කෙනෙකු තව හයකට බෙදෙන්නේ

49. අටළොස් අයුරකට මනස ද බෙදන්නේ
ඉඳුරන් සමඟ නිති රූපයි ගැටෙන්නේ
සුව දුක් උපෙක්ඛා ඉන් ඇති කරන්නේ
ඉඳුරන් හයෙන් මේ තුන වැඩි කරන්නේ

50. අධිට්ඨාන වශයෙන් යළි බෙදෙන්නේ
පඤ්ඤා සච්ච එහි මුල් තැන රඳන්නේ
චාග ද සමඟ උපසම එහි තිබෙන්නේ
මෙලෙසයි සතරකට යළි එය බෙදෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 125 2018/8/4 8:46 AM

51. එක එක කොටස් හතරට මුල දී බෙදුවේ
දෙවනුව එකින් එක යළි විස්තර කෙරුවේ
පුක්කුසාති සිහියෙන් යුතුව ම ඇසුවේ
දහම දැකපු ඔහු ඉන් බුදුහිමි දුටුවේ

52. මෙබඳු දහම් අසනා එක දුලබ ලොවේ
වෙනෙකෙකු මෙබඳු දේ දෙසනට සමත් නොවේ
බුදුහිමි තමයි මා ළඟ දැන් බණ දෙසුවේ
සවුවෙකු වන්න හිමි ළඟ අවසර පැතුවේ

53. හුනස්නෙහි ම ඔහු තුන්වන පල ලැබුවා
පැවිදි කරන ලෙස හිමිගෙන් ඉල්ලූවා
සපුරා පා සිවුරු ගෙන එන්නට කිවුවා
හිමි අවසරින් ඔහු එතැනින් පිට වූ වා

54. සිවුරු සොයා මග හැසිරෙන අතරතුරේ
දෙනක ඇවිත් ඇන්නා සිටි මහ පාරේ
ඔහු ඉන් මැරී වැටුනා මැද මහ පාරේ
එකෙනෙහි ඉපදුනා සුද්ධාවාස පුරේ

**(රාහුලෝවාදය)**

55. තව එක් කලෙක සැවතෙහි වැඩ සිටින්නේ
තනිවම දිනක් සුවසේ කල් ගෙවන්නේ
දැක රාහුලගෙ නැණ මෝරා තිබෙන්නේ
දැන් දම් දෙසුව හොත් නිවනම ලබන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 126 2018/8/4 8:46 AM

56. පෙරයම පිඬු පිණිස හැසිරී සිටි සේක
පසුයම රහල් හිමියන් ඇමතූ සේක
අසුනක් රැගෙන එන්නට දැන් වූ සේක
අන්ධක වනය වෙත දෙදෙනම වැඩි සේක

57. තිලකුණු දහම රාහුලහට දෙසන්නේ
දෙසුමට වඩා ප්‍රශ්නයි එහි අසන්නේ
'ඇස නියතදැ'යි රාහුල මට කියන්නේ
අනියත බවයි පිළිතුරු ලෙස කියන්නේ

58. 'අනියත යමක් වේ නම් එය සැප වේද'
'දුකමයි එයින් කෙලෙසක නම් සැප වේද'
'වෙනසට බඳුන් වෙන දුක් වූ යමක් වෙද
මම මට මගේ කියලා ගත හැකි වේද'

59. මම යැ'යි මගේ යැ'යි ගත හැකි කිසිත් නැත
රූපය වුව ද මේ ධර්මය ඉක්ම නැත
ඉන් හට ගන්න හැමට ම මෙය පොදුව ඇත
ලොව ඇති කිසිත් තිලකුණු හැර නොයනු ඇත

60. රාහුල එයින් මැනවින් සිහියට ගන්න
හැම දෙය මනා නුවණින් අතහැර යන්න
සසුනෙහි අරිය සවුවෙකු ලෙස හික්මෙන්න
හික්මී කෙලෙස් සිඳලා නිවනට යන්න

61. මේ ලෙස ප්‍රශ්න අසමින් දම් දෙසු සේක
රාහුල සමිඳු කෙලෙසුන් සුන් කළ සේක
රැස් වූ දේව ගණයට එතැනට නේක
දම් රස පොවා නිවනෙහි මග යැවු සේක



DampeTheroKaviBook_Content_20180804.indd 127 2018/8/4 8:46 AM

**(අභය හමුව)**

62. නිගණ්ඨනාථපුත් සවුවකු වූ    අභය
රජ කුමරෙක් ය කරනව වාද ද    අභය
නාථපුත්තගේ ඔවදන් ඇසූ    අභය
වාද කරන්නට හිමි වෙත ගියෙ    අභය

63. සිය නිවසෙදී වාදය කරනට    සිතුවා
බුදු සමිඳුන්ට දනකට වඩිනට    කීවා
පසුදින මනා කොට සකසා දන්    බෙදුවා
දන් දී අවසනෙහි වාදෙට මුල    පිරුවා

64. ‘හිමියනි තථාගත පැනයක් ඇත මෙ    මට
කියනෙද වදන් ඔබ අන් සිත්    රිදෙන්නට’
‘ඔව් හෝ නැතැ’යි පිළිතුරු නම් නැත    ඊට
කල් යල් බලා කියනෙමි හරි දෙය    සැමට

65. “නාථපුත්ත මෙහි දී වැනසී    යන්නේ
මෙලෙසින් පිළිතුරක් කිසිවිට    නොපතන්නේ”
“ඔබ කී දෙයෙහි මහ අරුතක්    පවතින්නේ
ඔහු වැනසුනේ ඇයිදැ’යි මට    පවසන්නේ”

66. ඔහු මට කීවෙ ඔබ හා වාදෙට    එන්න
මේ ගැන ඔබෙන් විමසාලා    දැනගන්න
යම් විදියකින් ඔව් යැ’යි පිළිතුරු    දුන්න
හොත් දොස් නගනු හිමිගේ කරුණාව    ගැන

67. නැත යැ’යි ඔබෙන් පිළිතුරු මට ලැබී    නම්
ඔබ දෙව්දත්ට කී දෙය මම    අසන්නෙමි
දෙව්දත් අපායට යන බව කියයි    නම්
ඔබ රළු වදන් පවසන බව    කියන්නෙමි



DampeTheroKaviBook_Content_20180804.indd 128    2018/8/4 8:46 AM

68. නාථපුත්තගේ උපදෙස් මෙයයි හිමි
එලෙසින් පළමු පැන මම දැන් විමසුවෙමි
අප සිතු ලෙසට පිළිතුරු නොම දුන්නෙ හිමි
එබැවින් නාථපුත් නැසුනේයැයි කියමි

69. කුමරුනි මනා කොට මේ දෙය අහගන්නේ
මා නැත අරුත් සුන් දේවල් පවසන්නේ
සැමතැන අරුත් යුතු දේ මයි පවසන්නේ
ප්‍රිය අමනාප දෙය නැත එහි සලකන්නේ

70. ඔබ උකුලෙහි නිදා ඉන්නා පොඩි දරුවා
යමක් අහුලලා තම මුව තුළ දැමුවා
උගුරේ හිර උනොත් ගෙන යන්නේ මරුවා
කවරක් කරන්නෙ ද බේරන්නට දරුවා

71. උකුළේ රුවා මුව තුළ අත දමන්නෙමි
ඇඟිලිවලින් ඇදලා එය දමන්නෙමි
කැමොර දුන්න මුත් එය ඇද දමන්නෙමි
රිදුනත් ඔහුව බේරන්නට එය කරමි

72. කුමරුනි මම ද ඔය ලෙස සවුවන් රකිමි
කටුක නමුත් ඇත්ත ම මම කියන්නෙමි
පවෙහි ගැලී මරු මුඛයට යා නො දෙමි
සිත් රිදුනාට කම් නැත බේරා ගනිමි



DampeTheroKaviBook_Content_20180804.indd 129 2018/8/4 8:46 AM

## (මාලුඞ්ඛ්‍ය පුත්තගේ පැනය)

73. කලක් දෙව්රමේ වැඩ සිටිනා සමයේ
මාලුඞ්ඛ්‍ය නම් සවුවෙක් හිමි වෙත ආයේ
හිමි පා නැමද ඔහු පසෙකින් වැඩ සිටියේ
ඉඳිමින් මෙසේ පැනයක් අසනට වූ යේ

74. හිමියනි තනිව මා ඉන්නා වෙලාවේ
ගැටළු කීපයක් මාගේ සිත පෙළුවේ
මේ හැම දෙයට විසඳුම් ඔබ දත යුතු වේ
නැතහොත් සිවුරු හැර යන්නයි මා සිතුවේ

75. ලෝකය සදාකාලික වන්නෙ ද නැති ද
ලෝකයෙ කෙළවරක් පවතීවි ද නැති ද
ජීවය හා සිරුර එක වේවි ද නැති ද
මරණින් පසුව බුදුහිමි සිටිනෙ ද නැති ද

76. පැන දහයක් මෙසේ ඇවිදින් විමසන්නේ
නියත ලෙසම පිළිතුරු දිය යුතු වෙන්නේ
එනමුත් පිළිතුරක් කිසිදා නො දෙන්නේ
ඔහුගෙන් මෙබඳු පැනයක් හිමි අසන්නේ

77. මා කීවේ ද මා ළඟ පැවිදිව ඉන්න
බැඳිලා සිටිමි මේවට පිළිතුරු දෙන්න
ඔබ කීවෙහි ද 'මේවට පිළිතුරු දෙන්න
මට හැක ඔබේ ළඟ සවුවෙකු වී ඉන්න'

78. මහණ කියන දෙය හොඳ ලෙස අහගන්න
මම නැහැ බැඳී මේවට පිළිතුරු දෙන්න
පිළිතුරු ඇතත් මේවට නිවැරදි ලෙසින
ඉන් හැකි නොවේ සංසාරෙන් ගැලවෙන්න



DampeTheroKaviBook_Content_20180804.indd 130 2018/8/4 8:46 AM

79. විෂ හී පහර කා මග වැටිලා ඉන්න
මිනිසෙකු ගෙනෙයි වෙදැදුරු හට පෙන්වන්න
ඔහු පැන අසයි වෙදුගෙන් පිළියම් කරන
පිළිතුරු ලැබෙන තුරු බැහැ පිළියම් ගන්න

80. කවුරුද එවුවෙ මේ විස හී පහර මට
ඔහු උස් මිටි ද කලු සුදුදැ'යි කියනු මට
ඔහු දැ ගොත් ද දුනු දිය ගැන කියනු මට
මේවා සොයන තුරු ඉඩ නැත පිළියමට

81. මේවට පිළිතුරක් ලබනට හැකි වේද
මේ අඳ බාල මිනිහා සුවපත් වේද
නැත හොත් මරුව ගොදුරක් කොට ගෙන යා ද
පිළිතුරු ලබන්නැතුව ම මිය යයි නේද

82. සංසාරයෙහි සැඩ පහරට ගසාගෙන
යන අය සෙවිය යුත්තේ මග ගොඩට යන
පල නැති මෙවන් දේ සිත තුළ දරාගෙන
සිටියොත් නොහැක දකිනට මග ගොඩට යන

83. දමනය කළ නොහැකි සතුන් හැම දමනය කෙරුවා
සියලු සතුන් හට සකි ලෙස නිවනට මග දෙසුවා
පුරිසදම්මසාරථී යන නමින් පිදුම් ලැබුවා
දමනය කෙරුවෙන් ඒ හැම සැමට ම සෙත සැදුවා

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**දේශනා කෞශල්‍යය නම් වූ එකොළොස්වන සර්ගය නිමි ෴**



DampeTheroKaviBook_Content_20180804.indd 131 2018/8/4 8:46 AM

DampeTheroKaviBook_Content_20180804.indd 132 2018/8/4 8:46 AM

## දොළොස්වන සර්ගය

# පුරිසදම්මසාරථී

1. බුදුගුණ දිනෙන් දින වැඩි වැඩි වී යන්නේ
සැලකිලි ලාභ බුදුහිමිහට වැඩි වෙන්නේ
දෙව්දත් දිනෙන් දින ලාබෙන් පිරිහෙන්නේ
බුදුහිමි මරා බුදු වෙන්නට සිත් වෙන්නේ

2. අජාසත්ත කුමරුන් ගොස් හමු වෙන්නේ
උපා යොදා කුමරුන්ගේ සිත ගන්නේ
පියා මරා රජ වෙන්නට පවසන්නේ
බුදුන් මරන්නට සහයෝගය ගන්නේ

3. දෙව්දත් ගුරු ලෙසට කුමරුන් සිතන්නේ
වධ දී පියා මරලා රජ කරන්නේ
දෙව්දත් කී ලෙසම කටයුතු කරන්නේ
බුදුන් නසන්නට දුනු හී යොදන්නේ

4. බුදුන් නැසීමට දුනු හී අරගන්තෝ
බුදුන් දෙසූ දහමින් සැනසුම ගත්තෝ
බුදුන් නසන උපාය වරදා ගත්තෝ
වෙනත් උපායක් යොදනට සිත් ගත්තෝ

5. දෙව්දත් ගියා ඇත් පල්ලා හමු වෙන්න
ගිහින් උනා නාලාගිරි ඉල්ලන්න
යුදයට සමත් නාලාගිරි මට දෙන්න
රජුගේ අවසරය මට පුලුවනි ගන්න

6. වෛරිවන තුරු ම ඇතු හට රා පෙවිය යුතු
වෛරි වූ ඇතුට හෙණ්ඩුවකින් ඇනිය යුතු
ඇනලා ඇතා කෝපෙට පත් කෙරුව යුතු
හෙට දින බුදුන් ඉදිරියටම යැවිය යුතු

7. රන් හන්සයන් පිරිවරනා ලදුව යන
රාජ හංසයන් මෙන් සොබමන් ගමන
මහසඞ් පිරිස පිරිවරමින් පිඬු සිඟන
බුදු හිමි උදේ කල එම මාවත වඩින

8. දෙව්දත් කියපු ලෙස රා දී මත් කරලා
ඇනලා හෙණ්ඩුවෙන් කෝපය වැඩි කරලා
හිමි එන පෙර මගට නාලාගිරි යවලා
කලබල කරයි මග දිග හැම පොඩි කරලා

9. දූවිලි අවුස්සයි වියරුව දුව පැනලා
දළින් බිඳියි අහුවෙන හැම දේ ඇනලා
මකුළු දැලක් මෙන් දම්වැල් බිඳ දමලා
කෝපෙන් දුවයි අහුවෙන හැම දෙන මරලා

10. ඉසිගිලි පච්ච පෙරලිගෙන එන ලෙසට
තලා පෙලා හමුවෙන දේ මග දිගට
ඇතු දුව එද්දි බැස සිටි දන මහ මගට
එහෙ මෙහෙ දුවති බිය වී ළඟ එන මරුට

11. වෛරි වී කෝප වූ ධනපල් ඒ පැත්තේ
නිමිලා සිහිල් වූ බුදුහිමි මේ පැත්තේ
ඇතු නවතන්න කිසිවෙක් හෝ එහි නැත්තේ
හිමි නවතන්න සමතෙක් තුන්ලොව නැත්තේ



DampeTheroKaviBook_Content_20180804.indd 134 2018/8/4 8:46 AM

12. දුටු දුටු දනා සිහිසුන් වී ඇද වැටෙනා
ඇසු ඇසු දනා බිය වී වෙවුලා යන්නා
කෙනෙක් සිතති ඇතු අද බුදු හිමි නසනා
තවෙකෙක් සිතති බුදු හිමි අද ජය ලබනා

13. මහ මේ කුළක් ලෙස හයියෙන් නද දෙන්නා
බුදු හිමි සමීපෙට ඇතු දැන් ළං වෙන්නා
අනඳ තෙරුන් වහ වහ අතරට පැන්නා
බුදු හිමි එ සඳ ඒ හිමියන් වලකන්නා

14. එබ්බා ඇතුනි! මා පිණිසය නුඹ එවුවේ
වෙනෙකෙකු නසනු අද දින නම් යුතු නොම වේ
ඇසු එවදනින් ඇතුගේ සිත සුවපත් වේ
හිමි ළඟ වැටී කරුණාවෙන් තව නැහැවේ

**(අංගුලිමාල දමනය)**

15. සැවතෙහි දෙව්රමෙහි වාසය කරන්නේ
කොසොල් රජුගෙ පෙරෙවිය භග්ගව වෙන්නේ
ඔහු පිය බිරිඳ පුත් කුමරෙක් වදන්නේ
අමුතු යමක් ඒ දිනයෙදි සිදු වෙන්නේ

16. ඉපදුණු දිනෙහි සැම තැන අවි දිලෙන්නේ
එහෙත් එයින් කිසිවෙකු නැහැ මැරෙන්නේ
පුතුට අහිංසක යැයි නම් කරන්නේ
දෙනෙත් සදිසි කොට සිය පුතු රකින්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 135 2018/8/4 8:46 AM

17. කුමරු ටිකෙන් ටික වයසින් වැඩි වෙනවා
සිප්සත ලබන නිසි වයසට පත් වෙනවා
තක්ෂලාවෙ ඇදුරෙක් වෙත ගෙන යනවා
සිල්ප සතර ඉගෙනීමට අරඹනවා

18. කලට නියම වැඩ ටික නිම කරන්නේ
බසට ගුරුගෙ කීකරු වී සිටින්නේ
සැමට කලින් අවදිව වැඩ කරන්නේ
සැමට කලින් පාඩම් වැඩ කරන්නේ

19. ඡන්දස් වේද කටපාඩම් කරන්නේ
ඉතිහාසය ද වියරණ ඈ උගන්නේ
නීති සතර ඔහු මැනවින් කියන්නේ
කෙනෙකු නො මැත ඔහු හට සම කරන්නේ

20. පාඩම්වලදී ඔහු පෙරමුණ අර ගන්නේ
අරමුණ හොඳින් එහි ඉගෙනුම කරන්නේ
සමතෙකු ලෙසට නිවෙසේ වැඩ කරන්නේ
ගුරු ගෙදරදී බොහො වැඩ ඔහු කරන්නේ

21. වළං පිඟන් සෝදා දර පලන්නේ
වතුර ගෙනත් බීමට පැන් තබන්නේ
මවක ලෙසින් ගුරු බිරිඳව දකින්නේ
ඇය ද ඔහුව දරුවෙකු මෙන් දකින්නේ

22. පාඩම්වලදී ඔහු පෙරමුණ අර ගන්නේ
ගුරු සිත හැමවිටම ඔහුමය දිනන්නේ
නිවසේ වැඩට සහයෝගය ලැබ දෙන්නේ
ගුරුගෙයි සියලු දෙනගේ සිත් අර ගන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 136 2018/8/4 8:46 AM

23. ඉරිසියාව අන් සිසුනගෙ සිත් දවනා
අහිංසකව උන් ටික ටික කොන් කරනා
වැඩ බැරි උන්ට ඇති එක ආයුධය මනා
බොරුවෙන් කේලමෙන් ජය ලබනට සිතනා

24. ආවේ සැවො ම මෙහි සිල්පය උගන්නට
කුස්සියෙ වැඩට නිතර ම යන්නේ කුමට
වෙනත් හේතුවක් සැබැවින් ඇත එයට
ආලය කරයි ඔහු ගුරු බිරිඳගෙ රුවට

25. දෙදෙනා කුස්සියෙදි නිතර ම හමු වෙන්නේ
රහසේ වෙනත් දේ එහි දී සිදු වෙන්නේ
ඇදුරනි කේලමක් නොව අප පවසන්නේ
බිරිඳ ව අහිංසකගෙන් බේරා ගන්නේ

26. එක එක්කෙනා නිතර ම ගුරු හමුවෙන්නේ
හමු වී වරින් වර මේ ලෙස පවසන්නේ
නිතර ම ඔහුට එක බොරුව ම පවසන්නේ
මෙලෙසට ටිකෙන් ටික ගුරු සිත බිඳලන්නේ

27. අහිංසකව මින් පිටමං කළ යුතුය
නසනට උපායක් දැන් සිහි කළ යුතුය
වෙනෙකෙකුගේ අතින් මොහු මැරවිය යුතුය
මිනිසුන් මරන්නට මොහු යොමු කළ යුතුය

28. අහිංසකව ගුරු හමුවට කැඳවන්නේ
සිල්ප ලබා දී ඉවරයි පවසන්නේ
පඬුරු පිඬිස දිය යුතු දැ විමසන්නේ
ඇඟිලි දහක මාලයකුයි ඉල්ලන්නේ

29. මිනිසකු මරා එක අතැඟිල්ලක් ගන්නේ
දහසක් දෙනා මරලා එය සකසන්නේ
කඩුවක් අරන් වනයට වැද සැඟවෙන්නේ
හමුවෙන සියලු දෙන මරලා සඟවන්නේ

30. දරට ගියපු ගැහැනුන් යළි නැත ආවේ
එමගින් ගියපු වෙළෙඳුන්ගේ දිවි තොරවේ
අකුරට එ මග ගිය දරුවෝ නැත ආවේ
ඔහු දුටු සියලු දෙන කපලාමයි මැරුවේ

31. එ මග යන්න හැමදෙන දැන් බිය වෙන්නේ
ඔහු ගැන කථා මුළු නුවර ම පැතිරෙන්නේ
ඇඟිලි මාලයක් ඔහු කර පළඳින්නේ
දුටු කිසි කෙනෙකු නැහැ ඔහුගෙන් ගැලවෙන්නේ

32. රජු හට සැල උනා ඔහු ගැන සියලු තතු
අල්ලා අඟුල්මල් මරලා දැමිය යුතු
මවට ද සැල උනා පුතු ගැන සියලු තතු
පිට වී ගියා සොයනට පුතු සෙනෙහෙ යුතු

33. බුදුහිමි සමවතින් අලුයම ලොව බලන
දුටුවා අඟුල්මල් වනයේ මිනි මරණ
ඇසුවොත් දහම් පද කරුණාවෙන් දෙසන
නිසැකව ලබන්නේ ඔහු එතැනදි නිවන

34. දහසට එකකි දැන් නම් අඩු වී ඇත්තේ
මව හෝ මරා එය සපුරා ගනු ඇත්තේ
ගිලිහී නිවන් මග නිරයට යනු ඇත්තේ
කරුණා සිතින් හිමි එම මග බැස ගත්තේ



DampeTheroKaviBook_Content_20180804.indd 138 2018/8/4 8:46 AM

35. වනයට වැඩිය බුදු හිමි ඔහු නෙත ගැටුණා
මහණා, මරා අද ගුරු පුද සපුරන්නා
මේ ලෙස සිතා හිමි පසු පස්සේ දුවනා
අදිටන් බලෙන් හිමි ඔහු තව දුර කරනා

36. වෙහෙසට පත් ව ඔහු ටිකකින් නවතින්නේ
ජව ඇති මෙමට කිම ඔහු තව දුර වෙන්නේ
මහණ! වහා නවතිනු යැයි පවසන්නේ
බුදුහිමි ඔහුට මේ ලෙස පිළිතුරු දෙන්නේ

37. අංගුලිමාල මම නැවතී සිටින්නෙමි
ඔබ නැවතුනේ නැති බව මම දකින්නෙමි
ඔබ තව දුවන්නේ ඇයි දැයි අසන්නෙමි
එනිසා ඔබට නවතින්ට කියන්නෙමි

38. මහණුන් කිසිදු විට බොරු නම් නොකියන්නේ
කිම ඔහු යමින් නැවතුණ බව පවසන්නේ
නැවතුණු මෙමට කිම නවතිනු පවසන්නේ
සැඟවුණු අරුත මට පහදාලා දෙන්නේ

39. සසරෙහි සියළු බැමි බිඳලා දැමූවෙමි
එනිසා සසර ගමන ද මම නැවතුවෙමි
පර පණ නසන ඔබ තව එහි බව දකිමි
දැන් එය නවතන්න කාලය බව කියමි

40. බුදුහිමි දෙසූ දම් පද වටහා ගත්තේ
හිරු දුටු පියුම ලෙස විකසිත විය චිත්තේ
අවි බිම දමා බුදු හිමිගේ මග ගත්තේ
බුදු බණ අසා නිවනෙහි සුව විඳ ගත්තේ



DampeTheroKaviBook_Content_20180804.indd 139 2018/8/4 8:46 AM

**(ආලවක දමනය)**

41. කලෙකදි අලවි රට වාසය කරන්නේ
යකෙක් විසී ආලවකැ'යි නමින්නේ
මිනිසුන් මරා කා දිවි සරි කරන්නේ
දිනකට කෙනෙකු යකු හට කැප කරන්නේ

42. අලුයම දිනක් බුදුහිමි ලොව බලන කල
දුටුවේ අලවු යකු අද දින ලබන පල
එලෙස ම බොහෝ දෙන ලබනව දහමෙ පල
හිමි එහි වැඩියෙ යකු විමනෙහි නොමැති කල

43. අතවැසි යකෙකු හිමි හමුවට පැමිණෙන්නේ
ඇවිත් මෙලෙස අණතුරකුත් අඟවන්නේ
එම්බා තවුස මින් පිටමං වී යන්නේ
යකු ආවොතින් නැහැ ගැලවීමක් වෙන්නේ

44. මම මින් නොයමි උන්හට බිය නොවන්නෙමි
අතවැසි යකුනි ඒ ගැන නොතැවෙනු කියමි
අලවු යකුව අද දමනය කරන්නෙමි
පසෙකට වෙලා බලනට අණ කරන්නෙමි

45. හිමි සමවතෙන් යක් විමනෙහි වැඩ ඉන්නේ
ටිකකින් අලවු යකු විමනට පැමිණෙන්නේ
හිමි දුටු යකා කෝපෙන් වෙවුලා යන්නේ
රත් වූ දෙනෙත් කෝපෙන් ගිනියම් වෙන්නේ

46. එම්බා මහණ ඔය අසුනෙන් යව නැගිට
එලියට යනුව මාගේ විමනෙහි නොසිට
හිමි පිට උනා අවනත වීලා යකුට
යළි පැවසුවා එනු නැවතත් ගේ තුළට



DampeTheroKaviBook_Content_20180804.indd 140 2018/8/4 8:46 AM

47. හිමි පැමිණිලා නැවතත් එහි වැඩ ඉන්නේ
බුදුහිමි වෙහෙස කරනට යකු සැරසෙන්නේ
තෙවරක් මෙලෙස හිමි පිටමං කරන්නේ
ඔහුගේ සිතැඟි හිමි මැනවින් දකින්නේ

48. සිවු වැනි වරට ඔහු යලි අණ කරන්නේ
බුදු හිමි ඔහුට යලි කීකරු නොවෙන්නේ
කළ හැකි යමක් ඇත්නම් මට කරන්නේ
මා නැහැ නැවත ඔබ කී දෙය කරන්නේ

49. පැනයක් අසා වෙහෙසට පත් කළ යුතු ය
මා මේ ලෙසට සමණා විමසිය යුතු ය
පැනයක් අසමි මට පිළිතුරු දිය යුතු ය
නැතහොත් ඔබට කරනා දෙය දත යුතු ය

50. හදවත ඉරා මරලා නුඹෙ දමන්නෙමි
හිත නුඹෙ අවුල් කරලා මම දමන්නෙමි
දෙපයින් අරන් පරතෙර විසි කරන්නෙමි
පොළොවේ ගසා තා මරලා දමන්නෙමි

51. කිසිවෙකු නොමැත මාගේ සිත පෙළන්නට
කවරෙකු සමත් වෙද පර තෙර දමන්නට
තුන්ලොව කවුරුවත් නම් නැත මා මරන්නට
නුඹගේ පැනය ඉක්මන් කර කියනු මට

52. මිනිසුන් සතුව ඇති උත්තම ධනය කිම
සුවගෙන දෙවන මේ ලොව ඇති කරුණ කිම
රසයන් අතර උත්තම වූ රසය කිම
උතුම් දිවියකට මුල් වූ කරුණ කිම



DampeTheroKaviBook_Content_20180804.indd 141 2018/8/4 8:46 AM

53. සැදැහැව උතුම් දනයයි මිනිසුන්ට ඇති
දහමින් නිතර හැම දන සුවයම ලබති
රසයන් අතර සත්‍යට මුල් තැනක් ඇති
පැණවත් දිවිය උත්තම දිවියයි කියති

54. කුමකින් ගලන සැඩ පහරින් එතෙර වෙමු
කෙලෙසක සසර සාගරයෙන් ගොඩට යමු
කෙලෙසක සසර දුක් සිඳ බිඳලා දමමු
කුමක් නිසා අපි පිරිසිදු බව ලබමු

55. නැණ දන නුවන් ලැබ ගන්නේ කෙලෙසක ද
කිත් යස මිතුරු සම්පත් ලබනේ කවුද
මරණින් මතුව කෙලෙසින් සොව නැති වෙයිද
මෙ හැම දේට දැන් පිළිතුරු දෙනවා ද

56. නොපමා බවින් යුතු ව ම දන නැණ ලබති
විරියෙන් යුතු කෙනා සියලු ම දන ලබති
ඇත්ත කථා කොට කිත් පැසසුම් ලබති
දන්දෙන දනා නිරතුරු මිතුරන් ලබති

57. කෙනෙකු ඇත්ත නිරතුරව ම පවසයි ද
දහම ද විරිය නිරතුරු ඔහු වෙත වෙයි ද
දීමෙන් නිතර තුටු සිත් ඇති කරවයි ද
පරලොව සතුටු වෙන්නට මෙය ඇති නේද

58. ඉඳුරන් දැමීම ද ඇත්ත ද යන මේවා
දන් පින් කිරීම ද ඉවසීම ද වේවා
මේ සිවු දහම උත්තම ගණයේ ඒවා
මෙයටත් වඩා දහමක් නම් තව නැතුවා



DampeTheroKaviBook_Content_20180804.indd 142 2018/8/4 8:46 AM

59. මට වැඩ පිණිස හිමි මෙහි වැඩි බව දනිමි
අඳුර නිවන්නට පහනක් බව දනිමි
යටිකුරු යමක් උඩුකුරු වූ බව දනිමි
අද සිට මම ද තෙරුවන් පිහිට ම පතමි

**(සුචිරෝම හා කරරෝම දමනය)**

60. දිනක් උදෑසන බුදුහිමි ලොව බලන
දුටුවේ මිතුරු වූ යක් සෙනෙවියො දෙදෙන
ගයා හිසෙහි ඇති සුචිරෝම ගෙ බවන
සොයා වඩිති බුදු හිමියෝ උදෑසන

61. හිමි වැඩ ඔහුගෙ ගල් ලෙන තුළ වැඩ ඉන්නේ
එතැනින් යද්දි ඛරරෝමගෙ නෙත ගැටුණේ
ඒ බව ගොසින් මිතුරා හට පවසන්නේ
දෙදෙන ම වහා ඒ අසලට පැමිණෙන්නේ

62. සුචිරෝමයා බුදුහිමියන් වෙත යනවා
එම්බා මහණ! මට බියදැයි විමසනවා
බිය නොම දනිමි පිළිකුල නම් ඇති වෙනවා
හිමි මේ ලෙසට ඔහු හට පිළිතුරු දෙනවා

63. පිළිතුරු දෙන්න පැනයක් මම අසන්නෙමි
නැත හොත් ඔබව මරලා මෙහි දමන්නෙමි
සිහිය ද විකල් කර හදවත පලන්නෙමි
දෙපයින් අරන් පරතෙර විසි කරන්නෙමි



DampeTheroKaviBook_Content_20180804.indd 143 2018/8/4 8:46 AM

64. බුදුවරු මරන්නට කවුරුන් සමත් වෙද
සිහිය විකල් කරනට තට හැකි වේද
එතෙරට වීසි කරනේ නුඹ කෙලෙසක ද
ඇති නම් යමක් ඇසීම එය යුතු වේද

65. රාග දෝස ඇයි සිත තුළ හට ගන්නේ
කුමක් නිසා කම් පල නොම පිළිගන්නේ
බියට හේතු වෙන දෙය දැන් පවසන්නේ
කවරක් නිසා අපගේ සිත කැළඹෙන්නේ

66. උපත නිසා රා දොස් සිත තුළ වෙන්නේ
එනිසා තමයි කම් පල නොම පිළිගන්නේ
බිය ඇති වෙන්න ඉපදීමයි මුල් වෙන්නේ
ඉපදුන නිසාමයි අප සිත කැළඹෙන්නේ

67. නුවණැති දනා වෙහෙස ව එය සිඳලන්නේ
උපත නසා මේ හැම දුරු කර ලන්නේ
මෙය සා ඔවුන් සෝවන් පල ලැබ ගන්නේ
බුදුහිමි දෙසූ දහමින් උන් සැනසෙන්නේ

**(සච්චක දමනය)**

68. විසාලාවෙ වැඩ වසනා කාලයෙ දී
දරුපස් දෙනෙක් වූ පවුලක මහ වාදී
සච්චක එක ම පුතු කිසිදා නොම පරදී
අස්සජි තෙරුන් හමු වූ වේ මහ මග දී



DampeTheroKaviBook_Content_20180804.indd 144 2018/8/4 8:46 AM

69. "හිතවත් අස්සජි හිමියනි අසනු මැන
පිංවත් ගොයුම්ගේ සදහම කියනු මැන
කවරක් කියා කරනෙද සවුවන් දමන
දැන ගනු රිසිමි පහදා මට කියනු මැන"

70. පස් කඳ අනියතයි ඒ ගැන කියන්නේ
අනියත දෙයින් දුකමයි ඇති කරන්නේ
එනිසා අනත් වන බව හිමියන් දෙසන්නේ
මේ ලෙස දෙසා සවුවන් හික්ම වන්නේ

71. "හිතවත බොහෝ අඩුතැන් මේ තුළ ඇත්තේ
ගොයුම් සමග වාදයකට සිත ඇත්තේ
වාදෙන් දිනා මේ මත බිඳලිය යුත්තේ
ඔහු ඉන් පැරද මා අත වැසි විය යුත්තේ"

72. "මා හා වාද කරනට එන සියලු දෙන
ගත වෙවුලවා සිහිසුන් වී බිම වැටෙන
සිත් නැති ගලක් වුව මා වාදය අසන
වෙවුලා යද්දි මිනිසුන් ගැන කිම කියන"

73. පුරසාරම් කියා බුදු හිමි වෙත යන්නේ
රූපය අනත් බව පිළිකෙව් කරලන්නේ
පොළොවේ සියලු දෙය රැඳිලා තියෙන්නේ
එලෙසින් සියලු දේ රූපෙන් රඳන්නේ

74. "සිහි එළවලා ම ද ඔබ මෙය කියන්නේ
රූපය ආත්මය බවම ද කියන්නේ"
"රූපය ආත්මය බව මම කියන්නේ
කිසි ලෙසකිනුත් එය බැහැ බොරු කරන්නේ"



DampeTheroKaviBook_Content_20180804.indd 145 2018/8/4 8:46 AM

75. "රූපය වෙනස් වෙනවට ඔබ කැමතියි ද
එනමුත් ඔබට රිසි ලෙස එය පවතියි ද
අකමැති දෙයක් රූපෙට නොම වෙන්නේ ද
ඔබ සිතූ දෙය ම පමණක් එහි සිදු වේ ද"

76. තෙවරක් මෙලෙස සච්චකගෙන් විමසන්නේ
හිමි ඇසූ දෙයට සච්චක ගොළු වී යන්නේ
තොල කට වියලිලා දහදිය බේරෙන්නේ
රජ සිටු පිරිස මැද ඔහු අද පරදින්නේ

77. රූපය අනත් බව ඔහු වටහා ගන්නේ
උවසු ලෙසට තෙරුවන් සරණය ගන්නේ
දන් දී නිතර පින් කම් සිදු කර ගන්නේ
නිරතුරු පැමිණ හිමි ඔවදන් පිළිගන්නේ

78. දිගින් දිගට ම පෙරම් පිරුවේ උතුම් බුදු බව ලබන්නයි
සොයා මිනිසුන් ගමන් වැඩියේ ඔවුන් සසරින් මුදන්නයි
දරුණු මිනිසුන් හිමිගෙ සෙවනේ ලබන්නේ සිහිලසක් මයි
මහා කරුණා බුදු ගුණය ඇති බැවින් හිමි ජය ලබත් මයි

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**පුරිසදම්මසාරථී නම් වූ දොළොස්වන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 146 2018/8/4 8:46 AM

## දහතුන්වන සර්ගය

# මහා කරුණා

1. බුදු හිමියන්ගෙ කරුණාවට සම වෙන්නේ
තව බුදු කෙනෙක් පමණයි එය දැන ගන්නේ
සැමට ම එක ම කරුණාවයි දක් වන්නේ
කරුණා දියෙන් සැමදා ලොව නහවන්නේ

**(සෝපාක)**

2. රජගහ නුවර දුප්පත් අසරණ ගෙයක
ළමයෙක් විසී නම ඔහුගේ සෝපාක
පියා නොමැති ඔහු හට අත් වූයෙ දුක
සුළු පිය ඔහුට නිරතුරුව ම දුන්නෙ දුක

3. දිනක් ඔහුව සොහොනට අරගෙන යනවා
මිනියක තබා බැඳලා ඔහු නික් මෙනවා
මහ රෑ බියෙන් මහ හයියෙන් මොරදෙනවා
කරුණා දැලට බුදුහිමිගේ පැටලෙනවා

4. ඔහුවෙත සිහිල් බුදුරුස් විහිදුවන්නේ
බැමි හැම එක ම බුදු බලයෙන් බිඳෙන්නේ
බුදුරැස් දිගේ ඔහු හිමිහිට ඇදෙන්නේ
බුදු බණ අසා සෝවන් පල ලබන්නේ

5. පුතු සොය සොයා මව සෝකෙන් දුවන්නේ
අවසන වෙහෙර තුළ දී පුතු දකින්නේ
හිමි දෙසු බණට ඇයගේ සිත යොමන්නේ
සෝවන් පලය ඒ තැන දි ම ලබන්නේ

6. විය සත්වසක් විය සෝපාකට මෙදින
අරහත් පලය ලබනට තිබුනේය පින
දස පැනයකට පිළිතුරු දීලා සොඳින
ළදරු වයසෙ දී උපසපුව ද ලැබිණ

**(සුනීත)**

7. මහ බඹු මුවින් ඉපදුණු දන උසස් වෙති
උන් බාහුවෙන් ඉපදුණු දන රජ කරති
කලවෙන් උපන් දන හැම වෙළඳම් කරති
දෙපයින් උපන්නේ නම් උන් සැඩොල් වෙති

8. වර දන් උසස් උන්ට ම යැයි කී කලෙක
නිවනත් උන්ට පමණක් යැයි කී කලෙක
මෙලෙසට බමුණු මත පැතිරී තිබු කලෙක
සැඩොලන් සසුන් ගත කෙරුවා හිමි නොයෙක

9. බුදුහිමි දිනක් රජගහ වැඩ ඉන්න කල
ගෙන් ගෙට වඩිති පිඬු සිඟමින් උදේ කල
හිමි පෙර මගට එයි සැඩොලෙක් ගෙන කසළ
හිමි දුටු සැනින් බැස ගති අගලට අසල

10. සුකොමල රාජ ලීලාවෙන් බබලන්නේ
දැන් දැන් ටිකෙන් ටික ළඟ ළඟට ම එන්නේ
කුලවත් උතුම දැන් මට දඬුවම් දෙන්නේ
බිය තව තවත් ටික ටික වැඩි වී යන්නේ

11. මරණය ළං ව එන්නේ යැයි බිය වෙන්නේ
කසයෙන් තළා හෝ සිරුරට වද දෙන්නේ
දඟගෙයි දමා දුක් විඳිනට සිදු වෙන්නේ
නෙත් යුග පියා මෙලෙසට සිතමින් ඉන්නේ

12. "සුනීත කිම ද මෙලෙසට බිය වී ඉන්නේ"
දෙසවන් කාරුණික වදනින් පුරවන්නේ
කිසිවෙකු නො මැත පෙර මේ ලෙස අමතන්නේ
නෙත් යුග ඔහුගෙ තුටු කඳුලින් පුරවන්නේ

13. "බිය වී මෙලෙස ගුලි වී ඉන්නේ කිම ද
සැඩොලෙකු වුව ද ඔබ අප මිනිසුන් නොවෙ ද
ලෙඩ දුක් ජාති ඈ සැමට ම පොදු නේද
සසරෙහි දුකට ඇත්තේ නැහැ කුල බේද"

14. සුනීත දහම් අසලා සිත සනසන්නේ
මුහුණෙහි අලුත් එළියක් ඉන් ඇති වෙන්නේ
කුලයෙහි පහත් බව නැහැ බාධා වෙන්නේ
නිවනෙහි රසය විඳ ගන්නට හැකි වෙන්නේ

15. "ඔබ කැමතියි ද සසුනට ඇතුලත් වෙන්න
කුලයෙහි පහත් බව මෙහි දී නොතකන්න
සැමට ම හැකිය මෙහි බඹසර හැසිරෙන්න
එබැවින් මහණ මෙහි වුත් නිවනට යන්න"



DampeTheroKaviBook_Content_20180804.indd 149 2018/8/4 8:46 AM

## (රජ්ජු මාලා)

16. ගයා පෙදෙසෙ ධනවත් සිටු කුල ගෙයක
මෙහෙකාරියක සිටියා වැඩපලට නෙක
කොණ්ඩෙන් ඇදල වද දෙයි සිටු දුව නොයෙක
ඇය දෙන වේදනා ඉවසීමට නොහැක

17. කොණ්ඩය කපා ගෙල රැහැනක් බඳින්නේ
ඉන් ඇදලාය දැන් ඇය හට තලන්නේ
බෙල්ලෙ බැඳපු රැහැනක් ඇති නිසානේ
මාලට රජ්ජුමාලා යැයි කියන්නේ

18. හැමදා තැලුම් කන්නට අයියෝ නොහැක
ගහනා ගැහිලි නම් තව ඉවසනු නොහැක
දිවියෙන් මිදුන විට සැනසුම ලැබිය හැක
සිය දිවි නසා ගෙන නිම කළ යුතුය දුක

19. දිය ගෙන එන්න ඇය ගෙදරින් පිට වෙන්නී
වනයට ගොසින් එල්ලී මැරෙනට යන්නී
ඇය බුදු හිමිගෙ කරුණාවට හසු වෙන්නී
රුක් මුල වැඩ හිඳින බුදු හිමි දකින්නී

20. නැගණිය සසර දුක මැනවින් දැකිය යුතු
එය හැම දුකට වැඩි බව දැන ගත ම යුතු
දුක් හැම නසන්නට ජීවත් විය ම යුතු
එනිසා දිවියෙ වටිනා බව දැකිය යුතු

21. හිමි මේ ලෙසට ඇය හට දම් දෙසන්නේ
ඇය දම් අසා සෝවන් පල ලබන්නේ
වතුරත් අරන් මැදුරට පිය නගන්නේ
මුහුණෙහි සිරිය සිටු දුව ඇගෙ දකින්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 150 2018/8/4 8:46 AM

22. දියණිය ඔබේ මුව අද පින්වත් පාටයි
යම් සැනසුමක් ලැබූ බව මුහුණෙන් දිස් වෙයි
හේතුව කුමක් දැයි දැන ගන්නට කැමතියි
ඔබගේ සතුට අපට ද අද ලද හැකිවෙයි

23. බුදු හිමි සොයා සිටු දුව වනයට යනවා
බුදු හිමි බණ අසා ඇගේ සිත සැනසෙනවා
දියණිය ලෙසට මාලා හට සලකනවා
මරණින් මතුව මාලා දෙව් ලොව යනවා

## (පටාචාරා)

24. සැවැත් නුවර ධනවත් තව සිටු ගෙයක
වූවා පටාචාරා නම් දියණියක
මෙහෙකරුවකු සමග පැටලී ලා පෙමක
මැදුරෙන් ගියා පැනලා හඳ ඇති රැයක

25. සතුටින් කලක් ජීවත් වූවා දෙන්නා
කුළුඳුල් දරුව ලැබ දෙවසක් ගත වෙන්නා
නැවතත් පටාචාරට ගැබ් පිහිටන්නා
මව් පියො දකින්නට ඈ හට සිත් වෙන්නා

26. අදහස සිතේ ඇති දෙය සැමියට කිවුවා
මගට අවැසි සැම දේ පිළියෙල කෙරුවා
දෑකට වඩාගෙන ආදර ලොකු දරුවා
සැමියා සමග සැවතට යන මග බටුවා



DampeTheroKaviBook_Content_20180804.indd 151 2018/8/4 8:46 AM

27. මුඩු බිම් සාර බිම් කෙත් වතු පහු කරවා
මහ වන වගුරු බිම් කෙත් වතු පහු කරවා
මව් පිය සෙනෙහසේ උණුසුම සිහි කරවා
හිමිහිට පියමනියි දරුවකු කුස රඳවා

28. මගදී ඇයට ගත වාරුව නැති වෙනවා
දරු ගැබ බරයි තව නම් දරණට බැරුවා
දරුවා ලැබෙන බව සැමියට පවසනවා
මහ මග මෙලෙස දරුවා ලබනට වෙනවා

29. මේ ලෙස මගදි ඇය දරුවා ලබන්නේ
මහවැස්සක් මගදී ඇද හැලෙන්නේ
සෙවනක් සදන්නට අතු ඉති සොයන්නේ
සැමිය මදක් දුරකට පිය මනින්නේ

30. නොසිතු යමක් ඒ මග දී සිදු වෙන්නේ
විෂකුරු නයෙකුගේ පහරට ලක් වෙන්නේ
සැමියා එතැන දි ම නෙත් පියවා ගන්නේ
කණවැන්දුම් ව ඇය එතැනින් පිට වෙන්නේ

31. තුරුලේ සිටින බිළිඳාගේ මුව බැලුවා
ඇඬුමෙන් සෝ දුකෙන් නෙත කඳුලැලි සැලුවා
රෙදි පොට අතින් අල්ලාගෙන ලොකු දරුවා
මව පසුපසින් හිමිහිට පිය මං කෙරුවා

32. යන විට මදක් දුර ඇවිදන් මේ ලෙසට
පැමිණියෙ අචිරවති ගං ඉවුරේ ළඟට
මහවැසි නිසා ගඟ දිය විය සැඩ වෙන්ට
නො හැකිය තිදෙන ගොඩ යන්නට එක වරට

33. පළමුව චූටි පුතු එගොඩට ගෙන යන්නේ
ලොකු පුතු මෙගොඩ අම්මා එනතුරු ඉන්නේ
දරුවන් දෙපැත්තේ මව ගඟ මැද ඉන්නේ
නොසිතූ අකරතැබ්බකි එතනදි වෙන්නේ

34. පොඩි පුතු උකුස්සෙක් මෙගොඩදි ගෙන යනවා
ඈ අත් ගසා මහ හයියෙන් මොර දෙනවා
අම්මා අඬ ගසන්නී යැයි පුතු සිතුවා
ගලනා මහා සැඩ පහරට පය දැමුවා

35. තණ පත් විලස සැඩ දිය පහරට වැටුණ
මොරදෙන පුතු ද ගෙන දිය පහළට ඇදුණ
ගඟ මැද ඉදන් පුතුනගෙ මළ ගම දකින
මව් සිත හැකි වේද මේ සෝකය දරන

36. අඬමින් වැළපෙමින් යළි මෙගොඩට ආවා
බෙනෙමින් සෝක තෙපුලන් කඳුලැලි සැලුවා
එක පිළිසරණ දූන් ඇය මව් පියෝ සෙව්වා
එනමුත් තවත් දුක් පුවතක් සැළ වෙනවා

37. රෑ වට වැස්ස ගං දැලම යට කෙරුවා
සිටු මාළිගය මහ ගංවතුරෙන් කැඩුවා
මව්පියො සොයුරු එකටයි ගෙන ගියෙ මරුවා
එක දර සෑයෙ තිදෙනම එක වර දැවුවා

38. සපු දළ පහර කා සැමියා මිය ඇදුණා
ලොකු පුතු මහා සැඩ පහරට ඇද වැටුණා
පොඩි පුතු උකුස්සෙකුගේ ගොදුරක් වන්නා
අසරණ පටාචාරා පාරට වැටුණා



DampeTheroKaviBook_Content_20180804.indd 153 2018/8/4 8:46 AM

39. මව්පියො දෙදෙන ගං වතුරට මිය ඇදුණා
සොයුරුද මව් පියන් හා එක් වී ඉන්නා
සිහියෙන් පටාචාරා තොර වී යන්නා
ඇඳි වත ලිහී බිම වට බව නොම දන්නා

40. මග දුටු කුඩා දරුවෙකු ඇය වඩා ගනී
මිනිසුන් වට ව ගුටි බැට දී එළව ගනී
විකල් සිහිය ඇති ඇය තැන තැන යන්නී
සිහි විකලෙන් ම බුදු හිමි හමුවට යන්නී

41. නැඟණිය සිහිය හොද හැටි පිහිටා ගන්න
කරුණා බර වදන් ඇයගේ කණ වැකුණ
එකෙණෙහි සිහිය ලැබ ගත්තා ඇය සොඳින
කෙනෙකු දුන්න සළුවෙන් ඇය ගත වැසිණ

42. හිමි දෙසු වදන් ඇයගේ නුවණට වැටුණා
දුකෙන් මිදෙන මාවත ඇය පිළිපන්නා
උතුම් මෙහෙණි සසුනේ පැවිදි ව ඉන්නා
ඇය නිරතුරු ව සිහි නුවණින් වැඩ ඉන්නා

43. පා සේදූ ජලය යයි බිම ගලා ගෙන
ගොස් නැවතුනා තරමක් දුර ගලා ගෙන
අනියත වටහ ගති ඇය සිහියෙන් සිටින
රහත් ව නසා දැමුවා බියකරු ගමන

## (අසරණ බමුණා)

44. සැවතෙහි මහා ධනවත් බමුණෙක් සිටියා
පුතුන් සතර දෙනෙකුට ඔහු වීය පියා
සිල්ප සතර මැනවින් දුන්නේය කියා
සිරිතට අනුව බිරියන්වද දුන්නෙ සොයා

45. ලක්‍ෂය බැගින් වස්තුව දීලා උන්ට
බිරිඳත් සමඟ විය සතුටින් වසන්නට
ටික කාලෙකින් ඇය වැඩියා පරළොවට
බමුණා උනා ගෙයි තනියම වාසයට

46. පුතු සිවුදෙනා පිය ධනයට ලොබ වෙන්නේ
චාටු බසින් ඒ හැම දෙය අරගන්නේ
ලොකුපුතු නිවසෙ ටික දවසක් ගත වෙන්නේ
මැනවින් ටික කලක් පියහට සලකන්නේ

47. කල් ගත වෙද්දි සැලකිලි අඩු වී යනවා
කෑම බීම පිළිගන්වනු දැන් නැතුවා
කුසගිනි වෙද්දි මුළුතැන්ගේ වෙත යනවා
බඳුනෙහි ඉතුරු දේ හූරාගෙන කනවා

48. ටික දවසකින් ඉඳුල ද නැති වී යනවා
ලේලිය බඳුන් කල් ඇතුව ම හෝදනවා
අහරට යමක් නැතිදැ'යි ඔහු විමසනවා
බැන වැද ඔහුට ඇය මේ ලෙස පවසනවා

49. ඇයි ලොකුපුතුට වැඩියෙන් සැලකුවෙහිද
හැමට ම බෙදා දුන්නේ සමසේ නොවෙද
මෙහි තව රැඳී අපටම පවු දෙන්නේද
අන් දරුවන්ගෙ නිවසට යන්නට බැරිද



DampeTheroKaviBook_Content_20180804.indd 155 2018/8/4 8:46 AM

50. පැරුණු සිතින් බමුණා ඉන් පිට වෙන්නේ
දෙවැනි පුතුගෙ නිවසෙහි වාසය ගන්නේ
මැනවින් කලක් එහිදී සැලකිලි වෙන්නේ
කලකින් පෙර ලෙසට සැලකිලි අඩු වෙන්නේ

51. එහිද බොහෝ කල් නැහැ ඉන්නට දෙන්නේ
ලේලිය ඔහුව බැනලා එලවා ගන්නේ
අන් පුතුනගේ ගෙවල ද ටික ටික ඉන්නේ
අවසන මහා පාරයි උරුමව තිබුනේ

52. මහ ධනවතෙකු ලෙස කාලය ගෙවූ පියා
මහ මග වැටී ගෙන් ගෙට සිඟමනේ ගියා
බුදුහිමි තමන්හට පිහිටක් වේය කියා
බඳුන ද සැරයටිය ගෙන දෙව්රමට ගියා

53. හිමි හමුවෙලා තමනගෙ දුක පැවසූවා
පුතුනගෙ තිබෙන ගුණමකු බව පැවසූවා
බුදුහිමි ඔහුට කියනට කවි උගන්නවා
පුතුන් ද සිටින සබයක කියනට කිවුවා

54. යමෙක් උපන් කල සතුටක් ඇති වීද
උන්ගේ දියුණුව ම සැම කල පැතුවේද
ඒ මා පුතුන් ගෙන බිරියන්ගේ වාද
ඌරකු ලෙසට මා නිවසින් එළවාද

55. දරු වෙස් අරන් සිටි උන් රකුසෝම වෙති
පියාණනේ යැ'යි නිරතුරු බස් බෙනෙති
වියපත් අසෙකු ලෙස මා දැන් හැර දමති
ගෙන් ගෙට සිඟා යදිනට මාවත සදති



DampeTheroKaviBook_Content_20180804.indd 156 2018/8/4 8:46 AM

56. පුතුනට වඩා මට මේ සැරයටිය අගෙයි
බුරා පනින බල්ලන් එළවලා දමයි
නො වැටී ඉන්න උපකාරය සැරයටියයි
අඳුරෙදි පාර පෙන්වන්නෙ ද සැරයටියයි

57. මේ කවි ඉගෙන ඔහු එතැනින් පිට වෙන්නේ
පුතුන් සිටින සබයක හිඳ පවසන්නේ
තමනගෙ වරද උන් හැම එහි පිළිගන්නේ
නැවතත් පියා ගෙන ගොස් සැලකිලි දෙන්නේ

## (දුප්පත් ගොවියා)

58. සැවත් නුවර සොරු පොහොසත් ගෙයක් බිඳ
වස්තුව රැගෙන යන විට සිට කුඹුර මැද
බෙදුවා ඔවුන්ගේ අයිතිය පියළි බැඳ
එකෙකුට එකක් අතහැරුනා කුඹුර මැද

59. අලුයම සමවතින් ලෝකය බලන්නේ
කුඹුරෙහි සාන ගොවියව හිමි දකින්නේ
සෝවන් වෙන්න පින මෝරා තිබෙන්නේ
නොගියොත් ඔහුට මහ අවැඩකි කරන්නේ

60. උදයෙ ම පුරුදු ලෙස බමුණා වැඩට ගියා
බුදුහිමි අනඳ හිමි සමගින් එහි වැඩියා
දුටුවෙද අනඳ විෂකුරු සර්පයා කියා
අනඳ තෙරුන්ගෙන් හිමි විමසා සිටියා



DampeTheroKaviBook_Content_20180804.indd 157 2018/8/4 8:46 AM

61. එහෙමයි දිටිමි තෙරණුවො පිළිතුරු දෙන්නේ
බුදුහිමි සමඟ එතැනින් පිට වී යන්නේ
සර්පය කොහේදැ'යි බමුණා විමසන්නේ
දැක රන් පොදිය නැහැ සැලකිල්ලට ගන්නේ

62. වස්තුව අයිතිකරුවෝ එහි පැමිණෙනවා
දැක රන් පොදිය ළඟ බමුණා වැඩ කෙරුවා
වධයට ඔහුව බැඳලා අරගෙන යනවා
බුදුහිමි දෙසූ දෙය එහිදී මුමුණනවා

63. මෙ පුවත රජුට දැනගන්නට ලැබෙන්නේ
මොහු කැඳවලා රජුමයි නඩු අසන්නේ
තමන් නිදොස් බව බමුණා කියන්නේ
බුදුහිමි හොඳින් දන්නා බව කියන්නේ

64. රජු ඔහු සමඟ බුදුහිමියන් හමුවෙනවා
හමු වී ඔහුගෙ විස්තර හිමිහට කිවුවා
බමුණා නිදොස් බව සැකයක් නැති වූවා
සමිඳුන් සියළු පිරිසට සදහම් දෙසුවා

65. හිමි කරුණාව පා බමුණා වෙත ආවා
එනිසා ඔහුව රුදු මරණෙන් ගැලවූවා
දෙසූ බණ ඇසූ ඔහු සෝවන් පල ලැබූවා
මරණෙන් මිදෙන මාවත වෙත පය තැබූවා



DampeTheroKaviBook_Content_20180804.indd 158 2018/8/4 8:46 AM

## (භද්‍රවතිකා ඇතින්න)

66. වැඩ සිටිනා කාලයෙදි කොසඹෑ නුවර
උදේන රජුට දෙසුවා දහමක් පවර
කෙනෙකුන් අපට කළෙ නම් යම් උපකාර
නිරතුරු සොයා බැලුමයි මනුදම් පවර

67. උදේන රජුගෙ ඇත් ගාලෙහි නිති සිටියා
ඇතිනිය රජුට හිතවතියක් වී සිටියා
යුදයට සමත් ඕ ජව බලයෙන් සිටියා
සැම දෙන භද්‍රවතිකා ගැන දැන සිටියා

68. මගුලැතු සමග ම යි නිරතුරු ඇය සිටියේ
අහර ද වෙනත් ගරු සැලකිලි නිති ලදුයේ
තෙද බල නිසා නිරතුරු රජු ළඟ සිටියේ
ඇය ගැන නිතර විමසිල්ලෙනි රජු සිටියේ

69. අනියත දහම ලොව හැමට ම පොදුව ඇත
ඇයට ද එයින් මිදෙනට කිසි කරුණු නැත
ටික ටික මහලු වයසට ඇය පත්ව ඇත
ඔද තෙද බලය දැන් ඇයගෙන් ගිලී ඇත

70. තේජස බලය ටික ටික නැති වී යන්නී
ගරු සැලකිලි ද සමග ම නැති වී යන්නී
සවි බල නැතිව සිරුරින් වැහැරී යන්නී
රජ වූ ලෙසින් සිටි ඇය පාරට වැටුණී

71. මෙහෙ කරුවන්ගෙ රැකවරණෙහි සිටි ඇයට
අද අසරණ ව සිදුවිය තැන තැන යන්ට
මහලුව ලෙඩ ව මහ මග දුක් විඳි කලට
බුදුහිමි දිනක් හමු විය ඇයගේ නෙතට



DampeTheroKaviBook_Content_20180804.indd 159 2018/8/4 8:46 AM

72. බුදුහිමි දුටු වහ ම ඇය අඳුනා ගන්නා
වහ වහ අවුත් හිමි පාමුල වැඳ වැටුණා
තම දුක කියන්නට ඇය හයියෙන් අඬනා
සමිඳුන් මනාකොට ඇයගේ සිත දකිනා

73. නො හඬනු ඔබට සිදු වූ දෙය මම දනිමි
ඔබ දැන් සිටින'යුරු මැනවින් මම දකිමි
රජු හමුවෙලා ඔබ ගැන තොරතුරු කියමි
අසරණ ඔබව නැවතත් රජුවෙත යවමි

74. එදින ම මාළිගාවට හිමි වැඩි සේක
මැදුරෙදි රජුගෙ දානය වැළඳූ සේක
අවසන දහම් දෙසනට ඇරඹූ සේක
රජුගෙන් ඇතින්නිය පිළිබඳ ඇසූ සේක

75. 'ඇතින්නියක් ජව ඇති සිටියා නොවෙද
මහරජ ඇයව දක්නට නැත්තේ මන්ද'
'මහලුයි ඇගේ ගත සවි දැන් නැහැ සමිඳ
නොදනිමි ඇයව කොහි සිටිනේදැ'යි මමද'

76. ඔය ලෙස කීම මහරජෙකුට නොවටින්නේ
ඇය ගැන මනා කොට සෙවුමයි යුතු වෙන්නේ
තිරිසන් වුව ද ඔබටයි සේවය දුන්නේ
මහලුව සිටින ඇය රැකුමයි යුතු වෙන්නේ

77. මව්පිය ගුරුන් සේවකයින් මහලු කල
නැති වී ගියේ නම් සිරුරේ තිබුණු බල
සුරැකිය යුතු ය කළගුණ දත් මිනිස් කැල
මානව දහම මෙය වේ මහරජුනි බල

78. හිමි දෙසු දෙයට මහරජුගේ සිත සැලුණා
තම අතපසුව රජුහට මැනවින් දැනුණා
වහ යළි ඇයව රජමැදුරට කැඳවන්නා
පෙර සේ යළිත් ඇය හට සැලකිලි දෙන්නා

**(කුසගින්නේ සිටි මගියා)**

79. සැවතෙහි සිටින කල ලෝ වැඩ සලසන්නා
දිවැසින් බලනා විට ලොව දුගියෙකු පෙනුණා
මග පල ලබන්නට පින් මෝරා තිබුණා
බුදුහිමි වඩියි ඔහු හමු වෙන අදහසිනා

80. අළවු රටෙහි දන බුදුහිමි පිළිගන්නේ
මැනවින් සකස්කර දන් පිළිගන්වන්නේ
වළඳා අවසනෙහි හිමි එහි වැඩ ඉන්නේ
දහම් දෙසන්නට තව කල් බලමින්නේ

81. නැති වූ ගොනා සොයනට වන වැදි ගොවියා
දවස ම වෙහෙස වී එතැනට විත් සිටියා
කුසගින්නේ ම මෙතැනට ආ අසරණයා
මග පල ලබන්නට පින මෝරා සිටියා

82. කුසගින්නේය දැන් නම් මොහු සිටින්නේ
අසනා දහම නැහැ ඔහු සිත් වදින්නේ
එනිසා පළමු කොට කුසගිනි නිවන්නේ
අනතුරු දහම් සීතල දිය පොවන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 161 2018/8/4 8:46 AM

83. වළඳා ඉතිරි වූ ආහාරය ගෙන්නා
වෙහෙස ව සිටින මගියට කන්නට දුන්නා
අහරින් පසුව වෙහෙස ද කුසගිනි නිවුණා
පිළිවෙළ කථාවෙන් ඉන්පසු දම් දෙසනා

84. සියලු ම රෝග අතරින් කුසගිනි දරුණු
සියලු ම දුක්වලින් සංඛාරයි දරුණු
ඤැනැති දනෝ සොයතිය නිවනට කරුණු
නිවනයි උතුම් සුව හැම අතරින් දකිනු

85. දිගු මග ගෙවා වැඩියේ මොහු නිසාවෙනි
මග බල බලා හිටියේ මොහු නිසාවෙනි
ඇසූ දම් නිසා නිවනෙහි මග එළිය වුණි
බුදුහිමි නිසා දුගියගේ දුක් නිමා වුණි

**(පූතිගත්ත තිස්ස තෙරුන්)**

86. හිමි දෙසූ බණට තම හිත පහදා ගත්තු
තරුණෙක් දිවියෙ ඇති තතු තේරුම් ගත්තු
සසරෙහි ගමන නවතන්නට සිත ගත්තු
දෙව්රම තුළදි සසුනෙහි දිවි ලැබ ගත්තු

87. දහම ද විනය මග මැනවින් පිළිපදිනා
හිමි දෙසූ ලෙසට මුලු දිවිය ම ගතකරනා
යතිවර තරුණ නිසි ලෙස දහමෙහි සරනා
පිළිවෙත් පැවිදි මග පුරමින් වැඩ සිටිනා

88. සසරෙහි ගතිය හැම මොහොතෙ ම අනියත වේ
සිතනා ලෙසට සියලු ම දෙය ඉටු නොම වේ
කම් පල පැවිදි දන වෙත වුව එයි පොදුවේ
නවතාලන්න සමතෙකු තුන්ලොව නැති වේ

89. අබ ඇට පමණ ගඩු සම මත ඇති වෙන්නේ
මාදං වෙරළු තරමට ලොකු වී යන්නේ
බෙලිගෙඩි පමණ වී පුපුරාලා යන්නේ
තිස්සට මෙසේ පෙර කළ කම් පල දෙන්නේ

90. පැලුණු තැනින් කුණු ලේ වැගිරී යනවා
දුගඳට කුටිය තුළ මැස්සන් රජ වෙනවා
පෙරවූ සිවුරු සැරවෙන් පෙඟිලා යනවා
උවටැන් කරපු අය අතහැරලා යනවා

91. අතපය වාරු නැත නැගිටින්නට බැරුවා
මැස්සන් වසා සිටි මුලු සිරුර ම දනවා
මිහිමත නරකයක පැසෙනා තම සවුවා
කරුණා දැලට බුදු හිමිගේ හසු වූ වා

92. කම්පල ලෙසට ලෙඩ යහනේ වැඩ ඉන්න
තිස්සට නොහැක හෙට දින හිරු දැක ගන්න
එනමුත් දහම් ඇසුවොත් නිවනට යන්න
මේරූ පින් තිබේ සසරෙන් ගොඩ වෙන්න

93. රෝ දුක් සමඟ සටනක පැටලී ඉන්නා
තිස්සගෙ කුටිය වෙත බුදුහිමි පිය මැන්නා
යහන පිටින් ඔසවා එළියට ගන්නා
අනඳ තෙරුන් සහයට වැඩලා උන්නා



DampeTheroKaviBook_Content_20180804.indd 163 2018/8/4 8:46 AM

94. සකසා උණුදියෙන් චීවර හෝදාලා
හිමි සියතින් ම අවුවට දා වේලාලා
කුණු වූ සියළු තැන් සියතින් පිහදාලා
අපුලක් නැතුව කරුණාවෙන් නහවාලා

95. බුදුහිමි අතින් නැහැ වූ ගත සුවපත් වේ
කරුණා දියෙන් නැහැවුණු සිත සන්සුන් වේ
අසනා දහම වටහා ගන්නට හැකි වේ
දුක්ගිනි නිවන්නට තිස්සට දැන් හැකි වේ

96. රුව වේදනා ඈ පස් කඳ මගේ නොවෙයි
මට රිසි ලෙසට කිසි දා පාලනය නොවෙයි
අනියත විසින් සැම දා පාලනය කෙරෙයි
දුක් දෙන නිසා මම මා හට අයත් නොවෙයි

97. ඇස කණ නහය ඈ ඉඳුරන් මගේ නොවෙයි
ඉඳුරන් ගොදුරු වන රූප ද මගේ නොවෙයි
ඉන් උපදනා සිතුවිලි මට අයත් නොවෙයි
හිස් බව ලොවෙහි ඔබ නුවණින් දැකිය යුතු යි

98. දිවියෙහි නියම තතු මේ ලෙස දැන ගන්න
ඇලුම් බැඳුම් සැම බිඳලා සිඳලන්න
මොහඳුර නසා ආලෝකය ලැබ ගන්න
බියකරු සසර අද මෙතැනින් නවතන්න

99. කය සුවපත් ව සන්සුන් මනසින් සිටියේ
තිස්සට වැටහුනා ඇති සැටි ජීවිතයේ
සිඳලා දමා ගැට සසරෙහි බැමි පොදියේ
තිස්ස රහත් වී පිරිනිවනට වැඩියේ



DampeTheroKaviBook_Content_20180804.indd 164 2018/8/4 8:46 AM

100. ගිනි ගත් වියළි බිම තෙමමින් ගලාන යන දිය විලසේ
ගත රැඳි දාහෙ නිවාලමින් හමනා පවනක් විලසේ
අසුවන සියලු සත මුදවා කරුණා යුතු පියෙකු ලෙසේ
දම් බෙර වයයි මුලු ලොවට ම යුතු ඉවසීමෙන් මෙලෙසේ

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**මහා කරුණා නම් වූ දහතුන්වන සර්ගය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 165 2018/8/4 8:46 AM

DampeTheroKaviBook_Content_20180804.indd 166 2018/8/4 8:46 AM

## දහහතරවන සර්ගය

# ක්ෂාන්ති

**(සුන්දරියගේ දුෂ්ඨකම්)**

1. හිමි දෙසු දහම නිවනට ම යි දොර ඇරියේ
කිත් යස තවත් මුළු ලොව පැතිරිලා ගියේ
පුද සැලකිලි ද අඩුවක් නම් නොම වූයේ
බොහො දෙන පැමිණ හිමි ළඟ සවුවන් වූයේ

2. මුව මුව නැගෙන්නේ තුති කරනා ගීත
ගෙය ගෙය ඇසෙන්නේ හිමිගේ ගුණ ගීත
ගම ගම සියලු තැන හිමි වඩිනා දෑත
රට රට පැතිරුණා කිතු ගොස බැඳි ගීත

3. දෙසනා දහම සිවු දෙස පැතිරී යන්නේ
කිත් යස ලාබ දින දින තව වැඩි වෙන්නේ
තිවටුන් ලාබයෙන් යසසින් පිරිහෙන්නේ
සඳ ඇති රෑට කෙලෙසද තරු බබලන්නේ

4. නැති වුන ලාබ යළි කෙලෙසක ලබනෙමුද
කිත් යස සත්කාර අපහට නොලැබේද
බුදුනට නිගාවක් කරනට හැකි වේද
ඉන් යළි අපට ජය ලබනට හැකි නොවෙද

5. කෙනෙකුට ලැබෙන කිත් යස පැසසුම් සෝෂා
දුදන දනන් හට ඉන්නට බැහැ ඉවසා
උන් සිත පෙළන ඉසි කෝ මද මාන නිසා
නොයෙක් ලෙසට කරලා දමතිය වනසා

6. සුන්දරි නමැති පිරිවැජි කත කැඳවන්නේ
සැලසුම කෙසේ විය යුතු දැයි පවසන්නේ
අල්ලස් ලබා ගෙන ඇය පිට වී යන්නේ
ඇගෙ වැඩ කොටස කරනට දැන් අරඹන්නේ

7. ගොම්මන් අඳුර එන විට ගෙන් පිට වෙනවා
වෙහෙර දෙසට හෙමිහිට පය ඔසවනවා
"බුදු සමිඳුන් හමු වෙන්නට මා යනවා
අසනා අයට මේ ලෙස පිළිතුරු දෙනවා"

8. එනමුත් ජේතවනයේ නොම විසුවා ය
උන්ගේ වෙනත් වූ අරමක විසුවා ය
උදයේ එන විටත් විමසනු ලැබුවා ය
දෙව්රම සිටන් එන බව ඇය කියුවා ය

9. දින සති ලෙසට ටික දවසක් ගත වූවේ
බුදු හිමි සමඟ කුළුපග බව ඇඟ වූවේ
තිවටුන් නියම සැලසුම කරනට වූවේ
රහසෙ ම රැයක සුන්දරි මරලා දැමුවේ

10. හොරු ඇය හොරෙන් රහසෙ ම මරලා දැමුවා
මළ කඳ දෙව්රමේ මල් ගොඩ යට දැමුවා
දුදනන් සමඟ කරනා කෙළි බොහො ඒවා
මෙලෙසින් නිමා කරනට නම් සිදු වෙනවා



DampeTheroKaviBook_Content_20180804.indd 168 2018/8/4 8:46 AM

11. ඊයේ හවස සිට සුන්දරී දකිනු නැත
දෙව්රම බලා ගිය ඇය යළි ආවේ නැත
ඇය හට වූ දෙයක් දන්නා කෙනෙකු නැත
සැමදෙන සොයති සුන්දරී ගිය තැනක් නැත

12. ජීවත් වේද නැති දැයි ඇය දන්නෙ නැත
වහ වහ ඇයව සොයලා ගත යුතු ව ඇත
මහ රජ හට ද සැලවූවේ මේ පුවත
සොයනට ඇයව රජුගෙ ද අනුමැතිය ඇත

13. සොයමින් ඇය ව දෙව්රම වෙත පිය නගති
වෙහෙරෙහි සියලු තැන පෙරළාලා සොයති
පරමල් දමන තැන වෙසසින් උන් සොයති
ඇගෙ මළ සිරුර මල් අස්සෙන් ගොඩට ගති

14. සැලසුම උන්ගෙ හරියට සිදු කෙරුණු නිසා
අගරු දෙන්න විය හිමි හට කියා මුසා
නුවරු රැවටිලා අසලා උන්ගෙ මුසා
අකුසල් පුරති සිත කය වචනය කෙලෙසා

15. දෙව්රම තිබී හමුවූ මළ සිරුර නිසා
සැමදෙන පිළිගනී නිවටුන් දෙසන මුසා
බුදු හිමියන්ට බැණ අකුසල් පුරන නිසා
කුටියෙ ම සිටියෙ හැමවෙත කරුණාව නිසා

16. නුවර ම මහත් කලබලයක් හට ගන්නේ
බුදු සවුවනට උන් ගුටි හා බැට දෙන්නේ
සමහරු පරුෂ වදනින් එළවා ගන්නේ
හිස් පා ඇතිව නැවතත් වෙහෙරට එන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 169 2018/8/4 8:46 AM

17. කෙනෙක් ඉරුණු සිවුරුය පොරවා ඉන්නේ
කෙනෙකුගෙ හිසින් තවමත් ලේ බේරෙන්නේ
හිරිහැර විඳපු බව සැමගෙන් දිස්වෙන්නේ
අනඳ සමිඳු ගොස් බුදු හිමි හමු වෙන්නේ

18. බැහැ සමිඳුනේ තව දුරටත් මෙහෙ ඉන්න
නුවරු බොහෝ කෝපෙන් තවමත් ඉන්න
පරුෂ වදන් කියනා බව දැන ගන්න
සිවුපස නැතිව සිදු වෙයි තව දුක් වෙන්න

19. ඉදින් නුවර අතහැර දමලා යා නම්
වෙන නුවරකදි නැවතත් මේ ලෙස වේ නම්
එය ද අතැර වෙනතක යන්නට වේ නම්
තැන තැන යන්න අපහට සිදු වේ කියනෙම්

20. එනිසා මදක් සතියක් ඉවසිය යුත්තේ
යුක්තිය දිනන බව ඔබ දැන ගත යුත්තේ
තමන් නිදොස් බව නම් පැවසිය යුත්තේ
වැරදි නොකර නැහැ නිහඬව සිටි යුත්තේ

21. එතැන් පටන් මිනිසුන් දොස් නගන විට
තමනගෙ නිදොස් බව පැවසූවෝ උන්ට
නිහඬව රජු ද මෙහි තතු සොයනා ලෙසට
යෙදවිය රහස් සෙබලුන් මුළු නගරයට

22. උන් ගොස් නගරෙ තැන තැන සැඟ වී සිටියෝ
කඩපිල් තැබෑරුම් වෙසෙසින් රැක සිටියෝ
සොරු මේවාට එන බව උන් දැන සිටියෝ
සිතු ලෙස දිනක් සොරු එහි ඇවිදින් සිටියෝ



DampeTheroKaviBook_Content_20180804.indd 170 2018/8/4 8:46 AM

23. රා බී මත් ව වෙරි වී පදමට සොඳට
කට මැත දොඩන්නට වූවෝ මේ ලෙසට
"නිවටුන් දුන්නු කහවනු නම් මදි අපට
කහවනු තවත් ගත යුතු වූ වේ මෙයට"

24. "මා දුන් පහර හින්දයි සුන්දරි මැරුණේ"
"නැහැ මගෙ පහර හින්දයි ඇය බිම වැටුණේ"
"නුඹතින් නොවෙ ද ඇය කෙලෙසාලා දැමුණේ"
මෙලෙසයි කෙරුව දෙය උන් එහි පවසන්නේ

25. චරපුරුෂයෝ එහි සැඟවීලා උන්න
පැන උන් සැවොම විය අල්ලාගෙන යන්න
මේ ගැන නිරන්තර සෝදිසියෙන් උන්න
රජු ඉදිරියෙදි කළකම් විය පවසන්න

26. නිවටුන් අල්ලලා සබයට ගෙනෙන්නේ
උන් හැම එහි දි වධයට පමුණුවන්නේ
කළ කම් පලය දැන් උන් හැම විඳින්නේ
පෙරටත් වඩා දැන් ගැරහුම් ලබන්නේ

27. මහ වැස්සකට පසු මතුවෙන සඳක් වගේ
හිමි යසරාව තව තව වැඩි උනා අගේ
අසා සැවොම මුසවා බස් නිවටුන්ගේ
තැවුණා නුවරු කළ කම් පිළිබඳ තමගේ

28. රජු පැමිණියා දවසක් වෙහෙරට සවස
හමු වී සමිඳු පවසා සිටියා මෙ ලෙස
ඇති කළ විට අනුන් ඔබ පිළිබඳ අයස
නිහඬව සිටියෙ ඇයි ඔබ ඉවසා අයස



DampeTheroKaviBook_Content_20180804.indd 171 2018/8/4 8:46 AM

29. "මම සිල්වත් ය ගුණයෙන් යුතු කෙනෙක් වෙමි"
කිසි දින එවැන්නක් අනුනට නො පවසමි
පෙර බුදුවරුන් සිරිත ද මෙය බව දනිමි
ඔබ මෙය වටහ ගත්තේ යැයි මම සිතමි

30. හිමි ගැන පෙර ද රජු පැහැදීලා සිටියේ
මෙයසා තවත් බොහො කොට එය වැඩි වූයේ
බුදු වූ නිසා මේ ගැරහුම් ඉවසූයේ
ඔබගේ දහම තව තව මට රුචි වූයේ

**(චිඤ්චා මානවිකා)**

31. බුදුහිමි යසස තව තව ලොව පැතිරෙනවා
තිවටුන් නිතර එය නැසුමට තැත් කෙරුවා
වෙනත් උපායක් ඒ වෙනුවට යෙදුවා
මුදල් ගෙවා චිඤ්චා හට පවරනවා

32. සුවඳ දියෙන් නා පිරිසිදු වී සොඳට
පොරවා පට පිළී අභරණයන් ගතට
වඩවන හැඟුම් කාමී දනගේ සිතට
සවස් කලට යන්නී දෙව්රම දෙසට

33. "අඳුර ටිකෙන් ටික වැඩි වී යන කලට
කිම ඔබ ඇවිද යන්නේ දෙව්රම දෙසට"
එහි සිට පිටව යන මිනිසුන් ඇසූ කලට
ඇය මේ ලෙසයි පිලිතුරු දුන්නේ උන්ට



DampeTheroKaviBook_Content_20180804.indd 172 2018/8/4 8:46 AM

34. "දෙසූ නමුත් රුව අනියත බව කියලා
බවත් ගොයුම් සමිඳුන් මට වශී වෙලා
කවුරුත් නොයන කල් වේලාවක් බලලා
ඔහු හමුවෙන්න යම් මොනවට සැරසීලා"

35. දෙව්රම අසල වෙනතක නැවතී ඉඳලා
උදයෙ ම පිටත් වෙයි යන්නට නිවස බලා
"බුදු කුටියේ ඉඳන් මම යම් නිවස බලා"
පිළිතුරු මෙසේ දී ජනයා කරයි මුළා

36. අචල සැදැහැ ඇත්තෝ ඉන් නොරැවටෙති
බුදු හිමි කෙරෙහි ඇති ගරු සිත නො කෙලසති
සෙලවෙන සැදැහැ ඇත්තෝ නම් කලකිරෙති
හිමි ගැන ඔවුහු සිත තුළ සංකා වඩති

37. දින සති මාස මේ ලෙස ගෙවිලා යනවා
සුපුරුදු ලෙසට ඇගෙ කටයුතු සිදු වෙනවා
සැලසුම නියම ලෙස කළ යුතු කල එනවා
හිමි හට මහත් අයසක් දෙන්නට යනවා

38. ගෙන දර කෝටු තබලා හරි පිළිවෙළට
රැහැනින් බැඳල පොඩි දර මිටියක් ලෙසට
කුස මත තබා රැහැනින් බැඳලා තදට
සළු පොරවලා ගැබ්බර මවකගෙ ලෙසට

39. බුදුහිමි දම් සභා මඩුවේ දම් දෙසති
රජ සිටු ඇමතිවරු එහි සිට බණ අසති
චිඤ්චා පැමිණියා සංවර කමක් නැති
නින්දා කරයි විලසට ලැජ්ජා නොමැති



DampeTheroKaviBook_Content_20180804.indd 173 2018/8/4 8:46 AM

40. "ඔබ මහ පිරිස් මැද ඉඳගෙන බණ කියනා
ඔබෙ දරු ගැබක් මාගේ කුස තුළ වැඩෙනා
තුටු වී මගෙන් මා හැර දමනට සිතනා
කවර බණක් දෝ ඔබ වැනියන් දෙසනා

41. රජ සිටු ඇමතිවරු පිළිබඳ ඔබ දන්නේ
ධනවත් උවසු උවැසියො ළඟමයි ඉන්නේ
උන් හට කියා මට පිහිටක් ලැබ දෙන්නේ
කුස තුළ සිටින දරු ඔබෙ බව ඔබ දන්නේ"

42. බුදු හිමි සිතෙහි නැත තරහක් හට ගන්නේ
කරුණා සිතින් ඇය හට මෙය පවසන්නේ
"නැගණිය ඔබ ද මා පමණයි මෙය දන්නේ
දරුගැබ කුමක්දැයි ඔබ ම යි එය දන්නේ"

43. කිසිවෙකු නොසිතුවක් එකවර සිදු වූවේ
කිසිවෙකු මුවින් නැහැ වදනක් පිට වූවේ
ඉන් පසු කුමක්වේ දැයි කවුරුත් බැලුවේ
කිසිවෙකු නොසිතු දෙයකුයි එහි සිදු වූවේ

44. බඩ බැඳි රැහැන් ලිහිලා දර ටික වැටුණා
දර දරු ගැබක් ඇය ඔසවා ගෙන තිබුණා
ලැජ්ජාවට ම ඇගෙ නෙත් පොළොවට හැරුණා
චිඤ්චගෙ කුරිරුකම හැම දෙනට ම පෙනුණා

45. "මැය වසලියකි බුදු හිමි හට කරපු නිගා
එළවිය යුතු යි නගරෙන් හිස කේ බූගා
සැඩොලිය විවර කර ගත නිරයට ම මගා"
ගුටි බැට දෙන්න යති සමහරු දෙමින් නිගා



DampeTheroKaviBook_Content_20180804.indd 174 2018/8/4 8:46 AM

46. "ඇය මෙහි පැමිණියේ මට නින්දා දෙන්න
මම නොකියනෙමි ඇය හට දඬුවම් දෙන්න
දැන් පසුතැවෙයි ඇය සිදු කළ වරද ගැන
එනිසා ඇයට කරුණාවෙන් ඉඩ දෙන්න"

47. හිමි ඔවදන් අසා සැම ඉවතට යන්නේ
ලැජ්ජාවෙන් ම ඇය දුවලා පිට වෙන්නේ
පොළොව දෙකඩ වී ගිනි දැල් මතු වෙන්නේ
චිඤ්චා පණපිටින් නිරයට ගෙන යන්නේ

**(කොසොල් රජුගේ මහා දානය)**

48. කොසොල් නිරිඳු නිරතුරු හිමි හමුවෙන්නේ
බුදුහිමි සමඟ කුළුපග වීලයි ඉන්නේ
වයසින් කුලෙන් දෙදෙන ම සම වී ඉන්නේ
එනිසා නිරිඳු හට හිමි බොහො ප්‍රිය වෙන්නේ

49. මැදුරට වඩමවා බුදුහිමි සහ සඟන
පිළිගැන්නුවා නිති රස ගුණ යුතු දාන
බොහො සේ පුදා බුදුහිමියන් හට දාන
මහ රජ සිටියි කල් ගෙවමින් සහතොසින

50. රජු දුන් දාන ගැන නුවරුන් දැන ගන්නේ
රජුට ද වඩා ඉහළින් නුවරුන් දෙන්නේ
නුවරුන් දුන්න දානය රජු දැන ගන්නේ
එයට ද වඩා ඉහළින් රජු දන් දෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 175 2018/8/4 8:46 AM

51. රජු පරදින්න අකමැති වෙයි නුවරුන්ට
නුවරු කැමති නැත පරදින්නට රජුට
මෙලෙසින් තරඟ ලෙස මහ දන් දෙන කලට
අවසන පැරදුනා මහ රජු නුවරුන්ට

52. මම වෙමි මහා රජු මේ කෝසල රටට
එනිසා නොහැක කෙලෙසකවත් පරදින්ට
කෙලෙස ද දනක් දෙන්නේ වැඩි නුවරුන්ට
සිත සිත කනස්සලු වීලා සිටි කලට

53. දේවිය මල්ලිකා මහ රජතුම දුටුවා
කණගාටුවෙන් ඉන්නේ කිමදැයි ඇසුවා
තමන් සිතැඟි ඇය හට රජු පැවසූවා
මහ දන් දෙන්න දේවිය සැලසුම් හැදුවා

54. රන් වැඩ දෑමු මණ්ඩපයක් සදවන්නේ
රන් පාවාඩ සහ වියනුත් බඳවන්නේ
මැද මහ මණ්ඩපේ බුදුහිමි වැඩ ඉන්නේ
පන් සියයක් මහ රහතුන් වට ඉන්නේ

55. එක් එක් නමට මහනෙල් මල් පුද කරන
යුවතියො සිටිති රූසිරියෙන් මන නදන
සුවඳ කොකුම් ඈ කල්කය අඹරමින
මඬුව ම සුවඳ කෙරුවා යුවතියො තුටින

56. එක එක නමට සුදු මුතුකුඩ ඔසවන්නේ
වෙන වෙන ඇතුන් පන්සියයක් එහි ඉන්නේ
සතියක් මෙහි අසදිස මහ දන් දෙන්නේ
මහරජ තරඟයෙන් දිනලා තුටු වෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 176 2018/8/4 8:46 AM

57. තරඟ ලෙසට මහ දන් පිරි නැමුවාට
නොමැත පිනක් සිදු වන්නේ නම් ඔබට
තරඟ නිසා මානය වැඩි වෙන කලට
හැකි වෙද ලෝබ තණ්හා නැති කරන්නට

58. සැඳැහැ සිතින් යුතු කම්පල අදහගෙන
සිල්වත් ගුණෙහි පිහිටා සිට දනක් දෙන
දැහැමින් ලැබූ වස්තුව දානයට දෙන
ජනයා පමණක් ම ලබතිය දනේ පින

59. මහ දන්වලට බුදු සිත නැහැ කෙලෙසෙන්නේ
නිවැරදි ලෙසට දන් දෙන හැටි පවසන්නේ
දෙන දෙය නොවෙයි සිත ම යි වැදගත් වෙන්නේ
දෙන දෙය කුඩා වුව සිත පහදා දෙන්නේ

60. ක්ෂාන්තිවාදී ලෙස ඉඳ පෙරුම් පිරුවෙ ඉවසන්නට
නින්දා ගැරහුම් කිත් යස ලාබ පාඩු නොගෙන සිතට
සැම දෙය සම සිතින් දරා ඉන්ද්‍ර ඛීලයක් විලසට
බුදු සිත නම් සැලුනේ නැත තරමක් වත් ලෝ දහමට

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**ක්ෂාන්ති නම් වූ දහහතරවන සර්ගය නිමි**

DampeTheroKaviBook_Content_20180804.indd 178 2018/8/4 8:46 AM

## පහළොස්වන සර්ගය

# පිරිනිවීම

1. පන්සාලිස් වසක් සතුනට දම් දෙසනා
අසූ වියට පා තබලා වැඩ සිටිනා
බුදු හිමි සිරුර දැන් ටික ටික වැහැරෙන්නා
බුදු සිරුරට ද අනියත බව උරුම වෙනා

2. අස්රිය මනා කොට සරසා පැද යනවා
මුල දී මනා සවි බලයෙන් යුතු වෙනවා
කල් ගත වෙද්දි රිය දිරලා ලෙඩ දෙනවා
සිරුර ද අපේ රිය සේ දිරලා යනවා

3. දැත් දෙපා වැහැරී ගොස් කෝටු වගෙයි
ඔසවන දෙපා තමනට රිසි තැන නො රදයි
ගත සවි බලය නැති වී මහ මග විසිවෙයි
මහළු ව සිටින කාටත් ලෙඩ දුක් වැඩි වෙයි

4. මහළු වෙලා ලෙඩ දුක් හැදුනත් නිරත
සමවත් සුවෙන් හිමි කල් යැව්වා නිතර
සව් සත දුකින් මුදවන බණ දෙසු අතර
සැමට ම පිහිට වෙයි ගොඩ වෙන්නට සසර

5. බරණැස් පුරෙන් ඇරඹුණු සදහම් ගඟුල
රජගහ පුරෙන් ආවේ නුවරට කපිල
සැවතෙහි කලක් දෙසලා සදහම නිමල
ජනපද සියලු තෙමුවා දහමින් නිමල

6. සැමදා සියලු සතුනගෙ බව දුක නැසුවා
දිව රෑ දෙක ම ඒ වෙනුවෙන් කල් ගෙවූවා
බොහො දෙන එමග ගොස් දුක් කඳ නැති කෙරුවා
බුදු කිස නිමා කරනට කාලය එනවා

7. අවසන් වසට වැඩියේ බේලුව ගමට
එහි දී රෝගයක් වැලඳුණි බුදු කයට
ගුරු වූ බැවින් තුන්ලොව දෙවි මිනිසුන්ට
සක් දෙවි පැමිණියා හිමිගේ උවටනට

8. කපිල වස්තු පුරයේ ඉපදී වැඩුණේ
ගයා හිසදි ලොව්තුරු පදවිය ලැබුණේ
බුදු කිස නිමා වෙන කාලය ළඟා උනේ
අවසන් වසෙහි තව බොහො දේ සිදු වෙන්නේ

9. සැරියුත් සමිඳු සමවත් වැද වැඩ ඉන්නේ
තම දිවි කෙතෙක්දැයි නුවණින් විමසන්නේ
සතියක් ආයු ඉතිරිව ඇති බව දන්නේ
මවු ගම් වැඩම මව හට දම් දෙසන්නේ

10. නාලක ගමට වැඩ සිය මවු හමු වූවේ
මවට නොයෙක් අයුරෙන් සදහම් දෙසුවේ
බණ ඇසූ මෑණියෝ සෝවන් පල ලැබුවේ
පසු දින හිමි ද පිරිනිවනට පත් වූවේ

11. මුගලන් සමිඳු පෙළහැර පෑමෙහි අග වෙයි
විසිතුරු ලෙසට කම් පල හැම දෙසනේ වෙයි
අන් තොටුවන්ගෙ කිත් යස ඉන් නැසුනේ වෙයි
තෙරුන් නසන්නට උන්ගේ සිත් දැඩි වෙයි



DampeTheroKaviBook_Content_20180804.indd 180 2018/8/4 8:46 AM

12. මුදල් දෙවා සොර මුලකට පවසන්නේ
තෙරුන් දිවිය අද හෙට තොර කරවන්නේ
කාලසිලා පව්වෙහි තෙර වැඩ ඉන්නේ
සොරු තෙර නසනු වස් ඒ දෙස වටලන්නේ

13. තෙවරක් සමිඳු උන්ගෙන් බේරී යනවා
සිව්වෙනි වරදී නුවණින් කිමදැයි බැලුවා
කළ කම් කාට වුව දිනකදී පල දෙනවා
පෙර කම් පල විඳිනට දැන් සිදු වෙනවා

14. මෙලෙස සිතා හිමි කුටියේ වැඩ ඉන්නේ
සොරු දඬු මුගුරු ගෙන හොඳට ම බැට දෙන්නේ
ඇට කටු බිඳී මරණාසන්නව ඉන්නේ
ඍද්ධි බලෙන් බුදු හිමියන් වෙත යන්නේ

15. ආයුෂ කෙළවරට මම පත් වී සිටිමි
හිමි අවසරින් අද දින පිරිනිවෙන්නෙමි
අවසර අරන් බුදු සමිඳුන් වෙතින් හිමි
සසරෙහි ගමන සදහට කෙරුවේ ය නිමි

16. අගසවු දෙනමගේ ධාතුන් නිධන් කර
මහ සෑ දෙකක් කරවා රජගහ නුවර
එපුරෙන් නික්ම වැඩි සඳ මහ විසල් පුර
බුදුහිමි දකින්නට එයි වසවත් මාර

17. අසූ වයස් ගත දැන් ලෙඩ වෙයි නිතර
අතීසාරයෙන් හිමි පෙළෙනා අතර
කරුණා සිතින් හිමි හට පවසමි අදර
පිරිනිවෙනට කල් දන්වා සිටි අතර



DampeTheroKaviBook_Content_20180804.indd 181 2018/8/4 8:46 AM

18. මාරය නො බා සිටු මම පිරිනිවෙන්නෙමි
ළඟ එන වෙසක් පොහොදින පිරිනිවෙන්නෙමි
තෙමසක් සමවතෙහි සුව මම විඳින්නෙමි
සැම දෙය අතැර යන්නට බිය නො වෙන්නෙමි

19. රණබිම මනා විරුවකු සතුරන් නසන
ලෙස හැම කෙලෙස් බිඳ ලූ යෙමි බව තනන
නැති කළ බැවින් දුක් ගෙන දෙන බව ගමන
තෙමසක් ගත වූ තැන සිදු වෙයි පිරිනිවන

20. ආයුසංස්කාරය මෙලෙසින් හලුයේ
එකෙනෙහි පොළෝ තලය ම කම්පා වූ යේ
අනඳ තෙරුන් ඒ පිළිබඳ විමසූයේ
නුදුරෙදි පිරිනිවන් පානා බව කීයේ

21. අනඳ තෙරුන්ගේ හද කම්පා වෙනවා
කපක් සිටින ලෙස ඉල්ලීමක් කෙරුවා
මින් පෙර එලෙස ඉල්ලීමට යුතු වූ වා
දැන් කිසි ලෙසින් වත් ආපසු නො හැරෙනවා

22. විශාලාවෙ මහ වනයට වැඩමනවා
අනඳ තෙරුන් බුදු සවුවන් රැස් කෙරුවා
නිවනට අයත් දම් එහි සැමට ම දෙසුවා
කරුණා යුතුව මේ ලෙසටත් පවසනවා

23. කරුණා යුතුව කියනා දෙය අහගන්න
සංඛත දහම් නැසෙනා බව දැන ගන්න
සිහි නැණ යුතු ව දහමෙහි නොපමා වන්න
තුන් මාසෙකින් සිතුවෙමි හැම හැර යන්න



DampeTheroKaviBook_Content_20180804.indd 182 2018/8/4 8:46 AM

24. කිරිමව් ප්‍රජාපති දේවිය යසෝදරා
සසුනෙහි පැවිදි වී නැසුවේ මෝහඳුරා
හිමිවෙත පැමිණ ඉල්ලා අවසර දෙවරා
හිමිට ද කලින් වැඩියේ පිරිනිවන කරා

25. බුදු හිමි විසල් මහ නුවරින් පිටවෙන්නේ
ගම් හා නියම් ගම් පසුකර වැඩමන්නේ
මෙලෙසින් කෙමෙන් පාවා නුවරට එන්නේ
රන් කරු චුන්දගේ අඹ වනයෙහි ඉන්නේ

26. බුදුහිමි සිටී තම අඹ උයනට වැඩලා
මෙයැසූ චුන්ද යයි සතුටින් ඉපිලීලා
වහ වහ ගොසින් හිමි පා පියුමන් වැඳලා
තුටු වෙයි තමන් ඇසූ දහමට පැහැදීලා

27. දහම් අසා රන් කරු පැහැදී ඉන්නේ
දන් පින් කරන්නට ඔහු හට සිත් වෙන්නේ
පසු දින නිවසෙ මහ දන් පිළියෙල වෙන්නේ
රස මසවුලෙන් යුතු දන් පිළිගන්වන්නේ

28. දන් වළඳලා අනුමෝදන් බණ දෙසලා
බුදු හිමි වඩියි ඒ නිවසින් පිට වීලා
අදිටන් බලෙන් තිබු රෝගය සඟවාලා
එදින ම මතු උනා අදිටන් කල ගෙවිලා

29. සමවත් බලෙන් නැවතත් මැඩලිය හැකි වේ
එනමුත් නැවත ඒ ලෙස නොම කළ යුතු වේ
බුදු සිරුරට ද රෝ දුක් පීඩා පොදු වේ
යන මේ පාඩම ද සවුවන් දත යුතු වේ



DampeTheroKaviBook_Content_20180804.indd 183 2018/8/4 8:46 AM

30. කුසිනාරා පුරට බුදුහිමි වඩින කල
වෙහෙසව මදක් වැඩ සිටියේ ගසක් මුල
දැඩි ලෙස පිපාසෙන් වේලී ගියෙ දෙතොල
අනඳ සමිඳු වැඩියා නදියට අසල

31. නදිය හරහ පන්සියයක් ගැල් ඇදලා
වෙළෙඳුන් ගියේ ගැල්වල බඩු පුරවාලා
එනිසා බොහෝ ලෙස ගං දිය බොර වීලා
අනඳ සමිඳු එයි පැන් නැතිව ම හැරිලා

32. තිබහට වතුර දැන් නම් මට ඕනෑම යි
වෙහෙසක් දැනෙහි මට නම් දැන් හරි තිබහයි
පැන් ගෙන එන්න කම් නැත එය බොර වූ වයි
නැවතත් අනඳ හිමි නදියට පය ඔසවයි

33. මේ ලෙස තුන්වරක් යලි හැරිලා එන්නේ
හිමි ගත වෙහෙස තිබහ ද තව වැඩි වෙන්නේ
සිවුවෙනි වතාවෙත් ගං ඉවුරට යන්නේ
එහි දී අමුතු සිදු වීමක් සිදු වෙන්නේ

34. දැතින් බඳුන ගෙන දැම්මා ජලය පිට
ගං දිය පෑදුනා හිමිගේ අනුහසට
පුරවා බඳුන පැන් දීලා බුදු හිමිට
වෙහෙස ද පවස නිවුවා අවසන් වරට

35. ආළාරගෙ සවුවෙක් හිමි වෙත එන්නේ
පුක්කුස නම් ය ඔහු රජ කුමරෙකු වෙන්නේ
දෙසු දම් අසා තිසරණයෙහි පිහිටන්නේ
රන්වන් අනගි පිළි යුගලක් පුද දෙන්නේ



DampeTheroKaviBook_Content_20180804.indd 184 2018/8/4 8:46 AM

36. බුදුහිමි එයින් සළුවක් පෙර වූ සේක
අද දින නිවන් පුරයට පිවිසෙන සේක
සිත නැගි සොම්නසින් ගත බබලයි නේක
සවනක් රැසින් බුදු බඳ දිලෙනා සේක

37. පාවා නුවර අතහැරලා වැඩමන්නේ
යළි නැහැ කෙදිනකවත් මේ නුවරට එන්නේ
හිරණ්‍යවතී ගඟ මග දී හමු වෙන්නේ
ඉන් ගොඩ වෙලා කුසිනාරවට වැඩමන්නේ

38. එහි ඇති අනගි සල් වනයක් වෙත වැඩියේ
මල්ල රජුන්ටයි එහි උරුමය වූ යේ
සල් ගස් දෙකක් අතරෙහි යහනක් සැදූයේ
සිහ රද සෙයින් හිමි එහි සැතපී සිටියේ

39. ටික ටික වෙසක් පුර හඳ අඹරේ දිලුනා
දෙව් බඹ පිරිස් අහසේ සිට මල් හෙලනා
බුදු හිමි අනඳ හිමියන් අමතා දෙසනා
ආමිස නොවෙයි පිළිවෙත් පිරුමයි වටිනා

40. සඳ ඇති නමුත් ගණඳුරු ඇති රැයක් වගෙයි
පිරිසක් සිටින මුත් හිස් වූ සොහොන වගෙයි
කලට පිපුණු මල් අකලට බිමට වැටෙයි
නෙ ඇසෙන ලෙසට පරිසරය ම අඬණු වගෙයි

41. මග පල ලැබූ උතුමෝ එහි වැඩ ඉන්න
නො හෙලත් සුසුම් අනියත දන්නා බැව්ණ
පුහුදුන් දනට නම් මෙය බැහැ ඉවසන්න
අනඳ තෙරුන් විය වෙසෙසින් වැළපෙන්න



DampeTheroKaviBook_Content_20180804.indd 185 2018/8/4 8:46 AM

42. හෙට හිරු නැගෙන මුත් ලොව අඳුරෙන් වැසුනේ
පියුම් පිපෙන මුත් නැහැ පැණ මල් පිපුනේ
බුදු හිමි ඇයි ද අද දින පිරිනි වෙන්නේ
කියමින් අනඳ හිමියන් වැලපෙනු ඇසුනේ

43. කාටද හෙට ඉදන් උණු පැන් සකසන්නේ
කාගේ දෙපා දෝ හෙට සිට දෝවන්නේ
කවරෙකු හට ද සේනාසන සකසන්නේ
කා වෙනුවෙන් ද මින් පසු උවටැන් දෙන්නේ

44. බුදු හිමි අනඳ හිමියන් කැදවා ගන්නේ
නො හඩනු සෝක නො කරනු ඔවදන් දෙන්නේ
සංඛත දහම් නැසෙනා බව දැන ගන්නේ
බුදු සිරුරට ද එය පොදු බව දැන ගන්නේ

45. පිය වූ සැවො ම අතහැර යා යුතු වෙන්නේ
නැතහොත් කැඩී බිඳිලා විසිරී යන්නේ
මා දෙසු දහම ඔබ මතකෙහි පවතින්නේ
මෙය ලෝ දහම බව ඇයි සිහි නොකරන්නේ

46. පෙර බව වලදි ඔබ බොහො පින් කළ කෙනෙක
තිදොරින් මිතුරු ලෙස මා ගැන බැලු කෙනෙක
නොපමා බවින් බොහො පිළිවෙත් පිරු කෙනෙක
කල් නොයවා ම නිවනෙහි රස විඳිය හැක

47. අනඳ සමිඳු බුදුහිමි වැඳ පවසනවා
කුසිනාරාවෙ පිරිනිවනය නොම වේවා
රජගහ සැවැත් බරණැස් නුවරෙක වේවා
උසස් රටක වැඩ පිරිනිවනය වේවා

48. හා! ආනන්ද ඔබ ඒ ලෙස නොකියන්න
සක්විති රජුන් මෙහි සිටි බව දැන ගන්න
කුඩා නමුත් වටිනා බව දැන ගන්න
නොසිතම් යළිත් වෙන නුවරක් වෙත යන්න

49. තිලෝ හිමි පිරිනිවන් පානා පුවත අසා
සුභද්‍ර ආවෙ දුරු කරනට සැක විමසා
බුදුහිමි වෙහෙස වෙයි කියලා හිතපු නිසා
අනඳ සමිඳු ඔහු හට ඉඩ නො දුන් නිසා

50. බුදු බව ලැබුවේ අන් අය නිසාවෙනී
දිවි ඇති තුරා එය ඉටු කළ යුතු බැවිණී
සවුවන් අතර ඔහු අන්තිම වන බැවිණී
කැඳවිය සුභද්‍රව කරුණා දයාවෙනී

51. සුභද්‍ර! දෙසමි දම් ඔබ හට අහගන්න
නිවනට තිබෙන මග මැනවින් දැන ගන්න
සතර පල ලැබූ සවුවන් වැඩ ඉන්න
සසුනක අරිය අට මග ඇත දැන ගන්න

52. සසුනක නොමැති නම් අරි අට මග දෙසලා
එහි නැත කිසිදු සවුවෙක් කෙලෙසුන් නසලා
එවැනි සසුන් හිස් බව නුවණින් දැකලා
මැද මාවතෙහි ගිය අය කෙළෙසුන් නසලා

53. සුභද්‍ර ඇසූ දහමට සිත යෙද වූවා
සසුනෙහි පැවිදි වී උපසපුව ද ලැබුවා
කමටහනට තමනගෙ සිත යෙද වූවා
කෙළෙසුන් නසා මොහොතින් දුක නැති කෙරුවා



DampeTheroKaviBook_Content_20180804.indd 187 2018/8/4 8:46 AM

54. බුදු හිමි නැවත සවුවන් හැම අමතන්නේ
මා මේ කියන දෙය මැනවින් අහගන්නේ
දහම ද විනය මා මැනවින් දෙසූ බැවිනේ
හෙට සිට ඔබට එය ගුරුවරයා වෙන්නේ

55. අවවාදයක් දෙමි අවසන අහගන්න
සංඛත සැවො ම නැසෙනා බව දැනගන්න
නොපමා බවින් සිහියෙන් නිරතුරු ඉන්න
සසරෙහි දුකෙන් ඉක්මන් කර ගොඩ යන්න

56. අවසන් වදන මේ ලෙස පැවසූ සේක
පවසා පළමු දැහැනට සමවන් සේක
දෙවන තෙවන දැහැනට සමවන් සේක
අනුපිළිවෙළින් සමවත් සමවන් සේක

57. නිරෝධ සමාපත් සමවැදි හුන් සේක
ඉන් යළි නැගිට ආපසු සමවන් සේක
සිවුවන දැහැන සමවැද ඉන් නැගි සේක
අනියත පතළ කරමින් පිරිනිවි සේක

58. පුන්සඳ මඬලෙ රැස්මාලා අඩුව ගියා
සුපිපි කුමුදු සඳ එළියෙ ම පරව ගියා
මුළු ලෝකය ම යළි අඳුරෙන් වැසී ගියා
තුන්ලොව එළිය කළ දීපය නිවී ගියා

59. රතට රතේ පිපුණු වෙසක් කැකුළු මැලවුණා
මී අඹමල් මෝරන්නට පෙර බිම වැටුණා
කලට පිපී වැටෙනා මල් අකලට වැටුණා
පිරිනිවනට වැඩි සඳ හිමි ලොවම මැලවුණා



DampeTheroKaviBook_Content_20180804.indd 188 2018/8/4 8:46 AM

60. හෙට හිරු නැගෙන මුත් ලොව අඳුරේ ගිලෙනා
පොළොව ම නිසරු වී මල් පල බිම වැටුණා
ලෝකය යළිත් මහ දුක් සයුරේ ගිලුණා
හෙට සිට ලොවේ බුදුරුව දකිනට නොවෙනා

61. හිමි නැති සොවින් මිහි තළය ම වැලපෙන්නේ
මිහි කත සොවින් දැඩි ලෙස කම්පා වෙන්නේ
අහස ද ගුගුරලා හයියෙන් වැලපෙන්නේ
අහසින් කඳුළු වරුසාවක් මතු වෙන්නේ

62. "ලොව ඇති උතුම් බුදු පදවිය ලබා ගෙන
සිටි මුනි තුමන් වැඩි ලෙස වෙත පිරිනිවන
සියලු ම සතුන් මරුවා විත් යයි රැගෙන"
මහබඹු මෙසේ දුටුවා මේ මොහොත ගැන

63. "අහෝ සියලු සංඛත දම් අනියත වේ
උපදින නැසෙන බව ඒවා හට පොදු වේ
උපදින නැසෙන බවමයි පොදු දහම ලොවේ
එබැවින් ඔවුන් සංසිඳුවීම ද සැප වේ"

64. සක් දෙව් මෙසේ පවසන විට එතැන සිට
අනුරුදු තෙරුන් පවසනවා මේ ලෙසට
"කම්පා නොවන සිත් ඇති ලෝ දම්වලට
බුදුහිමි නිවන් වැඩියේ පහනක් ලෙසට"

65. පුහුදුන් සැවො ම විය අඬමින් වැලපෙන්න
කඳුළු නොමැති නෙත් නම් නැත දැක ගන්න
ලොව හැම සදා කාලික නැති බව දන්න
උතුමෝ නොවෙති නෙත් කඳුලැලි වගුරන්න



DampeTheroKaviBook_Content_20180804.indd 189 2018/8/4 8:46 AM

66. උදයෙ ම අනඳ හිමි රජ මැදුරට වැඩියා
පිරිනිවි පුවත රජුහට සැලකර සිටියා
රැස්කර සැවොම සැම දෙය පවසා සිටියා
සතියක් බුදුන්ගේ සිරුරට පූජා කළොයා

67. සිනිඳු කසී සළු ගෙන පොරවා සිරුර
මනා සිනිඳු කපු පුළුනෙන් වෙළුම් කර
පන්සිය වරක් මෙලෙසට පොරවා සිරුර
රුවන් දෙනක තැන්පත් කර බුදු සිරුර

68. සුවඳ තෙලින් දෙන පුරවාලා සොඳට
නැවතත් රුවන් දෙනකින් වසවා තදට
සතර දෙනෙක් රජවරු නා දිය සොඳට
එක් විසි රියන් සෑයේ දෙන තැබු කලට

69. දැල් වූ නමුත් ගිනි චිතකය සතර දෙසේ
කසුප් තෙරුන් හට බුදු පා වඳින ලෙසේ
නො දැල් උනා ගිනි දෙවියන්ගේ අනුහසේ
කසුප් තෙරුන් වැඩියා පා වඳින ලෙසේ

70. පැදකුණු කළ සේක තෙවරක් බුදු සිරුර
සිරිපා වැන්දෙ තෙවරක් සිතිනේ අදර
එකෙනෙහි සෑය ගිනි දැල්වුණි එක් පැහැර
ගිනගෙන දැවුණි ලොව සැනසූ බුදු සිරුර

71. ලලාට දාතු අකු දා දළදා සතර
ගිනිගෙන දැවුන මුත් ගියෙ නැහැ නොව විසිර
සෙසු දා අබ සාල් මුං පමණට විසිර
ගිය සඳ දෙවියො ඉස්සේ එහි දිය දහර

72. හිමි පිරිනිවන් වැඩි දුක්බර පුවත අසා
දස දිග රජුන් පැමිණියෙ හිමි පුදනු නිසා
සියලු ම ධාතු කුසිනාරා නුවර නිසා
අයිතිය කියති සැම දෙන ධාතුන් උදෙසා

73. අවසන සියලු දෙන යුදයට සැරසෙන්නේ
මහ විපතක් ය දැන් සිදු වන්නට යන්නේ
ද්‍රෝණ බමුණු සැමගේ ගුරුවර වෙන්නේ
ගැටළුව විසඳලන්නට එහි පැමිණෙන්නේ

74. සමසේ ධාතු අට කොටසක් කරවන්නේ
රටවල් අටක් වෙත සමසේ බෙදවන්නේ
රුවන් බඳුන බමුණා අරගෙන යන්නේ
දාගැබ් තනා බුදු හිමි හට නමදින්නේ

75. සුද්ධෝදන රජුට දාව මාය කුසින් බිහි වු සේක
යසෝදරාගේ අතගෙන රාහුල පුතු ලැබූ සේක
ගිහිගෙය අතහැරලා ගොස් බුදු පදවිය ලැබූ සේක
දුකින් මිදෙන මග දෙසලා පිරිනිවනට වැඩිය සේක

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යයේ**
**පිරිනිවීම නම් වූ පහළොස්වන සර්ගය නිමි**

**දම්පේ විජිතරතන හිමියන් විසින් රචිත**
**ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදාන මහාකාව්‍යය නිමි**



DampeTheroKaviBook_Content_20180804.indd 191 2018/8/4 8:46 AM

DampeTheroKaviBook_Content_20180804.indd 192 2018/8/4 8:46 AM